2021 නොවැම්බර් මස 26 වන දින පෙරවරු 9.30 ට
මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදි පවත්වන
ලදී

මොරටුව මහා නගර සභාවේ විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව

සහභාගීත්වය:-

01. නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා

02. නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා

03. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා

04. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා

05. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා

06. මහා නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා

07. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසද හර්ෂණ අබේකෝන් මහතා

08. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා

09. මහා නගර සභා මන්ත්‍රී - යු.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා

10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ඩබ්.රන්දු නිරෝෂන මහතා

11. මහා නගර සභා මන්ත්‍රී - එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය

12. මහා නගර සභා මන්ත්‍රී - පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා

13. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා

14. මහා නගර සභා මන්ත්‍රී - පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා

15. මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය

16. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා

17. මහා නගර සභා මන්ත්‍රී - යූ.ලලිත් ප්‍රනාන්දු මහතා

18. මහා නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා

19. මහා නගර සභා මන්ත්‍රී - එෆ්.බී.නිලංක සිල්වා මහතා

20. මහා නගර සභා මන්ත්‍රී - එම්.කේ.පී.සුසන්ත පෙරේරා මහතා

21. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා

22. මහා නගර සභා මන්ත්‍රී - එම්.කුමාර රාජරත්න මහතා

23. මහා නගර සභා මන්ත්‍රී - එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා

24. මහා නගර සභා මන්ත්‍රී - එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා

25. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය

26. මහා නගර සභා මන්ත්‍රී - එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා

27. මහා නගර සභා මන්ත්‍රී - ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය

28. මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා

29. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා

30. මහා නගර සභා මන්ත්‍රී - එම්.සුනිල් නන්දසිරි මහතා

31. මහා නගර සභා මනත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා

32. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මැන්දිස් මහතා

33. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා

34. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා

35. මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනි මහත්මිය

36. මහා නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා

37. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා

38. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය

39. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය

40. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය

41. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය

42. මහා නගර සභා මන්ත්‍රී - ආර්.ක්‍රිශනි ප්‍රනාන්දු මහත්මිය

43. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා

44. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා

45. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

සහ

නාගරික ලේකම් (වැ.බ.) - එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩි.තාරක මුණසිංහ මහතා විසින් 2021.11.26 වන දින විශේෂ මහා සභා රැස්වීමේ කැඳවීම් නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි,අද දින න්‍යාය පත්‍රය 2021.10.15 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 17 යටතේ අනුමත වාර්තාව අනුව මොරටුව මහා නගර සභාවේ 2022 වර්ෂය සඳහා කෙටුම්පත් කරන ලද වැඩසටහන් අයවැය ලේඛනය අනුමත කිරීම ඉදිරිපත් කරන්නට ලැබෙන අවස්ථාවේදි පළමුම මා, නගරාධිපතිවරයකු ලෙස අඛණ්ඩව 14 වෙනි වසරටත්, ඉදිරිපත් කිරීමට ලැබීම මම හිතන්නේ ලංකාවේ පලාත් පාලන ආයතන ප්‍රධානියෙකු ලැබුවාවු සුවිශේෂී වෙන්නාවු වරප්‍රසාදයක් ලෙස මම විශ්වාස කරනවා.මා දන්නා තරමින් එවැනි වූ අවස්ථාවක් හිමිව තිබෙන්නෙත් මටම විතරයි

කියලයි මා විශ්වාස කරන්නේ. ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා, ගරු විපක්ෂ නායකතුමා ප්‍රධාන සියළුම ගරු මන්ත්‍රීවරුනි, අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමට පෙර සාම්ප්‍රදානුකූල ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම මෙය අවස්ථාවක් කර ගන්නවා.

<u>අයවැය කථාව හා ප්‍රතිපත්ති ප්‍රකාශනය - 2022</u>

ගරු ස්වාමීන්වහන්ස,

ගරු අන්‍යාගමික පූජකතුමනි,

ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමනි,

ගරු විපක්ෂ නායකතුමනි,
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි,
ගරු මහා නගර සභා මන්ත්‍රීවරියනි,
නාගරික කොමසාරිස්තුමා ඇතුළු
නිලධාරි මහත්ම මහත්මියනි,
මාධ්‍යවේදී මහත්ම මහත්මියනි,
ගෞරවනීය මොරටු පුරවැසියනි,

මොරටුව මහා නගර සභාව සඳහා 2022 වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය ලේඛනය හා ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා ඔබ සියලු දෙනාගේ ගෞරවනීය අවසරය ඉල්ලා සිටිමි.

ගෙවී යන 2021 වර්ෂය තුළ පළාත් පාලන ආයතනයක් ලෙස බල ප්‍රදේශයේ පුරවැසියන්ගේ සුබසාධනය උදෙසා අප ගත් ක්‍රියාමාර්ග පිළිබඳව කෙටියෙන් සඳහන් කරන අතර, එළඹෙන 2022 වර්ෂය සඳහා මෙම අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන සලසා ඇති අපගේ ඉදිරි ඉලක්ක හා සංවර්ධන සැලසුම් පිළිබඳව මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් කරුණු ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි.

2020 වර්ෂය තුළ පැන නැගුණු කොවිඩ් 19 වසංගත තත්ත්වය තවදුරටත් තීව්‍ර වෙමින් ලෝකයේම සාමාන්‍ය ජන ජීවිතය ඇතුළු සියලු ක්‍රියාකාරකම් තවදුරටත් අඩපණවීම හේතුවෙන් 2021 වර්ෂයේදී කොවිඩ් පාලන හා සුබසාධන කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට සිදුවිය.

කෙසේ වෙතත් කොවිඩ් අර්බුදයට මුහුණ දෙන අතරම පළාත් පාලන ආයතනයක් ලෙස අපගේ අනෙකුත් සුබසාධන හා සංවර්ධන වැඩසටහන් ද අඩාල නොවී පවත්වා ගැනීම සඳහා හැකි උපරිම ශක්තියෙන් කටයුතු කළ අතර, එහිලා 2021 වර්ෂය සුවිශේෂ ජයග්‍රහණ අත්පත් කරගත් වර්ෂයක් ලෙස හැඳින්වීමට කැමැත්තෙමි.

විශේෂයෙන්ම අපගේ දීර්ඝකාලීන ඉලක්කයක්ව පැවති සංවිධිත කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් සහා පරිශ්‍රය තුළ ආරම්භ කළ අතර ඒ තුළින් බල ප්‍රදේශය තුළ ජනනය වන නොදිරන කසළ වර්ගීකරණය කොට එක්රැස් කිරීම හා එම කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා යොමු කිරීම මෙම විශේෂ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය මඟින් මේ වනවිට සාර්ථකව ඉටුකරමින් පවතින බව සතුටින් සඳහන් කරමි.

බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මඟින් හඳුන්වාදෙන ලද ශූන්‍ය කසළ සංකල්පය (Zero Waste) ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම තුළින් 100% ක

සාර්ථකත්වයක් අත්කරගත් දිවයිනේ එකම පළාත් පාලන ආයතනය මෙන්ම, නොදිරන කසල වර්ග 37 කට පමණ වෙන්කර ප්‍රතිචක්‍රීකරණය

කිරීම සඳහා යොමු කරනු ලබන මෙරට එකම පළාත් පාලන ආයතනය බවට මොරටුව මහා නගර සභාව පත් කිරීමට ඉහත ව්‍යාපෘතිය මඟින් අපට අවස්ථාව ලැබුනු බවද සඳහන් කරමි.

එමෙන්ම, මෙතෙක් සභාවට විශාල පිරිවැයක්ව පැවති කසළ මේ වනවිට සභාවට ආදායම් ජනනය කරනු ලබන සම්පතක් බවට පත්කර ගැනීමට මෙම ව්‍යාපෘතිය මඟින් හැකි වී ඇති අතර, මේ වනවිට සාමාන්‍යයෙන් මාසිකව රුපියල් ලක්ෂ 07 – 10 අතර මුදලක් වර්ගීකරණය කරන ලද කසළ අලෙවි කිරීමෙන් උපයා ගැනීමට අප සභාවට හැකිව ඇති බවද සතුටින් සඳහන් කරමි.

ඉහත සඳහන් පරිදි, කසළ කළමනාකරණ කටයුතු සම්බන්ධව සුවිශාල ප්‍රගතියක් අත්කර ගන්නා අතරම, 2021 වර්ෂය තුළ නගරයේ මාර්ග, කාණු ඇතුළු පොදු යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් සඳහා ද අප විසින් කටයුතු කළ බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

ඒ අනුව, 2021 වර්ෂය තුළ සභා බල ප්‍රදේශය තුළ මාර්ග හා කාණු ඇතුළු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 182 ක් පමණ රුපියල් මිලියන 189 ක පමණ ප්‍රතිපාදන යොදවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බවත්, ඒ සඳහා මොරටුව මහා නගර සභා අරමුදල්, පළාත් සභා අරමුදල් සහ විමධ්‍යගත අරමුදල් මඟින් ප්‍රතිපාදන සපයා ගත් බව ද සඳහන් කරමි.

ඉහත ව්‍යාපෘතින්ට අතිරේකව 2021 වර්ෂය තුළ රජය මඟින් ක්‍රියාත්මක මාර්ග කාපට් කිරීමේ ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 180ක පමණ වියදමින් මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ මාර්ග කිලෝමීටර් 18 ක් පමණ කාපට් අතුරා සංවර්ධනය කිරීමට කටයුතු කළ බවද සඳහන් කරමි.

ඒ යටතේ මහා නගර සභා බල ප්‍රදේශයේ සියලු නාගරික කොට්ඨාස ආවරණය වන පරිදි මාර්ග, කාණු හා පොදු සේවා ගොඩනැඟිලි ඇතුළු අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට හා පුරවැසි ජනතාවට වඩාත් උසස් ජීවන තත්ත්වයක් ලබා දීමට පසුගිය වසර තුළදීත් කටයුතු කළ බව සඳහන් කරමි.

මා පෙර සඳහන් කල පරිදි ඉහත කී සියලු සංවර්ධන කාර්යයන් සිදු කරන අතරම 2021 වර්ෂය තුල අපගේ ප්‍රධානතම කාර්ය භාරය වූයේ කොවිඩ් 19 ව්‍යසන තත්ත්වයෙන් පීඩාවට පත් වූ පුරවැසියන් සඳහා සුඛසාධන හා සහන සේවා සැපයීම සඳහා කටයුතු කිරීම බව ඔබ සියලු දෙනා දන්නා කරුණකි.

ඒ අනුව, කොවිඩ් රෝගය හේතුවෙන් මරණයට පත් වූ පුරවැසියන්ගේ අවසාන කටයුතු සභාවේ අරමුදල් යොදවා සිදු කිරීමේ අවමංගල්‍ය ආධාර ක්‍රමයක් සභාවේ අනුමැතිය යටතේ 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ අතර, ඒ යටතේ මෘතදේහ 196 ක පමණ අවසන් කටයුතු සභාව මඟින් ඉටු කළ බව දන්වමි.

තවද, 2021 මැයි සිට 2021 නොවැම්බර් දක්වා කොවිඩ් රෝගය හේතුවෙන් මරණයට පත් වූ සභා බල ප්‍රදේශයේ පුරවැසියන් 269 කගේ හා රජයේ රෝහල් මඟින් මෙම සභාවේ ආදාහනාගාර වෙත යොමු කරන ලද කොවිඩ් රෝගය හේතුවෙන් මරණයට පත් වූ සභා බල ප්‍රදේශයෙන් පිට පදිංචිව සිටි පුද්ගලයන් 65 කගේ මෘතදේහ වලට අදාළ ආදාහනාගාර සේවාවන් සභාව විසින් මුළුමනින්ම නොමිලේ ඉටු කරන ලදි.

ඒ අනුව, ඉහත කී මරණාධාර ක්‍රමය හා ආදාහනාගාර සේවා නොමිලේ සැපයීම සඳහා 2021 වර්ෂය තුළ රුපියල් මිලියන 3.1 ක පමණ පිරිවැයක් සභාව මඟින් දරන ලද බවද සඳහන් කරමි

තවද, 2021 වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ලද කොවිඩ් එන්නත්කරණ වැඩසටහන් සඳහා ගොඩනැඟිලි පහසුකම් ඇතුළු සියලු යටිතල පහසුකම් සපයා දීමට සභාව මඟින් කටයුතු කරන ලදී.

එමෙන්ම, කොවිඩ් රෝගය හේතුවෙන් පීඩාවට පත්ව සිටි පුරවැසියන් සඳහා සහන සැලසීමට පැය 24 පුරා ක්‍රියාත්මක හදිසි ඇමතුම් මධ්‍යස්ථානයක් මහා නගර සභා කාර්යාල පරිශ්‍රය තුළ ස්ථාපිත කළ අතර, ආසාධිත රෝගීන් රෝහල් ගත කිරීම හා පීසිආර් හා ක්ෂණික ප්‍රතිදේහ පරීක්ෂණ සඳහා පුරවැසියන් කඩිනමින් යොමු කිරීම සඳහා සභාව මඟින් ගාස්තු රහිත පැය 24 පුරා ක්‍රියාත්මක ප්‍රවාහන සේවාවක්ද ආරම්භ කරන ලදී.

එසේම, කොවිඩ් රෝගයට ගොදුරු වූ සභා සේවකයන් සඳහා සභා කාර්යාල පරිශ්‍රය ආශ්‍රිතව රැඳවුම් මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට කටයුතු කළ අතර ඒ තුළින් කාර්ය මණ්ඩලය අතර හා ආසාධිත සේවකයන්ගේ පවුල්වල සාමාජිකයන් රෝගයට නිරාවරණය වීමෙන් ආරක්ෂා කර ගැනීමටත් කොවිඩ් 19 වසංගත තත්ත්වය යටතේ සභාවේ කටයුතු බාධාවකින් තොරව පවත්වා ගැනීමටත් හැකි වූ බව සඳහන් කරමි.

තවද, කොවිඩ් 19 රෝගී තත්ත්වය පාලනය කිරීම සඳහා එන්නත්කරණ මධ්‍යස්ථාන පාසල් ඇතුළු නගරයේ පොදු ස්ථාන විෂබීජහරණය කිරීම අඛණ්ඩව සිදුකළ අතර, ඒ තුළින් රෝග ව්‍යාප්තිය අවම කර ගැනීමට හැකි වූ බවද සඳහන් කරමි.

ඒ අනුව, සමස්ථයක් ලෙස 2021 වර්ෂය තුළ කොවිඩ් මර්දන හා ඊට අදාළ සුබසාධන කටයුතු සඳහා රුපියල් මිලියන 05ක පමණ පිරිවැයක් සභාව මඟින් දරණ ලද බව සඳහන් කරමි.

2021 වර්ෂය තුළ පැවති කොවිඩ් රෝග ව්‍යාප්තිය මධ්‍යයේ වුවද සභා කටයුතු අඩාල නොවී පවත්වා ගන්නා අතරම, සභාවේ සුබසාධන හා සංවර්ධන කාර්යයන් හැකි උපරිම ධාරිතාවයකින් පවත්වා ගෙන යාමට හැකිවීම පිළිබඳව සතුටට පත්වන අතර, එළඹෙන 2022 වර්ෂයේ දී කොවිඩ් රෝගය හේතුවෙන් පැන නැඟුණු අර්බුදකාරී වාතාවරණය සමනය වේ යැයි අපේක්ෂා කරමි.

මා විසින් අද දින ඉදිරිපත් කරනු ලබන අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන සලසා ඇති හා 2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන් කිහිපයක් පිළිබඳව ඔබගේ අවධානය යොමු කරවීමට කැමැත්තෙමි.

මා මුලින් සඳහන් කළ පරිදි කසළ කළමනාකරණ ක්ෂේත්‍රයෙහි ලා අප විසින් මේ වනවිට ලබාගෙන ඇති ජයග්‍රහණ තවදුරටත් ඉදිරියට ගෙන යෑමට 2022 වර්ෂයේ දී අපේක්ෂා කරන අතර, ඒ යටතේ දැනට කරදියාන කසළ අංගනය වෙත බැහැර කරනු ලබන කාබනික අපද්‍රව්‍ය ආශ්‍රිතව කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම අපගේ පළමු ප්‍රමුඛතාවය බව සඳහන් කරමි. 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ නමුත්, රට තුල මතුවී ඇති වර්තමාන තත්ත්වය යටතේ ණයවර ලිපි විවෘත කිරීම පිළිබඳ ගැටළු හා අනෙකුත් ප්‍රායෝගික දුෂ්කරතා හේතුවෙන් ප්‍රමාද වූ මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගන්නා බවත් වැඩිදුරටත් සඳහන් කරමි.

තවද, දැනට ආරම්භ කර ඇති ඝන අපද්‍රව්‍ය විශේෂ ව්‍යාපෘතිය නිරීක්ෂණය කිරීම සඳහා 2021.11.16 දින මෙම සභාව වෙත පැමිණි බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරවර මාර්ෂල් ඔෆ් ද එයාර් ෆෝස් රොෂාන් ගුණතිලක මැතිතුමා විසින් ව්‍යාපෘතියේ සාර්ථකත්වය පිළිබඳ අගය කළ අතර, ව්‍යාපෘතිය තවදුරටත් කාර්යක්ෂම කිරීම සඳහා බස්නාහිර පළාත් සභාවේ ප්‍රතිපාදන වලින් සම්පීඩන කසළකුට්ටි සකස් කිරීම

සඳහා තවත් බෙලින් යන්ත්‍ර 03 ක් ලබාදීමට අනුමැතිය ලබාදීම අප ලද තවත් ජයග්‍රහණයක් බව සඳහන් කරමි.

එසේම, මේ වනවිට නිසි පිළියමක් නොමැති වීදුරු, බිම අතුරන ටයිල්, පිඟන් භාණ්ඩ හා ගොඩනැඟිලි සුන්බුන් වළට අදාළ කසල ඇඹරීම සඳහා ඇඹරුම් යන්ත්‍රයක් (Crusher Machine) ස්ථාපිත කිරීමට හා එම ඇඹරුම් ද්‍රව්‍ය ආශ්‍රිතව බ්ලොක් ගල් හෝ

වෙනත් ගොඩනැගිලි හෝ මාර්ග ඉදිකිරීමේ අමුද්‍රව්‍ය නිපදවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමටත් 2022 වර්ෂය තුළ කටයුතු කරන බවද සඳහන් කරමි.

පවත්නා කොවිඩ් 19 වසංගත තත්ත්වය හා ඉදිරියේ දී මුහුණපෑමට සිදුවිය හැකි වෙනත් සෞඛ්‍ය ගැටළු වඩා පහසුවෙන් කළමනාකරණය කිරීම සඳහා නගර සීමාව තුළ පිහිටි භාවිතයට නොගන්නා ගොඩනැඟිල්ලක් රජය මඟින් අත්පත් කරගැනීමට හා ඒ ආශ්‍රිතව නිරෝධායන හා සාත්තු සේවා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමටත් සැලසුම් කර ඇති බව සඳහන් කරමි.

එසේම, මොරටුව මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස අනුමත කාර්යය මණ්ඩලයේ ඇතුළත් වෛද්‍ය නිලධාරි තනතුර සඳහා වෛද්‍ය නිලධාරියෙකු අනුයුක්ත කර ගැනීමට හා ඒ තුළින් පොදු සෞඛ්‍ය සේවා ලබා ගැනීමේදී පුරවැසි ජනතාව මුහුණ පා ඇති දුෂ්කරතා අවම කර ගැනීමට පියවර ගැනීම 2022 වර්ෂයේ අපගේ තවත් ප්‍රමුඛ අරමුණක් බව සඳහන් කරමි.

තවද, සභාවේ සංවර්ධන කාර්යන්ට අදාළ විශේෂඥ තාක්ෂණික උපදෙස් සැපයීම සඳහා වරලත් සිවිල් ඉංජිනේරු නිලධාරියෙකුගේ සේවය අත්‍යවශ්‍යව ඇති බැවින්, ඒ සඳහා සුදුසු නිලධාරියෙකු කාර්ය මණ්ඩලයට ඇතුළත් කර බඳවා ගැනීමට 2022 වර්ෂය තුළ කටයුතු කරන බවද සඳහන් කරමි.

එමෙන්ම, සභාවේ කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා වරිපනම් බදු මාර්ගගතව ගෙවීම් පහසුකම් ලබාදීමට 2021 වර්ෂය තුළ කටයුතු කළ අතර, එම කටයුතු තවදුරටත් ඉදිරියට ගෙන යමින් 2022 වර්ෂය තුළ සභාවේ අනෙකුත් පොදු සේවාවන් ද මාර්ගගතව ලබාගැනීමේ පහසුකම් සලසා දීමටත් ප්‍රධාන කාර්යාල පරිශ්‍රය ආශ්‍රිතව නොමිලේ රැහැන් රහිත අන්තර්ජාල සේවාවක් (Free WiFi) ආරම්භ කිරීමටත් කටයුතු කරන බව ද සඳහන් කරමි.

අනපේක්ෂිත පරිදි උග්‍ර තත්ත්වයට පත් වූ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වූ අනෙකුත් නගර සංවර්ධන ව්‍යාපෘති ද 2022 වර්ෂය තුළ ආරම්භ කර එම ව්‍යාපෘතිවල ප්‍රතිලාභ කඩිනමින් ජනතාව වෙත ලබාදීමට පියවර ගන්නා බව ද සඳහන් කරමි.

ඉහත ව්‍යාපෘති හා 2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන ව්‍යාපෘති සඳහා මෙම අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන සලසා ඇති බැවින්, ඒ සම්බන්ධව දීර්ඝව කරුණු ඉදිරිපත් කිරීමට අපේක්ෂා නොකරන අතර, 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන වැඩසටහන් සඳහා අයවැය ලේඛනය මඟින් පුනරාවර්තන

හා ප්‍රාග්ධන ක්ෂේත්‍ර වලට අදාළ ආදායම් හා වියදම් ඇස්තමේන්තු පහතින් සඳහන් කරමි.

01. 2022 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම

පුනරාවර්තන ආදායම	රු. 1,049,404,960.00
ප්‍රාග්ධන ආදායම	රු. 2,354,001,600.00
මුළු ආදායම	රු. 3,403,406,560.00

02. 2022 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත වියදම

පුනරාවර්තන වියදම	රු. 983,985,460.00
ප්‍රාග්ධන වියදම	රු. 2,419,395,100.00
මුළු වියදම	රු. 3,403,380,560.00

ඒ අනුව, 2022 වර්ෂය තුළ සංවර්ධන හා සුබසාධන කටයුතු තවදුරටත් පුළුල්ව ක්‍රියාත්මක කිරීමට අප දරණ උත්සහයට ඔබ සියලු දෙනාගේ සහයෝගය අපේක්ෂා කරන අතර, පවත්නා වසංගත තත්ත්වය යටතේ ආදායම් හා වියදම් ඇස්තමේන්තුවල සිදුවිය හැකි වෙනස්වීම් පිළිබඳව ඔබ සියලු දෙනා අවබෝධ කරගනු ඇතැයි අපේක්ෂා කරමි.

අවසන් වශයෙන් මොරටුව මහා නගර සභාවේ සංවර්ධන කාර්යයන් සඳහා අපට උපදෙස් හා මඟපෙන්වීම ලබාදෙන අති පූජනීය මහා සංඝරත්නය, ගරු පූජක ප්‍රසාදීන් වහන්සේලා ඇතුළු සියලු ආගමික නායකයන් වෙත මාගේ වන්දනීය උපහාර පුද කරමි.

තවද, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා, ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා ඇතුළු වත්මන් රජයේ සියලු මැති ඇමතිවරුන් වෙත මාගේ ස්තූතිය පිරිනමමි.

එමෙන්ම, බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා ඇතුළු පළාත් සභාවේ සියලු නිලධාරීන් වෙතද මාගේ ස්තූතිය පිරිනැමීමට මෙම අවස්ථාව උපයෝගී කර ගනිමි.

එසේම, සභාවේ කටයුතු සාර්ථකව පවත්වාගෙන යෑමට මා හට සහාය ලබා දෙන නියෝජ්‍ය නගරාධිපතිතුමා ඇතුළු ආණ්ඩු පක්ෂ මන්ත්‍රී කණ්ඩායමට ද, විපක්ෂ නායක රවිනාත් ජේ ගුණසේකර මැතිතුමා, සුජීත් පුෂ්පකුමාර, නිශාන්ත ප්‍රදීනාන්දු, මැක්සි ජේ. ප්‍රනාන්දු මැතිතුමන්ලා ඇතුළු සියලු මහා නගර සභා මන්ත්‍රීතුමන්ලාට හා මන්ත්‍රීතුමියන්ලාට මාගේ විශේෂ ස්තූතිය පිරිනමමි.

සභාවේ සංවර්ධන හා පරිපාලන කටයුතු සඳහා මා වෙත සහාය වන නාගරික කොමසාරිස්තුමා ඇතුළු සියලු දෙපාර්තමේන්තු හා අංශ ප්‍රධානීන්ටත් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තූතිය පිරිනමමි.

තවද, මහා නගර සභාවේ කාර්යයන් පිළිබඳව පුරවැසි ජනතාව දැනුවත් කිරීමට අපට සහාය ලබාදෙන සියලු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වල මාධ්‍යවේදී මහත්ම මහත්මීන්ටද මාගේ ස්තූතිය පිරිනමමි.

එසේම, සියලු සංවර්ධන කාර්යයන් සඳහා අපට සහාය ලබාදෙන හා පිරිසිදු නගරයක් ගොඩනැගීම සඳහා අප සමග අත්වැල් බැඳ කටයුතු කරන ආදරණීය මොරටුව පුරවැසි ජනතාවටද ස්තූතිය පිරිනමමි.

අවසන් වශයෙන් එළඹෙන නත්තල, ලබන්නා වූ 2022 නව වසර සාමය සතුට පිරි නත්තලක් හා සුබ නව වසරක් වේවා යැයි ප්‍රාර්ථනා කරමි.

ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව.

2021 නොවැම්බර් 26 වන දින
මොරටුව මහා නගර සභා කාර්යාලයේදීය.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, විශේෂයෙන්ම 14 වර්ෂයක් අඛණ්ඩව පවත්වන අයවැය රැස්වීමේ පලමුවෙන්ම පලමු කතාව ඔසඳ හර්ෂණ අබේකෝන් ගරු මන්ත්‍රීතුමා විසින් සිදුකලා. එයත් මම හිතන්නේ සුවිශේෂී අවස්ථාවක්. එබැවින් මම ගෞරවයෙන් ආරාධනා කරනවා ඔසඳ මන්ත්‍රීතුමාට පලමුව සභාවේ 2022 අයවැය වෙනුවෙන් කථා කිරීම සඳහා අවස්ථාව ලබා දෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ධම්මෝ හවේ රක්ඛති - ධම්මචාරි -
ධර්මයේ හැසිරෙන්නා ධර්මය විසින්ම ආරක්ෂා කරනවා.

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ 14 වන අයවැය කෙටුම්පත මේ අවස්ථාවේදි ඔබතුමා එලිදැක්වුවා. වසර 14 ක් පුරාවට අඛණ්ඩව නගරාධිපතිධුරයේ ඉදිමින් අයවැය 14 ක් ඉදිරිපත් කිරීමට ලැබීම ඔබතුමා ලද මහත් භාග්‍යක් ලෙස සලකනවා. ඒවගේම ඒ අයවැය 14 දිම මුලාරම්භ කථාව මා හට පැවැත්විමට ලබාදීම සම්බන්ධව මම ගරු ඔබතුමාට ස්තුතිවන්ත වන අතර එය මා ලද භාග්‍යක් කොට සලකනවා. ගරු

නගරාධිපතිතුමනි, එක් එක් අවස්ථාවල අයවැය ඉදිරිපත් කිරීමේදි එක් එක් පිරිස් විසින් ඔබතුමාගේ අයවැයට එරෙහිව බොහෝ දේ කරන්න ලැබුවත් 2022 අයවැය කෙටුම්පත ඉදිරිපත් කිරීමේදි අපිට කිසිදු ගැටලුවකින් තොරව අපිට මේ අයවැය ඉදිරිපත් කරලා ජයග්‍රහනය කිරීමෙන් අපිට ඉදිරියට යන්න පුලුවන් වෙනවා. ඔබතුමා ප්‍රකාශ කලා බ්‍රෙලින් ක්‍රමය අපි ක්‍රියාත්මක කරලා තියෙනවා. මම හිතන්නේ ශ්‍රී ලංකාව තුල ගත්තම බ්‍රෙලින් ක්‍රමය ආරම්භ කරපු මහ නගර සභාවයක් බවට මොරටුව පත්වෙනවා. ඒ සම්බන්ධයෙන් සෞඛ්‍ය කමිටුවේ සභාපති වශයෙන් මේ වසරේදි මෙය ආරම්භ කිරීම සම්බන්ධව මම සතුටට පත්වෙනවා. ඒවගේම ගරු නගරාධිපතිතුමනි ඒ බ්‍රෙලින් ක්‍රමය නිසා නිවෙස් වල සිටින පිරිස් කුණු වර්ගීකරණයට ලක්කරලා ලබාදෙනවා ඒවගේම අපිට දැන් ගරු ආණ්ඩුකාර මාර්ෂල් ඔෆ් ද එයාර් ෆෝර්ස් රොෂාන් ගුණතිලක මැතිතුමා තවත් බ්‍රෙලින් යන්ත්‍ර 3 ක් අපිට ලබාදෙන්න පොරොන්දු වුනා. ඒ පොරොන්දු විම මත අපි හිතනවා මෙය අඛණ්ඩව සාර්ථකව ඉස්සරහට කරගෙන යන්න පුලුවන් වෙයි කියලා. ඒවගේම තමයි ගරු නගරාධිපතිතුමනි, දිගින් දිගටම කොවිඩ් මරණ සිදු වෙද්දි මොරටුව මහ නගර සභාව තීන්දුවක් ගත්තා මේ සියලුම කොවිඩ් මරණ වලට අපි මුදලක් අය නොකොට අපි ඒ මරණ ආදාහනය කරනවා කියලා. මොරටුවේ විතරක් නොවෙයි ලංකාවේ ඕනෑම ප්‍රදේශයකින් කොවිඩ් මරණයක් අවොත් නගරාධිපතිතුමා බෑ නොකියා ආදාහනය කරන ගත්ත ඒ තුලින් අපිට ලොකු පිනක් සිදුවෙනවා. මොකද ඒ වෙලාවේ අසරණ වෙලා සිටින කොවිඩ් මරණ සිදුවූ පවුල් සඳහා මහත් රුකුලක් වුනා ඒ මරණ ආදාහනයට සැලැස්වීම. ඒවගේම ගරු නගරාධිපතිතුමනි, මාර්ග ප්‍රතිසංස්කරණය ගැන කථා කරද්දි මගේ ගමේ බලනකොට දැන් සියලුම මාර්ග ප්‍රතිසංස්කරණය කරලා හමාරයි. මොරටුව ගත්තම 80% කට වැඩි ප්‍රමාණයක් අපි ප්‍රතිසංස්කරණය කරලා තියෙනවා ඒවගේම කාණු පද්ධති සකස් කරලා තියෙනවා. ඒවගේම සංවර්ධනයේ නියමුවා බවට පත් වෙලා තියෙනවා. ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා නොබෝ දිනකින් මම හිතන්නේ මෙරින් ඩ්‍රයිව් එකත් ලබාදෙයි පානදුර දක්වා ගමන් කිරීම සඳහා. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, පුරුවේ සරදමට වගේ ඔබතුමා මැයි මාසයේ සිරගතවීමකට ලක්වුනා MOH වෛද්‍යවරුන්ගේ ක්‍රියා කලාපය නිසා. ඔබතුමා හුදෙක්ම මොරටුවේ ජනතාවට සේවය කරන්න ගිහිල්ලා ජනතාව වෙනුවෙන් පෙනි සිටින්න ගිහිල්ලා තමයි සිරගතවීමට ලක් වුනේ. එදා කථාබහට ලක්වුන සමන්ලාල් මෙහෙම කරන්න ගියා කියපු මිනිස්සු දැන් කියනවා සමන්ලාල් නගරාධිපති කරන්න ගියේ හොඳ දෙයක් කියලා. ගරු ජනාධිපතිතුමත් ඒ ඒ රැස්වීම් වලදි කිව්වා සමන්ලාල් කලේ හරි දෙයක් ඒ විදියට අපි ලංකාවෙම කරමු කියලා. ඒක නිසා මම හිතනවා අපිට මේ ප්‍රශ්නය ඔබතුමා ඉන්න අවසාන අයවැය මේක තමයි කියලා. අපිට අඩුපාඩුවක් වෙලා තියෙනවා වෛද්‍ය වරයෙක්. නගර සභාවේ

කාඩර් එකේ අනිවාරයයෙන් වෛද්‍ය වරයෙක් ඉන්නවා අපි බඳවා ගමු ගරු නගරාධිපතිතුමනි අපට එතකොට ඒවගේ ප්‍රශ්න නැහැ.ඊයේ ඩෙංගු රැස්වීමේදි MOH

කාර්යාල දෙකෙන් ම අපිට විස්තර එන්නේ නැහැ ඩෙංගු රෝගිය සම්බන්ධව. ඒක නිසා අපි වෛද්‍ය වරයෙක් ඉක්මනින්ම බදවා ගන්න තියෙන ඉල්ලීම ඉදිරිපත් කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2022 අයවැය මගේ 9 වෙනි අයවැය කථාව බවට පත්වෙනවා. මා විපක්ෂයේ නාගරික මන්ත්‍රීවරයෙක් හැටියට මේ කථා කරන්නේ අපේ මොරටුව නගරයේ මොරටුව නගරයේ බදු ගෙවන ජනතාව වෙනුවෙන් 2022 ට ලබාදෙන්නාවූ සංවර්ධනය සහ සියලුම කොටස එකතු කරලා යන්නාවූ මේ අයවැය. මම සඳහන් කරන්න ඕන මේ අයවැය වැඩසටහන් 7 කට සීමා කරලා තියෙනවා. ඒ එක එක ගත්තොත් පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩලය සේවාව, 2 සේවා හා බදු, 3 සෞඛ්‍ය සේවා, 4 භෞතික සැලසුම්, 6 මහජන උපයෝගිතා සේවය, 7 සුභසාධන සේවා, 8 කුණු කසල සහ මෙහෙයුම් ව්‍යාපෘති මේවා තමයි අයවැය තුල මේ 2022 වැඩ සටහන කොටස් වලට බෙදලා තියෙනවා. ගරු නගරාධිපතිතුමනි පිටුව 8 ගත්තොත් මොරටුව මහ නගර සභාවෙ පුනරාවර්ථන වැඩ සටහයන් ආදායම් තුල වැඩ සටහන් විස්තරය 8 කට පෙල ගැහිලා තියෙනවා. නමුත් ඒ අංක 8 කට සඳහන් වෙලා තියෙනවා. නමුත් 7 යි තියෙන්නේ 2022 අයවැයට අපිට වැඩ සටහන් විදියට නම් කරලා තියෙන්නේ. මේක පටන් ගන්නකොටම මේ අයවැය විහිලුවක් බවට පත්වෙලා තියෙනවා.දිගටම දෝෂ වලට ලක් වෙලා තියෙනවා. මේකෙන් අපිට පෙන්නුම් කරන්නේ මොරටුව මහ නගර සභාවේ අයවැය තුල ජනතාවට වෙන්නාවූ වැඩ සටහනුත් මේ වගේ වෙන්න පුලුවන්. ගරු නගරාධිපතිතුමා එකක් නොවෙයි. මෙතන 5 වෙනි වැඩසටහනක් නැහැ. නැවත 6 තියෙනවා.අපි දකින විදියට මේ2022 අයවැය ක්‍රියාත්මක නොවන එකක් කියලා තමයි විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මට කියන්න වෙන්නේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒ සම්බන්ධව තව දුරටත් කථා කරගෙන යද්දි නිවැරදි කිරීමක් කරන්න හදන්නේ පලාත් සභාව විසින් අයවැය සකස් කිරීම සඳහා අප වෙත ලබාදෙන වැඩ සටහන් පිලිබඳව ලේඛණයක් ලබා දෙනවා. ඒ ලේඛණයේ අංක 5 විදියට සඳහන් කරලා තියෙන්නේ ජලය. එය ලංකාවේම පවත්වාගෙන යන්නේ කොළඹ මහ නගර සභාවත් මහනුවර මහ නගර සභාවත් විතරයි. එතකොට 5 කියන අංකය අපිට එවලා තියෙන වැඩ සටහන් ලේඛණයට 5 කියන එක අපිට අදාල නොවන නිසා අංක 5 කියන එක අපි අයින් කරලා තියෙනවා. අපට එවලා තියෙන නිර්නායකයන් එක්ක තමයි බජට් එක හදන්න වෙන්නේ.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ වැරද්ද හදාගෙන යමු. අපිත් කැමතියි ජනතාවට උදව් කරන්න. සෞඛ්‍ය සේවා ගත්තොත් මේ කාලයේ මදුරු නාශක තෙල් වලට රුපියලක් වත් 2022 ට වෙන් කරලා නැහැ.අපි මේ කාලය වෙනකොට සෞඛ්‍ය සම්බන්ධව විශේෂ සැලකිල්ලක් ගන්න ඕන. ඩෙංගු මදුරුවෝ විතරක් නොවෙයි මොරටු සීමාව තුල විශාල මදුරු විශේෂයක් ඉන්නවා. අපේ කාණු පද්ධති තුල මදුරුවෝ පිරිලා.මේ රෝග අපි හිතන්නේ නැති විදියට ව්‍යාප්ත වෙලා යන්න පුලුවන්. ඒවගේම සෞඛ්‍ය සේවයේ අධ්‍යාපන වැඩ සටහන් වලට වෙන් කරපු මුදල සුලු ප්‍රමාණයක් වෙලා තියෙනවා. මොරටු නගරය තුල නිවාස සංකීර්ණ තියෙනවා, අධ්‍යාපනය අඩු සෞඛ්‍ය පිලිබඳ දැනුවත් භාවයෙන් අඩු පිරිස් මොරටුවේ ජීවත් වෙනවා. අපේ නගර සභාවේ මෙවැනි පුද්ගලයින්ව දැනුවත් කරන්න සෞඛ්‍ය අධ්‍යාපනය වෙනුවෙන් මුදලක් අවශ්‍ය වෙනවා ගරු නගරාධිපතිතුමනි. මෙතන 2022 මොරටුව නගර සභාවේ සභික සංඛ්‍යාව 48 ක් ඉන්නවා කොට්ඨාශ 29 ක් , ග්‍රාම නිලධාරි කොට්ඨාශ 42 ක් තියෙනවා. පදිංචි පවුල් සංඛ්‍යාව 42402 ක්

තියෙනවා. ජන සංඛ්‍යාව 177741 ක්. මේ ජන සංඛ්‍යාවෙන් අපි විදුලියට, මොරටුව නගරයේ පරිසරයට, පෙරපාසැල්, කැලි කසල ව්‍යාපෘතියට, කාණු පද්ධති, වසංගත රෝග වලට මේ අයවැය තුලින් මම දන්න විදියට මුදල් වෙන් කිරීම ප්‍රමාණවත් නැහැ. එම නිසා ගරු නගරාධිපතිතුමනි මේක අපි කියන්නේ හොඳ අයවැයක් විය යුතුයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.කුමාර රාජරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2022 අයවැය කථාවට එක්වීම සම්බන්ධයෙන් කොරලවැල්ල බටහිර මාගේ මැතිවරණ බල ප්‍රදේශයේ ගරු ජනතාවට ඒවගේම මාගේ ස්තුතිය මේ අවස්ථාවේදි පුදකර සිටිනවා. විශේෂයෙන්ම ගරු නගරාධිපතිතුමනි රටේ වගේම ආර්ථික තත්වයකට තමයි මොරටුවටත් මුණ දෙන්නට සිද්ධ වුනේ. අපි ගොඩක් බලාපොරොත්තු තියාගෙන 2021 ආරම්භ කරාට ඒ වර්ෂය අවසන් කරන්නට මත්තෙන් අපි නොසිතූ නොපැතූ මොහොතක කොවිඩ් වසංගත තත්වයට අපිට මුහුණ දෙන්නට සිද්ධ වුනා. නමුත් එය ගෝලීය වසංගතයක් බැවින් රටේ ආර්ථිකයත් අපේ ආර්ථිකයත් අපි සියලු දෙනාගේ ආර්ථිකයට ඒ හරහා විශාල බලපෑමක් එල්ල වුනා. නමුත් ඒ සියලු බලපෑම් වලට මුහුණ දෙමින් අපි ඉදිරියට යා යුතුව තිබෙනවා. විශේෂයෙන්ම අපිට පසුගිය වසරේ ලගාකර ගත නොහැකි වූ ඉලක්ක වලට ලභා වන්නට 2022 වර්ෂය තුල ඔබතුමා කටයුතු කරමින් තිබෙනවා. ඒ අතර ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් මෙවන් වූ වසංගත තත්වයක් නැවත ඇති වුවහොත් ඒ සඳහා අපි සුදානම් වන්නේ කෙසේද යන්න පිලිබඳව ඔබතුමාගේ අවදානයට යොමු කරලා තිබෙනවා. අනිත් පැත්තෙන් විශේෂයෙන්ම මේ පාලන තන්ත්‍රය සිදුකරන නගරය හැටියට ඔබතුමාගේ නායකත්වයෙන් යුතුව එදා කැලි කසල

කලමනාකරණයේදි ප්‍රමුඛතම සංධිස්ථානයක් පසු කරන්නට මොරටුව මහ නගර සභාවට පුලුවන් කම ලැබුනා. මේ වෙනකොට ගරු නගරාධිපතිතුමනි එය තවත් තිව්‍රර කරමින්, තවත් කළමනාකරණය කරමින් අවශ්‍ය සියලු කටයුතු ඔබතුමා විසින් 2022 වර්ෂය සඳහා යෝජනා කර තියෙනවා. ඒ සඳහා අපි සියලු දෙනාගේ සහයෝගය මේ අවස්ථාවේදි ඔබතුමාට ලැබෙනවයි කියන එක මේ අවස්ථාවේදි සඳහන් කරන්නට කැමතියි. විශේෂයෙන්ම නගරාධිපතිතුමනි, කොම්පොස්ට් පොහොර නිර්මාණය කිරීම එතුලින් නව ආදායම් මාර්ගයක් ඇති කිරීම නව සේවකයන්ට අවස්ථාව ලබාදීම ආදිය මේ අවස්ථාවේදි අපිට කරන්නට ඉඩ පහසුකම් සැලැස්විලා තිබෙනවා. එදා කුණු ටික දිලා අපිට සල්ලිත් දෙන්න වෙච්ච යුගය අවසන් කරලා අද කුණු දිලා එතනින් අපිට සල්ලි ගන්න පුලුවන් තත්වයක් බවට අද සභාව පරිවර්ථනය වෙලා තිබෙනවා. ඒවගේම තමයි ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම නවින තාක්ෂණයත් මේ සභා ගර්භය තුල ස්ථාපිත කරලා එතුලින් සභා සේවකයන්ගේ කාර්යක්ෂමතාවය තවත් ඉහල නංවන්නට අවශ්‍ය කටයුතුත් අවදානය මේ සඳහා යොමු වෙලා තියෙනවා. ඒවගේම තමයි ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම කැලි කසල සම්බන්ධයෙන් කථා කරනකොට අපිට ලොකු ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබුනා සමහර වීදුරු බිම අතුරණ ටයිල්, පිඟන් ආදිය අපිට එතරම් සාර්ථක විසදුමක් තිබුනේ නැහැ. පහුගිය කාලේ අපි තවත් ඉස්සරහට පිම්මක් පැනලා ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ නායකත්වයෙන් අපි සියලු දෙනා සාකච්ඡා කරලා දැන් ඔබතුමා යෝජනා කරලා තියෙනවා ඒ සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර අරගෙන ඒ තුලින් තව තවත් රැකියා අවස්ථා නිර්මාණය කරලා තවත් පිම්මක් ඉස්සරහට පනින්නට. විශේෂයෙන්ම ගරු නගරාධිපතිතුමනි මම විශ්වාස කරන්නේ අපිට අවශ්‍ය වැඩක් කරන්න පුලුවන් අයවැයක්. ඒ නිසා අපිට පහුගිය ටිකේ බැරිවුන දේවලුත් හදාගෙන මේ වසංගත තත්වයන් වලට මුණ දිලා ඉතාමත් හොඳ සුන්දර සංවර්ධනයක් සුභ සාධන කටයුත්තක් 2022 දි ජනතාවට ලබා දෙන්නට ඕන. ඒ නිසා විශේෂයෙන්ම මා නියෝජනය කරන කොරලවැල්ල බටහිර කොට්ඨාශයේ ජනතාව වගේම මොරටුව ජනතාවත් ඒ දෙස බලාගෙන ඉන්නවා. අවසාන වශයෙන් ගරු නගරාධිපතිතුමනි අපිට දීර්ඝ කාලීන සැලසුමක් නිර්මාණය කරන්නට ඕනෑ. ඒක ලබන අවුරුද්දේ අවසන් වෙන තත්වයක් නොවෙයි හෙට දවසේ ඉෂ්ඨ වෙන දෙයක් නොවෙයි අපිට හැමදාම මොරටුව ජනතාවට ඔබතුමාට දෙන්න පුලුවන් උපරිමය අපිට දෙන්නට පුලුවන් උපරිමය ඒ ජනතාව වෙනුවෙන් අපිට ලබා දෙන්නට පුලුවන් අයවැයක් 2022 දි මොරටුව ජනතාවට ලැබිලයි කියන එක මේ අවස්ථාවේදි මා සඳහන් කරන්නට කැමතියි. ඒ වගේම තමයි ගරු නගරාධිපතිතුමනි විශේෂයෙන්ම අපි මේ සියලු දේ වලුත් එක්ක රටේ තිබෙන ආර්ථික තත්වයත් එක්ක අපිට කරන්නට පුලුවන් සියලු දේවල් සිදු කරමින් පරිසරය ආරක්ෂා කර ගන්නිමින් අවශ්‍ය කටයුතු තවත් දුරටත් ඉදිරියට කරගෙන යාමට මමත් මගේ ආදරනීය සහෝදර මන්ත්‍රිවරුනුත් සැදිපැදී

සිටින බව ප්‍රකාශ කරමින් 2022 වර්ෂය මගේ ආදරනීය ජනතාවට සුභම සුභ නව වසරක් වේවායි , නව ආර්ථික වසරක් වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජීත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා විසින් ඉදිරිපත් කරපු අයවැය ප්‍රතිපත්ති කෙටුම්පත පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වෙනවා. ගරු නගරාධිපතිතුමනි, ප්‍රකාශයේ සඳහන් වුන පරිදි ඔබතුමා මේ ඉදිරිපත් කරන්නනේ 14 වන අයවැය. මා මන්ත්‍රීවරයෙක් වශයෙන් සම්බන්ධවන 4 වන අයවැය. මේ ලේඛනය පිළිබඳව කරුණු කාරණා බොහොමයක් කථා කරන්න තිබුනත් අපි විශ්වාස කරනවා ඒවා කථා කිරීමේදි මේ අයවැය ලේඛණය ඇතුලේ මොරටුව ජනතාවට කොයිතාක් දුරට එහි ප්‍රතිලාභ, එහි වාසිය ලභා කරදිලා තියෙනවද කියන කාරණය පිලිබඳ සාකච්ජා කරන්න. දැන් මේ අයවැය ලේඛණයේ අපට පේන්න තියෙනවා ගරු නගරාධිපතිතුමනි අපගේ අභිමතාර්තයන් කියලා පිටුවක්. ඒ අභිමතාර්ථයන් එකිනෙක මම කියන්නේ නැහැ. ඇත්තටම මේ අභිමතාර්ථයන් ඉටුවෙලාද? ජනතාව මේකෙන් සැහීමකට පත් වෙලාද? කියන කාරණය අපි ජනතාවටම භාර කරනවා. අපි විශ්වාස කරනවා මේ අයවැය ලේඛණයට අනුව තමුන්නාන්සේලා පහුගිය අයවැය ලේඛන වලත් ඉදිරිපත් කරපු ඒ ඉලක්කන් ඒ අදහස් සාම්ප්‍රදායික අයවැය ලේඛණයක් බවට තමයි මේ අයවැයනුත් අපිට පෙන්නුම් කරන්නේ. අපිට පෙන්නේ නැහැ එහි ඇත්ත ධනාත්මක සාධනීය ලක්ෂණ. ඒවගේම තමයි ගරු නගරාධිපතිතුමනි, මේ වාර්තාවේ බොහොමයක් කරුණු නිවැරදි කරුණු නොවන බවට ඕන තරම් සාක්ෂි අපිට තියෙනවා. ඒවගේම මොරටුව ජනතාව මේ වෙනකොට මුහුණ දෙන බරපතල ගැටලු වලට ඇත්ත විසදුම් සහ ඇත්ත ප්‍රතිපාදන මේවායින් වෙන් වෙලාද කියන කාරණය අපිට බලපානවා. අපට කථා කරන්න සිද්ධ වෙනවා. මා සුදානම් වෙන්නේ නැහැ මේ ඉලක්කම් පිලිබඳ හරහයකට යෙදන්න. මොකද මේ ඉලක්කන් ඕන තරම් අපිට ඉදිරිපත් කරන්න පුලුවන්. හැබැයි අවසානයේ ඔබ තමයි තීරකයා බවට පත්වෙලා තියෙන්නේ. ඔබට හිතෙන පරිදි ඔබට හැගෙන පරිදි තමයි ඔබ මේ සියලු මුදල් වියදම් කරන්නේ මේ ආයතනයේ කරුණු ගත්තොත් එහෙම මේ ලේඛණයේ බොහෝමයක් කරුණු සෞඛ්‍ය ගත්තත්, ඒවගේම භෞතික සම්පත් වලින් ගත්තත්, සුභ සාධන සේවා වලින් ගත්තත්, ඇත්ත අරමුණු ශාක්ශාත් කරගන්න පුලුවන්ද කියන කාරණය බරපතලව පැන නගිනවා. ඒ විතරක් නොවෙයි මේ අයවැය ලේඛණයේ සාවද්‍යතාවය පිලිබඳව කරුණු ඔප්පු කරන්න මම එක කරුණක් ගන්නම් ඔබ දන්නවා ගරු නගරාධිපතිතුමනි, අපේ මහ නගර සභාවේ අතිශ්‍ය වැදගත් මේ කාර්ය මණ්ඩලය පිලිබඳව. මොරටුව මහ නගර සභාවේ අනුමත කාර්ය මණ්ඩලය මේ වසරේ සඳහන් වෙනවා 971 ක්. ඒ 971 එසේ තිබියදි දිගින් දිගටම අපේ සභාවේ

පුරප්පාඩු වෙනවා තනතුරු 159 ක් එසේ 159 ක් පුරප්පාඩු තිබියදි තමයි අපි විටින් විට මේ අනුමත කාඩරයට පිටින් සේවකයෝ බඳවා ගන්නේ. වැටුප් ප්‍රතිපූර්ණ නොවී සභාවේ අරමුදලින් විශාල මුදලක් අපිට වැය කරන්න සිද්ධ වෙනවා. ඒ විතරක් නොවෙයි ගරු නගරාධිපතිතුමනි, මේ බඳවා ගැනීම් බොහොමයක් තමන්ගේ හිතවතුන්, ඥාතීන්, දූවරුන්, ලේලිවරුන්, තම තමන්ගේ හිතවත් පාර්ශවයන් බඳවා ගැනීම් බවට පත් කරලා තියෙනවා. ඒ විතරක් නොවෙයි මේවා ඇතුලේ අතයට

ගනුදෙනුත් සිද්ද වුන බවට ඕනතරම් සාක්ෂි තියෙනවා. හැබැයි මේකේ බරපතල කාරනයක් පෙන්නුම් කරනවා. ගරු නගරාධිපතිතුමනි, කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 3 දෙනයි ඉන්නේ.තමුන්නාන්සේලාගේ පාලනය තුනෙන් දෙකේ පාලනය, විධායක ජනාධිපතිධුරය, ආණ්ඩුකාර පාලනය මේ සියලු පාලනයන් තිබියදි තමුන්නාන්සේලා තාමත් සමත් වෙලා නැහැ මේ 159 පුරෝ ගන්න. ඒක එක ප්‍රශ්නයක්. ඊලඟට මේ තුන්දෙනෙක් සඳහන් කරන කොන්ත්‍රාත් සේවක පිරිස මේක බොරුවක් කියන එක ගිය ආයතන කමිටු වාර්තාවෙන් ඔප්පු වෙනවා. ඒ වාර්තාවේ 40 දෙනෙක්ගේ නම් තියෙනවා නැවත සේවා කාලය දිර්ග කරන්න. එතකොට මේකේ සාවද්‍යතාවය ඉතාම පැහැදිලිව ඔප්පු වෙනවා. ඒ විතරක් නොවෙයි ගරු නගරාධිපතිතුමනි, ඔබ දිගින් දිගටම ඉතාම වර්ණවත් ලෙස ප්‍රකාශ කලා කසල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අපි කවුරුත් සතුටු වෙනවා මොරටුව මහ නගර සභාව දීර්ඝ කාලයක් අවශ්‍යතාවයක තිබූ කසල ව්‍යාපෘතිය යම් ප්‍රමාණයකට සාර්ථකව ආරම්භ කලා. හැබැයි ගරු නගරාධිපතිතුමනි, එහි ඇත්ත අභිමතාර්ථය ඇත්ත ප්‍රතිලාභය තවමත් ජනතාවට ලැබෙනවද කියන කාරණය ජනතාවම දන්නවා. ඒකට හේතුව තමයි මේ වෙනතෙක් කසල එකතු කිරිමේදි බැහැර කිරිමේදි ජනතාව මේ වෙන තෙක් 100% ක් සාර්ථක ප්‍රතිලාභයක් ජනතාවට ලැබෙන්නේ නැහැ. භූමි වලට ගියාම භූමිය ඇතුලේ අවස්ථා ගණනාවලදි නිසි පරිදි කසල එකතු කිරිම, නිසි පරිදි කසල බැහැර කිරිම, කසල වර්ගිකරණය පිලිබඳව ජනතාව නිවැරදි ආකාරයෙන් දැනුවත් කිරිම සිදු නොවීමේ ප්‍රතිඵලය නිසා මාර්ග පුරා තවදුරටත් කුණු කසල ගොඩ ගැහිලා තියෙනවා. ඩෙංගු රෝගින් නැවත වටයකින් වැඩි වෙලා තියෙනවා. අපට සැහිමකට පත් වෙන්න බැහැ ඔබේ කසල කලමණාකරන අවුරුද්දකුත් මාස 10 ක කාලයක් ගතවෙලා ඔබ ඉන්න තැනත් මොරටු ජනතාව භුක්ති විදින කසල කලමනාකරණයේ ප්‍රතිලාභයත් ප්‍රතිඵලයක් ගැන අපට සැහිමකට පත් වෙන්න බැහැ. ඒ නිසා අපි නැවත නැවතත් ඉල්ලිමක් කරනවා. මේ කසල ව්‍යාපෘතිය ඉතා හොඳ ව්‍යාපෘතියක් එය මීට වඩා විදිමත් කරගනිමින් ජනතාවට මීට වඩා ප්‍රතිලාභ ලැබෙන ව්‍යාපෘතියක් බවට පත් කර ගැනිම ඔබේ වගකීම. හැබැයි අපි දන්නවා අපි මේ කරුණු කාරණා මොන යම් ආකාරයටකට කථා කලත් දත්තයන් ඉදිරිපත් කලත් එහි ප්‍රතිලාභය ජනතාව වෙත යොමු නොවන බව පහුගිය අයවැය ලේඛණ වලිනුත් මේ අයවැය ලේඛණයෙනුත් අපිට ඉතාම හොඳින් පැහැදිලි වෙනවා. එම නිසා ඔබත් ඔබේ

පාලනයත් දිගින් දිගටම අසමත් භාවයේ සංකේතය බවට මේ අයවැය ලේඛණය පත්වෙලා තියෙනවා. ඒ නිසා ජනතාවට ආරාධනා කරනවා තව දුරටත් මේ රටේ ජනතාව මෙවැනි අසමත් පාලනයක් සමග ගමන් කරනවද නැද්ද කියන කාරණය ජනතාවම තීරණය කරන්න ඒ විතරක් නොවෙයි මේ වෙනකොටත් අපේ රටේ ජනතාව ඒ තීරණය ගනිමින් ඉන්නවා කියන එක අපිට හරි සතුටින් කියන්න පුලුවන්. ඒක නිසා අද අවසානයේ මේ පැත්තේ අපේ මන්ත්‍රීවරු අත උස්සලා හවසට රන්දිය හෝටලයට ගිහිල්ලා ඒ රාත්‍රී බෝජන සංග්‍රහය භුක්ති විඳලා එලියට ආවට භූමියේ තමුන්නාන්සේලාට ජනතාවත් එක්ක මුහුණ දෙන්න බැරි ප්‍රශ්නයක් තියෙනවා කියලා අපි දන්නවා. ඒක නිසා අපි නැවත නැවතත් මොරටුවේ ජනතාවට ආයාචනා කරන්නේ මෙවැනි සංදර්ශන අයවැය ලේඛන වලින් ජනතාවට ඵලක් නොමැති බවත් මේ අයවැය ලේඛණ වල ඇත්ත ප්‍රතිලාභය ජනතාවට නොලැබෙන බවත් දිගින් දිගටම ඔප්පු කරමින් තිබෙන මොහොතක මේ ඔබ විසින් ඉදිරිපත් කරපු අයවැයටත් ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයක් ලෙස අපි විරුද්ධ වන බව සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, එගොඩඋයන කොට්ඨාශයේ මන්ත්‍රීවරිය ලෙස මා ප්‍රථමයෙන්ම සඳහන් කරන්න කැමතියි 2019 වසරේ මැද සිට මේ ඉතාමත් රුදුරු උවදුරක් පසුකරමින් යන කාල පරිච්ඡේදයක්. එහෙත් ඒ සෑම උවදුරු වලට හා අභියෝගයන්ට මුහුණ දෙමින් සංවර්ධන කටයුතුද ඉතා සාර්ථකව ගෙන ගිය බවද

සඳහන් කරන්න කැමතියි. කොවිඩ් වසංගතයෙන් මොරටුව ජනතාව බේරා ගැනීම සඳහා විශේෂිත වූ කාර්යයන් කිරීම ගැනත් යලිත් හිස ඔසවමින් එන්නාවූ ඩෙංගු වසංගතය වෙනුවෙන් එය මැඩලීම සඳහා සෞඛ්‍ය අංශද සහභාගි කරගනිමින් ගන්නා වූ ප්‍රයත්නය ඉතා අගය කරනවා මෙන්ම ප්‍රසංශාවද ලබා දෙනවා. කසල කළමනාකරණයට මහජනතාව පොළඹවා ගැනීමේදි යම් යම් දේශපාලඥයින් කුහකත්වයෙන් හා අනුවන කමින් ජනතාව පෙලඹවුවද ඒ ගැන විවේචනය කලද නමුත් දැන් ජනතාව එය ඉතාමත්ම අගය කිරීමට පත් වී තිබීම ගැන මම හිතන්නේ අප සභාවටත් ඉතා ආඩම්බරයට කරුණක්. ඒවගේම මොරටුව ජනතාව පැසසුමට ලක් කරනවා මෙන්ම අප සභාවට මහත් ආඩම්බරයක් වගේම මොරටුව ග්‍රාම සේවා වසම් 42 කේම කුණු කසල බැහැර කිරීම කාණු පවිත්‍ර කිරීම, පාරවල් ශුද්ධ කිරීම, මේ

සියලුම අංශවල සිටින සෞඛ්‍ය සේවක මහත්වරුන්ට හා සෞඛ්‍ය අංශයට මාගේ ප්‍රශංසාව පිරිනමන අතර, විශේෂයෙන් විදුලි අංශයේ මහතුන්ට මාගේ විශේෂ ස්තුතියත් ඔවුන් කරන කැපවීම, මෙහෙයවීමට පිරිනමා සිටිනවා. මෙම සියලු කරුණු නිසියාකාරයට කළමනාකරණය කරමින් මොරටු පුරවරය නහා සිටුවීමට ගන්නා උත්සහායට ගරු නගරාධිපතිතුමා ඇතුලු සියලුම නිලධාරි මහත්ම මහත්මින්ට පුදකරමින් 2021 ඉදිරිපත් කර තිබෙන්නාවූ සුභවාදී අයවැයට මා නියෝජනය කරන ලංකා සමසමාජ පක්ෂයේ සියලුම සහය හා ප්‍රසංශාව ප්‍රකාශ කරමින් මෙම අයවැය ලබන 2022 වර්ෂයට මහජනතාවට ඉතාම සුභවාදිව ඒවාගේම මහජනතාව අගය කරන අයවැය හැටියට මම මේ අවස්ථාවේදි ප්‍රකාශ කරමින් අයවැයට ජයවේවා කියමින් මා නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමී ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මම පලාත් පාලන මන්ත්‍රීවරියක් ලෙස පත්වෙලා 4 වන වසරේ අයවැය. විශේෂයෙන්ම මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ඇත්ත වශයෙන්ම අද දවසේ අයවැය සම්බන්ධයෙන් අපි කථා කරද්දි මට වැදගත් වෙන්නේ මම කාන්තාවක් වීම නිසා යි.මොරටුව ආසනයේ නියුතු අපේ කාන්තාවන් වෙනුවෙන් මෙම අයවැයෙන් කිසිම ප්‍රතිපාදන වෙන් නොකිරීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම මාගේ අප්‍රසන්න තාවය සහ විරෝධය පලකර සිටිනවා. විශේෂයෙන්ම අද දවස ගැන කථා කරන්න කැමතියි. අද අපි තැඹිලි පාට පටියක් අතේ බැදගෙන සිටිනවා. විශේෂයෙන්ම කාන්තා හිංසනය සම්බන්ධයෙන් එක්සත් ජාතින්නගේ සංවිධානය දින 16 ක් වෙන් කර තිබෙනවා. කාන්තා හිංසනය තැඹිලි වර්ණයෙන් යුතු ලොවක් බිහි කරමු. කාන්තාවන්ට නිසි ලෙස සලකමු. කාන්තාවන්ට ගෞරව කරමු. අපි දන්නවා කාන්තාවන්ට සහ දරුවන්ට නිසි ආකාරයෙන් සලකන්නේ නැත්නම් එතන කිසිම ස්ථානයක ප්‍රජාතන්ත්‍ර වාදයක් නැහැ. විශේෂයෙන්ම කාන්තාවක් විදියට මම කණගාටුවට පත් වෙනවා. මොරටුව ආසනයේ මොරටුව ප්‍රාදේශිය බල මණ්ඩලය නියෝජනය කරමින් මොරටුවේ සමස්ත කාන්තාවන් නියෝජනය කරන්න මට ලැබුණ අවස්ථාවෙන් මේ සිව් වසරක් පුරා කාලය තුල මට කිසිම ප්‍රයෝජනයක් ගන්න අවස්ථාවක් ලැබුනේ නැහැ. මේ අයවැය දිහා බලද්දි මම කණගාටුවට පත් වෙනවා. විශේෂයෙන්ම මේ අයවැය සම්බන්ධයෙන්. ඒ වගේම කාන්තාවන්ට සලකන ආකාරය සම්බන්ධයෙන් ගත්තොත්, අපි ප්‍රාදේශි මට්ටමින් පමණක් නොවෙයි. අපි ජාතික මට්ටමෙන් දැක්කා පාර්ලිමේන්තුව තුල කාන්තාවක් වාචිකව අපයෝජනයට පත් වෙනවා. රෝහිනි කවිරත්න මන්ත්‍රීතුමියට ඉතාම තුච්ච ආකාරයෙන් තිස්සකුට්ටි ආරච්චි කියන මන්ත්‍රීවරයා අපහසුවට පත් කලා පාර්ලිමේන්තුව තුල ඒවගේම පාලාත් පාලන ආයතන තුලත් එවැනි තත්වයන් මේ සිව් වසර පුරාම අපි දැක්කා ගරු නගරාධිපතිතුමනි. මේ තත්වය වෙනස් විය

යුතුයි. විශේෂයෙන් අපි දැක්කා ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිතුමා වසර 40 කට පෙර ශ්‍රී ලංකා කාන්තා කාර්යංශය හැදුවා. අපි ඒ හරහා ආපු සාමජිකාවන් දේශපාලනයට කාන්තා කාර්යංශය හරහා වසර 40 ක් ශ්‍රී ලාංකීය කාන්තාවන්ට විශාල සේවයක් ඉටුවුනා. ඔබතුමා දන්නවා කාන්තා කමිටුවක් නිර්මාණය කර ගත්තා. වසර 3 ක කාලයක් ගෙවුවා දැන් 4 වැනි වසරේ අපිට රුපියලකවත් ප්‍රතිපාදනයක් මෙම අයවැයෙන් වෙන් කරලා නැහැ ගරු නගරාධිපතිතුමනි. ඉතාම කණගාටුවට කරුනක් ලෙස මම ඒ කාරණය නැවත නැවතත් දක්වනවා. කාන්තාවන්ට ගෞරව කරන්න පුරුදු වෙන්න කාන්තාවන්ට හිංසනය තුරන් කරන්න කියන ආයාචනයත් සමගම කාන්තා හිතකාමී නොවන පරිසරයක් තුල කාන්තාවන් විදියට අද අපි කටයුතු කරනවා. විශේෂයෙන්ම මට කියන්න ඕන අපි ගොඩක් අමාරුවෙන් පිහිටවා ගත්ත කාන්තා කමිටුව ඔබතුමා සභාපතිත්වය දුන්නේ පුරුෂ පාර්ශවයේ මන්ත්‍රීවරයෙකුට. ඒක ජාතික මට්ටමෙත් එහෙමයි. කාන්තා අමාත්‍යාංශයක් තිබුනට කාන්තා මන්ත්‍රීවරියක් නැහැ කාන්තා අමාත්‍යාංශයට. මෙතන පලාත් පාලන අමාත්‍යාංශයෙක් ඒක වෙනසක් නැහැ.

ගරු නගරාධිපතිතුමනි. මේ රට කොයි අතටද යන්නේ කාන්තාවන්ට දරුවන්ට සලකන්න ජනතාව පුරුදු වෙන්න ඕන. නගරයක් විදියට දියුණු වෙන්නේ කොහොමද, සංවර්ධනය වෙන්නේ කොහොමද, සංවර්ධනය කියන්නේ ගරු නගරාධිපතිතුමනි බාහිරව සිදුවන සංවර්ධනය පමණක් නොවෙයි. අධ්‍යාත්මකව කාන්තාවන්ට දරුවන්ට අවශ්‍ය සංවර්ධනය වෙන්න ඕන ගරු නගරාධිපතිතුමනි ඔබතුමාට විශේෂ අවධානය යොමු කරනවා ඔබතුමා ඉදිරියට නගර සභාවේ නොසිටියත් නැවත පත්වෙන පාලකයින් අපි වෙන්නත් පුලුවන් ඔබතුමන්ලා වෙන්නත් පුලුවන් කවුරුන් හෝ වෙන්න පුලුවන් කාන්තා සංවේදී අයවැයක් හදන්න කියන යෝජනාව මම නැවතත් ඉදිරිපත් කරනවා ඇත්තටම කාන්තාවන්ට මෙවැනි තත්වයක් ඇතිවීම සම්බන්ධයෙන් මම කණගාටු වට පත් වෙනවා මොකද අද සමාජය කාන්තාවන් දිහා බලන කෝණය වෙනස් කරන්න ඕන. පුරුෂයින් ගොඩක් දුරට හිතන්නේ පුරුෂයින්ට පමණයි හැම දෙයක්ම කියලා. කාන්තා සංවේදී අයවැයක් නොවන හේතු විදියට මම දක්වන්න කැමතියි කාන්තාවන්ට හැමෝම හිතන්නේ සුදුසුකම් නැහැ කියලා. ඒවගේම කාන්තාවන් දෙවැනි පංතියේ පුරවැසියෙක් කරන්න තමයි හැම දෙනාම උත්සහ කරන්නේ. කාන්තාවන්ගේ අවස්ථාව පුරුෂයින්ට දෙන්න එපා. එය ඉතාම වැරදි සහගත තත්වයක් විදියට මම දකිනවා. විශේෂයෙන් අපේ නගර සභාවේ සංවේදී තාවයක් නැහැ. අපි කවදද මේ තත්වයට පත්වෙන්නේ. විශේෂයෙන්ම ජාතික මට්ටම සහ ප්‍රාදේශිය මට්ටම එකට එකතු කරපු ඊතලයක් තුල තමයි අපි ඉන්නේ. මම කණගාටුවට පත්වෙනවා මේ අවස්ථාවේ ගරු නගරාධිපතිතුමනි ඔබතුමාගේ අවදානය යොමු වෙලා නැහැ කාන්තාවන් සහ දරුවන් වෙනුවෙන්. අපේ අයවැයෙන් ඒ

සඳහා අවස්ථාවක් ලැබිලා නැහැ. විශේෂයෙන්ම මේ වරප්‍රසාදය මට ලැබුනේ එක්සත් ජාතික පක්ෂයෙන් අපේ පක්ෂ දෙකම සමඟි ජන බල වේගය සහ එක්සත් ජාතික පක්ෂය කාන්තාවන්ට නිසිලෙස සලකන පක්ෂයක් විදියට මම ඉතාම ගෞරවයෙන් මේ මොහොතේ සිහිපත් කරනවා. හිටපු අපේ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා 25% ක කාන්තා කෝටාවක් දිලා මේ රටේ කාන්තාවන්ට දේශපාලන රාමුවේ නියැලෙන්න ලැබුන අවස්ථාව ගැන එතුමාව ගෞරවයෙන් සිහිපත් කරනවා. ඒවගේම නාගරික මන්ත්‍රිවරියක් ලෙස අද මම මෙතන ඉන්නේ මොරටුව ආසනයේ සමඟිජන බල වේගයේ මගේ නායක ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා ඒ වගේම සේනක දමයන්ත මැතිතුමා ඇතුලු අප කණ්ඩායමේ නායකයින්ට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. ජාතික දේශපාලනය සහ ප්‍රාදේශිය දේශපාලනය ඔබතුමන්ලාගේ දෙකම එකයි එමනිසා මම ඔබතුමාගේන් බොහොම ගෞරවයෙන් ඉල්ලනවා ගරු නගරාධිපතිතුමනි කාන්තාවන්ට මෙම නගර සභාව ඇතුලේ ඔබතුමා හිංසනයට පත් වෙන්නට ඉඩ දෙන්න එපා. විශේෂයෙන්ම ලිහිනි මන්ත්‍රීතුමියට පසුගිය සභාවේදි ඇතිවුන තත්වය ගැන මම මගේ විරෝධය ප්‍රකාශ කරනවා. මමත් එවැනි තත්වයන් වලට පත්වෙලා තියෙනවා තවත් මන්ත්‍රිවරියන් එවැනි තත්වයන් වලට පත්වෙලා තියෙනවා කාන්තාවක් ඔබතුමාගේ මව මෙතන සිටින සියලුම මොරටුව නගර සභාවේ කාන්තාවන් හිංසනය සිදු නොවන්නට ඉඩ දෙන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඕනැකමින් ඉල්ලා සිටිමින් මේ අවස්ථාව ලබාදීම සම්බන්ධව ඔබතුමා ඇතුලු සියලුම දෙනාට ස්තුතිවන්ත වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්. පිලිප් ප්‍රැන්සිස් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2022 වර්ෂයේ ඔබතුමාගේ අයවැයට අපි සියලු දෙනාගේම සහයෝගය පතනවා. නමුත් 2022 අයවැය ඔබතුමා නියමානුකූලව ඉදිරිපත් කරලා මම හිතනවා ඔබතුමාගේ වැඩ පිලිවෙල අපගේ ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්මට අනුවම ඔබතුමාගේත් වැඩ පිලිවෙල 2022 ආකාරයේම ඉෂ්ට වෙයි කියන එක අප විශ්වාස කරනවා. ගරු නගරාධිපතිතුමනි, මොන ප්‍රශ්ණ ආවත් ඔබතුමා මේ මොරටුවට කරපු සේවය මොරටුවේ ජනතාවට අමතක වෙන්නේ නැහැ. මොරටුවේ ජනතාවට කරපු සේවය සියලු දෙනාගේම හිත් තුල තියෙනවා නගරාධිපති සමන්ලාල් ප්‍රනාන්දු අපිට කරපු සේවය. නමුත් අපිට ආර්ථික වශයෙන් පහුගිය දිනවල ජනතාවට ප්‍රශ්ණ තිබුනට එක එක අය මොනවා කිව්වත් ගම්

මට්ටමට ගිහිල්ලා තවත් අය ඔබතුමා ඇතුලු ආණ්ඩුවට දොස් කිව්වත් මිනිස්සුන්ගේ හිත් තුල තියෙනවා අද රටට වෙලා තියෙන තත්වය මොකක්ද රටේ තියෙන ප්‍රශ්ණය මොකක්ද කියලා තේරුම් ගන්න ජනතාවක් මේ මොරටුව තුල ඉන්නවා. නමුත් සමහර පුද්ගලයෝ වීථි වලට බැහැලා මොන දේවල් කිව්වත්, කරත් මොරටුවේ

ජනතාව තමුන්නාන්සේ ගැන විශ්වාසය තියලා ඉදිරි 2022 අයවැයත් මොරටුවේ සාර්ථක වැඩ පිලිවෙලක් කරනවයි කියන එක මොරටුවේ ජනතාව පමනක් නොවෙයි ගරු නගරාධිපතිතුමනි අපිත් එක්ක කථා කරන මිනිස්සු අපිට කියනවා මේ රටේ කොරෝනා ප්‍රශ්ණය එක්ක මේ රටේ සංවර්ධනයට මොරටුවේ සංවර්ධනයට අඩමල් රේනුවකවත් හානියක් සිද්ද වෙලා නැහැ මොරටුවේ නගරාධිපතිතුමා ඒ විදියටම වැඩ පිලිවෙල මොරටුවේ ගෙනිච්චයි කියන එක මොරටු ජනතාව අද පිලිඅරගෙන ඉන්නවා. මොන කුහකයෝ මොන විදියට කථා කලත් කුහක දේශපාලඥයෝ මොන විදියට වැඩ කලත් මොරටුවේ ජනතාව තමුන්නාන්සේ කෙරෙහි තියෙන විශ්වාසය 2022 වෙනකොට තමුන්නාන්සේ මේ මොරටුවේ තව දේවල් කරලා මේ අයට පෙන්වනවයි කියන එක අපි දන්නවා. ඒක නිසා ඔබතුමා ඉදිරිපත් කරපු අයවැයට කොරලවැල්ල නැගෙනහිර කොට්ඨාශයේ ජනතාවගේ ස්තුතියත් මගේ ස්තුතියත් පුද කරන අතර ජයවේවා කියමින් මම නිහඩ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.කේ.පි.සුසන්ත පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ මගේ 4 වෙනි අයවැය කථාවත් ඔබතුමාගේ 14 වැනි අයවැය ප්‍රකාශනයෙන් 2021 වර්ෂය කොවිඩ් වසංගතය සමඟ අපගේ ඉලක්කයන්ට යාමට නොහැකි වුණා. විශාල පිරිවැයක් අප සභාවටත් ඒ වෙනුවෙන් දැරීමට සිදු වුනා. නමුත් 2022 අයවැයට ඒ සඳහා ඔබතුමාගේ අවධාන යොමු කර අවශ්‍ය කටයුත්ත සම්පාදනය කර තිබෙනවා. ඒ පිලිබඳව ඔබතුමාට මගේ ස්තුතිය පුද කර සිටිනවා.2022 වර්ෂයට ඔබතුමා ගෙන එන අයවැය යෝජනාව ඉතාමත් සාර්ථක අයවැයක් බව ප්‍රකාශ කරමින් එම අයවැයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරමින් ඔබතුමා ගෙනයන වැඩ පිලිවෙල ඉදිරියටත් මොරටුව ජනතාව වෙනුවෙන් කර ගැනීමට ධෛර්ය සම්පත්තිය ලැබිලා ඔබතුමාට ඉදිරියටම යන්න හැකියාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් නිහඩ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - සිත්ති මසිනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අද දින මොරටුව මහ නගර සභාවේ මොරටුව ජනතාව වෙනුවෙන් 2022 වර්ෂයට අදාල අයවැය අවස්ථාවට සහභාගිවීමට ලැබීම ඉතා වැදගත් කොට සලකනවා. අපි දන්නවා 2018 සිට අපේ සමස්ත අයවැය මිලියන 900 යි. අද ඉදිරිපත් කරන අයවැය 2022 සඳහා අපේ සමස්ත අයවැය බිලියන 3.4 යි එතකොට 2021 වසරට සාපේක්ෂව අපි බැලුවොත් 2022 වසරට අපි මිලියන 34 ක වෙනසයි තියෙන්නේ. ලොකු පරතරයක් නැහැ. එම නිසා සංඛ්‍යාත්මකව බැලුවොත් අපි 2021 වසර හා 2022 වසර අතර කිසිම වෙනසක් නැහැ. ඒ වගේම ප්‍රාග්ධන ආදායම ගත්තොත් අපි 2022 වසරට බිලියන 2.3 යි එයින් බිලියන 1.7 ක් අපි බලාපොරොත්තු

වෙන්නේ බැංකු ණය මාර්ගයෙන්. අපි 2020 ගැන කථා කලොත් 2020 දෙසැම්බර් මාසයේ මිලියන 40 ක ඕඩර් ඔෆ් ෆැසිලිටි එක ගන්නවා. ඒ ෆැසිලිටි එක සඳහා අපිට ඇඩ්මිනිස්ට්‍රේශන් ක්‍රොස්ට් එකක් එනවා තුන්ලක්ෂ අසුපන්දාහක් එතකොට මාසික වාරිකය අපිට මිලියන 3.3 යි එතකොට පලවෙනි වාරිකය පොලිය දෙලක්ෂඅසුහතරදාහයි. එච්චර වියදමක් දරන්න වෙනවා. ඒ වගේම ඒ වර්ෂය ඇතුලත 2021 වෙනකොට අපි තව කැබ් රථ 4 ක් ගන්නවා. ඒකට මාසික වාරිකය හාරලක්ෂපනස්හයදාහයි පොලිය තුන්ලක්ෂ හැටනමදාහයි. එතකොට අපි මාසිකව මිලියන 4 කට ආසන්න ප්‍රමාණයක් වැය කරනවා. අපි මේ අමතර වියදමක් කරන්නේ. ඒ අපි ගෙවන වියදම සැප්තැම්බර් මාසයේ ගිනුම් ශේෂය බැලුවොත් අපේ ගිනුම මිලියන 21 ක ඕඩර්අප් එකක් තියෙනවා ඒ මිලියන 21 ට තව පොලියක් ගෙවනවා එක්ලක්ෂ හතලිස් අට දාහක්. එතකොට අපිට බිලියන 4 දශම ගනනක වියදමක් දරන්න සිද්ද වෙනවා. එතකොට නගරාධිපතිතුමනි, මේ බිලියන 1.7 ත් අපේ මේ භෞතික සැලස්ම යටතේ රංග ශාලාව සහ උත්සව ශාලා සඳහා අපි මිලියන 100 ක් බලාපොරොත්තු වෙනවා බැංකු ණය. නිවාස සංකීර්ණය සඳහා බිලියන 600 යි මධ්‍යම වෙළඳ පොල සඳහා මිලියන 1000 යි. අපි කැමතියි මේ ව්‍යාපෘති සියල්ල ඔබතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුලත්. අපේ මොරටුව ජනතාවට, මොරටුවට මේ වගේ දියුණුවක් ලැබෙනවා නම් අපි සියලු දෙනාම කැමතියි.

ගරු නගරාධිපතිතුමනි අවධාරණය කරන්න ඕන කොවිඩ් වසංගතය නිසා අපි දන්නවා අපිට මේක පටන් ගන්නවත් ඉවර කර ගන්නවත් බැරි වුනා. නමුත් ඉදිරි වර්ෂයේදි 2022 හෝ අපිට මේ ටික කර ගන්න පුලුවන් නම් අපිට මිලියන 40 ට මෙච්චර ලොකු බරක් දරන්න වෙනවා නම් බිලියන 1.7 ට කොච්චර ලොකු බරක් දරන්න වෙනවද. මේ ප්‍රධාන ව්‍යාපෘතියන්ට හැර අපිට තවත් ව්‍යාපෘති ටිකක් තියෙනවා අපි තාම කරලා ඉවර නැති ඒවා. ඒ එකක් තමයි සභාවට ප්‍රයෝජනය සඳහා මුද්‍රණාලයක් ඉදිකිරීම සෝලාපවර් පැනල් එකක් තියෙනවා ඒක තව මම හිතන්නේ කරලා ඉවර නැහැ. ඒ වගේම මොරටුව බස් නැවතුම තියෙනවා. බොල්ගොඩ සංවර්ධන ව්‍යාපාතිය තියෙනවා. මේ ප්‍රධාන ව්‍යාපෘති 3 ට අමතරව තියෙන ව්‍යාපාති ටික. ඒවගේම ගරු නගරාධිපතිතුමනි, කණගාටුයි කියන්න 2021 වසරේ අපි කාන්තාවන් සඳහා අපේ ගරු ලිහිණි මන්ත්‍රීතුමිය විශේෂ යෝජනාවක් කරලා මිලියන 3 ක ප්‍රතිපාදනයක් වෙන් කර ගත්තා 2021 ට එතකොට 2022 ට ඒකට 50% ක් අඩු කරලා තමයි වෙන්කරලා තියෙන්නේ. ඒකත් වෙනම වැය ශීර්ෂයක් යටතේ තමයි වෙන් කරලා තියෙන්නේ. මම හිතනවා 2022 ට අපිට මීට වඩා ප්‍රතිපාදනයක් ලබා ගන්න පුලුවන් වෙයි කියලා. ඒවගේම තමයි ගරු නගරාධිපතිතුමනි, අපේ අයවැය ට අමතරව මේ අයවැය කියන්නේ අපේ ඉදිරි වර්ෂය සඳහා ආදායම සහ වියදම ඊට අමතරව මේක නොවෙයි අපේ ප්‍රධාන කර්තව්‍යය අපි මේක ක්‍රියා කරන්නේ කොහොමක කියනඑක තමයි අපේ ප්‍රධාන කර්තව්‍යය. 2022 ට අපි අයවැයක් ඉදිරිපත් කරලා 2022 වසර අවසාන වෙද්දි අපිට විගණන වාර්තාවක් එනවා අපි මොනවද මේ කරලා තියෙන්නේ කියලා. අපි මෙතන අයවැය ගැන ලොකුවට කථා වෙනවා නමුත් විගණන වාර්තාව එද්දි අපි කොහෙද ඉන්නේ කියලා දන්නේ නැහැ.විගණන වාර්තාව ගැන උනන්දු වෙලා ඉදිරියට අපේ අයවැය විතරක් නොවෙයි විගණනය ගැනත්

හිතන්න ඕන. මේ අයවැය කියන්නේ ඒකපුද්ගල ආදායම හෝ වියදම නොවෙයි. මේක සමස්ත මොරටු සභාවේ අයවැය ඒකට අපි ගරු නගරාධිපතිතුමා ඇතුලු සභිකයින් 47 දෙනා සාමුහිකව මේකට වගකියන්න ඕන. 2018 සිට අපි සැලකුවම විගණන වාර්තාවක් ආවම අපි කොහෙද ඉන්නනේ කියලා අපි බය වෙනවා. අපි බලනවා 2018 සිට මොකද මේ වෙන්නේ කියලා. හැමදාම එකම වැරැද්ද සිද්ධවේගෙන යනවා. ඉදිරියට අපි කටයුතු කරන්න

ඕන මේ වැරැද්ද අපි කොහොමද නිවැරදි කරන්නේ කියලා. උදාහරණයක් ගත්තොත් අපි දන්නවා 2019 අවසාන තොගය 2020 ට ඉදිරියට ගෙන්නේ නැහැ. ඒක ලොකු වැරදීමක් අතපසු වීමක්. අපි ටිරෝන් ප්‍රනාන්දු ක්‍රීඩාංගනය ගත්තම අපේ සේවාවට දෙන මුදල අඩුවෙන් තියෙන්නේ. සභාවට දෙලක්ෂ තිස්හතර දාහක පාඩුවක්. ඒක ඉදිරි වර්ෂයට ගිනුම් ගත වෙන්නේ නැහැ ඒක කොහෙද කියලා දන්නේ නැහැ. ඒවා අයකරන්නේ නැහැ.2019 දි සේවකයන් අපි බඳවා ගන්නාව සාමාන්‍ය පටිපාටියට අමතරව 55 දෙනෙකුට අපි වැටුප් ගෙවලා තියෙනවා මිලියන 7 ක්. ඒක අපිට ප්‍රතිපූර්ණය වෙන්නේ නැහැ භාණ්ඩාගාරයෙන්. ඒක 2019 දි වියදමක් හැටියට අපිට යනවා. ඒ කාගේ සල්ලි ද ජනතාවගේ සල්ලි. ඒක නිසා අපි වැඩ කරනකොට පරිස්සමෙන් වැඩ කරන්න ඕන. මේ අයවැය කියන්නේ අපි සියලු දෙනාම සාමුහිකව වගකීමක් දරාගෙන ඉදිරියට අපි වැඩ කරන්න ඕන. අපි අයවැය පුම්බගෙන මිලියන 900 සිට 3.4 ට ගියා කියලා අපෙන් ලොකු වැඩක් කෙරෙන්නේ නැත්නම් එකේ වැඩක් වෙනන් නැහැ. ගරු නගරාධිපතිතුමනි මම නගර සභාවෙන් සිදු වෙන හොඳ දේවල් ගැනත් කියන්න ඕන. අපි නිලධාරින්ට විරුද්ධව කථා කරනවා නොවෙයි. අපි කවද හරි මෙතන නැති වෙච්ච අවස්ථාවක අපේ ගෙවල් වලට ලියුම් එන්න හොඳ නැහැ අධිභාරයක් තියෙනවා කියලා. ඒ වගේම සොයිසාපුර ප්‍රජාශාලාව, පොදු ක්‍රීඩාංගන,ඒ සියලු දේ NHD එකෙන් මුදවාගෙන වැලඳ ගෙන සතුටු වෙනවා. ඒවගේම නොදිරණ කුණු සම්බන්ධව හොඳ ප්‍රගතියක් ලබලා තියෙනවා. නොදිරන කුණු වලට යන වියදම 40% කින් අඩු කර ගන්න පුලුවන් වෙලා තියෙනවා සභාවට. ඒක ගැන අපි සතුටු වෙනවා. ජයවේවා කියමින් මා නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2022 අයවැය මගේ 4 වන අයවැයයි. ගරු නගරාධිපතිතුමා ඇතුලු නිලධාරී මණ්ඩලය ඉදිරිපත් කරන මේ අයවැය ඉතා සාර්ථක අයවැයක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා. මගේ කොට්ඨාශයේ සියලුම ජනතාව සිංහල, දමිල, කතෝලික, මුස්ලිම් සියලු ජනතාව ජීවත් වෙනවා. ඒ සියලුම ජනතා සුභ සිද්ධිය සඳහා 2022 අයවැය සාර්ථක අයවැයක් වේවා කියා ප්‍රාර්ථනා කරමින්, ලබන්නාවූ 2022 වසර සුභම සුභ වසරක් වේවා කියා නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එස්.වී.එම්.නීෂා ඉරානි විජේවික්‍රම මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මේ මගේ 4 වන අයවැය කතාවයි. ප්‍රථම කොට ම ගරු නගරාධිපතිතුමනි ඔබතුමාට මාගේ ගෞරව ස්තුතිය ප්‍රකාශ කර සිටිනවා.හේතුව තමයි කොරෝනා වසංගතය ලෝකය හමුවේ වගේම මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ අපගේ සංවර්ධන කටයුතු කර ගැනීමට විශාල බාධාවක් වූ අතර ඒ බාධා මැඩගෙන ක්‍රමයෙන් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම ජනතාවගේ ප්‍රධානතම ගැටලුව වන කසල කලමනාකරණයට නිසියාකාර විසඳුම් ලබා දීම පිලිබඳව කියනවානම් පසුගිය වසර ගණනාවක දිරන අප ද්‍රව්‍ය කොම්පොස්ට් බවට පත් කිරීම පමණක් සණ අපද්‍රව්‍ය සඳහා ස්ථීර සාර විසඳුමක් ලැබී තිබුනේ නොමැති බැවින්. ඔබගේ 2021 අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර තිබුනා නොදිරන අපද්‍රව්‍ය එකතු කර බ්‍රෙල් යන්ත්‍ර මගින් ඒවා කුට්ටි කොට ලබා දීමට කටයුතු කිරීම ඔබතුමාගේ ඒ ප්‍රකාශය සනාථ කරමින් එම ක්‍රියාදාමය මේ වෙනකොට සත්‍යක් බවට පත්කර, සණ ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ආයතනයක් බවට පත් කරමින්, ඒ මගින් නගර සභාවට ආදායමක් උපදවන මාර්ගයක් බවට පත් කරගෙන තියෙනවා. ඒවගෙම 2022 වර්ෂය සඳහා යෝජිත සභාවට වෛද්‍ය වරයෙකුත්, වරලත් ඉංජිනේරු වරයෙකුත් ලබා ගැනීම සහ ඉතිරි සංවර්ධන කටයුතු කරගෙන යාම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමද මා ඉතා අගය කොට සලකනවා. එම නිසා 2022 වර්ෂයේ අයවැය සඳහා මාගේ සහයෝගය ලබා දෙමින් ලබන්නාවූ නව වසර සියලු දෙනාටම වාසනාවන්ත වසරක් වේවා කියමින් මා නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.කිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මගේ වසර 10 කුත් මාසයක මන්ත්‍රිධුර කාලය තුල 9 වැනි අයවැයට සහභාගි වෙන මේ මොහොතේ ස්තුතිවන්ත වෙනවා කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධව. මේ අයවැය ලේඛණය ගැන හැදින්වීමක් කලොත් මෙහි අන්තර්ගතය විමසිමේදි කිසිදු හරයක් ගුණයක් නිර්මාණශීලිත්වයක් නොමැති මොරටු ජනතාව තුල විශාල ණය ප්‍රමාණයක් එකතු කරපු උදෙක්ම සම්ප්‍රදායික අයවැයක් බව ප්‍රකාශ කරන්න කැමතියි. ඒ වගේම සත්‍ය ආදායම විකෘත්ති කරපු රජයේ ආධාර හා ණය මත යැපෙන ලියවිල්ලක් බවත් ප්‍රකාශ කරන්න කැමතියි. ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරනවා පිටු අංක 11 අය ශීර්ෂ 7101 යටතේ රුපියල් මිලියන 40 ක ණය මුදලක් පෙන්නලා දිලා තියෙනවා. මේ ණය මුදල පෙන්නලා දුන්නට මුදල ලබා ගන්නේ කුමණ ව්‍යාපෘතිය සඳහාද කියන එක ඔබතුමා සඳහන් කරලා නැහැ. මම ඔබතුමාගේ අවසන් කථාවේදි බලාපොරොත්තු වෙනවා ඒ මුදල ලබාගන්නේ කුමන ව්‍යාපෘතියටද කියා ප්‍රකාශ කරන්න කියලා. ඒ වගේම ගරු නගරාධිපතිතුමා, පිටු අංක 18 අය ශීර්ෂය 7101 බැංකු ණය රෝම ඉලක්ම් (ii) යටතේ රුපියල් මිලියන 100 ක මුදලක් ලබාගන්න බලාපොරොත්තු වෙනවා. යෝජිත රංග

ශාලාව හා උත්සව ශාලාව සඳහා ඒවගේම ඒ යටතේම රෝම ඉලක්කම් (iii) යෝජිත නිවාස සංකීර්ණය සඳහා ණය මුදල් මිලියන 600 යි. එම පිටුවේ අය ශීර්ෂ යටතේම රෝම ඉලක්කම (v) යටතේ මිලියන 1000 ක ණය මුදලක් මධ්‍යම වෙළඳ පොල නවීකරණය සඳහත් ඔබතුමා ලබාගන්න බලාපොරොත්තු වෙනවා. මේ මුලු ණය මුදලේම එකතුව මිලියන 2390 ක් පමණ වෙනවා. මේ අයවැයේ මුලු ප්‍රාග්ධන හා පුණරාවර්ථන ආදායම වෙන්නේ මිලියන 3403 යි. ලබාගන්න බලාපොරොත්තු වන ණය මුදලේ එකතුව මිලියන 2390 යි. මම අහන්න කැමතියි ගරු නගරාධිපතිතුමනි මේසා විශාල ණය මුදලක් සභාවේ ආදායමෙන් 70% ක් ප්‍රාග් ධන ණය මුදලක් හැටියට ඔබතුමා ලබාගෙන මේ සභාව ඉදිරියේදි ලොකු ණය උගුලක පටලවන්න බලාපොරොත්තුවක් තියෙනවද කියන කාරණව. අපි දැක්ක ගිය වසර 3 – 4 පුරාවටම විශාල ණය මුදලක් ගන්න උත්සහ කරනවා.නමුත් ගන්න අසමත් වෙනවා. මේ ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ගිය වසර කිහිපය තුලම මෙම උත්සහය යෙදුනා. මෙම වර්ෂයේත් මේ උත්සහයම යෙදෙනවා. මම අහන්න කැමතියි අද රට විශාල වශයෙන් පසු ආර්ථික බෑමකට ලක් වෙලා තියෙනවා. විශල ප්‍රශ්ණ ගණනාවක් පෙල ගැසි තිබෙන මේ මොහොතේ ඔබතුමාට ඉදිරියේදි මේ ණය මුදල ලබාගෙන මේ වැඩේ කරන්න හැකියාවක් ලැබේද කියන එක. මේ ගැන අපිට ලොකු සැකයක් තියෙනවා. අපිට කිසිදු බලාපොරොත්තුවක් නැහැ. ඔබතුමා හැම වර්ෂයකම මුදලක් වැඩි කරමින් සභාවේ සත්‍ය ආදායම විකෘත්ති කරලා විශාල මුදලක් පෙන්නලා අපිව මෝඩයට පත් කරන්නද නැත්නම් මොරටුව ජනතාව මෝඩයට පත් කරන්නද කියන එක සම්බන්ධව ලොකු ප්‍රශ්ණයක් තියෙනවා. ඒකයි අපි කියන්නේ මේ අයවැය ලේඛණයේ කිසිම හරයක් ගුණයක් ඵලදායි තාවයක් නැති නිර්මාණශීලිත්වයක් නැති අයවැයක් කියන එක.ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි මේ මුදල මීට වඩා ඵලදායි ව්‍යාපෘති වලට ලබාගෙන මුදල් උත්පාදනය කරන්න පුලුවන්.

ගරු නගරාධිපතිතුමනි, අපිට පේන එක ව්‍යාපෘතියක් පිටු අංක 23 අය ශීර්ෂය 7101 යටතේ මිලියන 650 ක් ඔබතුමා ගන්නවා කසල කළමනාකරන ව්‍යාපෘතියට. මේක අපි සාධනිය ලෙස දකිනවා. කසල ව්‍යාපෘතියක් යම්කිසි මට්ටමකට සාධනීය ලෙස ක්‍රියාත්මක වෙනවයි කියන එක බලාපොරොත්තුවක් තියෙනවා. මේකෙන් මුදලක් උත්පාදනය වෙනවා. ගරු නගරාධිපතිතුමනි, රංගශාලාව අපිට මේක අවශ්‍යයි. මොරටුවේ ඉන්න කලාකරුවන්ට එවැනි ලොකු වපසරියක් ඇති තාක්ෂණයෙන් දියුනු ස්ථානයක් අවශ්‍යයි. අපේ යහපාලන කාලය තුලත් අපි උත්සහ කලා. අවශ්‍ය වන මුලික කටයුතු අවසන් කලා රංගශාලාවක් සඳහා. නමුත් මේ ආර්ථික ව්‍යාකූල තත්වය තුල මෙවැනි ණය මුදලක් අරගෙන සභාව සමහර විට ඔබතුමා ඉදිරියේදි මේ සභාවේ නොසිටින්න පුලුවන්. පසුව පත්වෙන නගරාධිපතිතිතුමා කොහොමද මෙය කරගෙන යන්නේ.ඔබතුමා මේ ගැන වඩාත් සැලකිලිමත් වෙන්න ඕන සභාවේ අනාගතය අවදානමකට ලක් කරන්න එපා කියන එක මේ වෙලාවේදි පෙන්නලා දෙනවා. ඒවගේම ගිය වසර පුරාවටම අපිට ඔබතුමාට හැකියාවක් ලැබිලා නැහැ පුනරාවර්තන ආදායම එකතු කර ගන්න. 2019 ට ගියොත් පුනරාවර්තනය ආදායම

89% යි. එතන කැපිටල් එක එන්කම් ඇක්චුවල් එකක් නැහැ ප්‍රාග්ධන ඇස්තමේන්තුව තියෙනවා මිලියන 165 ක් එතකොට 0% යි.ඔබතුමා 2020ට යන්න මිලියන 1001 ක් ඔබතුමා බජට් කරනවා. එතනින් ලබාගන්නේ මිලියන 763 යි. 76% ඒවගේම මේ වසරේ මේ වෙනකොට මිලියන 1019 ක් බජට් කරපු මේ වසරේ පුනරාවර්තන ආදායම තාම ලැබිලා තියෙන්නේ 68% මෙහෙම බැලුවම මේ වසර පුරාවටම ඔබතුමාට හැකිවෙලා තියෙන්නේ 75% එකතු කරන්න. 25% ක් අඩුවෙනකොට ඔබතුමාට වෙනවා ජනතාවාදි සේවාවන් අමතක කරන්න. ජනතාවට කරන්න ඕන සෞඛ්‍ය වියදම මේවා කපාහැරලා අයවැය පරතරය බැලන්ස් කර ගන්න. අපි දැකපු සැම අයවැය ලේඛණයකම කාරණාව අවසානයකදි වෙන්නේ ජනතාවට ලබාදිය යුතු සේවාවන් ටික සම්පූර්ණයෙන්ම මග හැරලා දාන එක. ඒක පෙන්නලා දෙන්නම් පිටු අංක 08 පුනරාවර්තන වැඩ සටහන් යටතේ මේ වසරේ ඇස්තමේන්තුව මිලියන 620 යි. පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා 76% යි ලැබිලා තියෙන්නේ. සේවා හා බදු මිලියන 239 යි ලැබිලා තියෙන්නේ 142 යි. සෞඛ්‍ය සේවා මිලියන 41 යි වියදම් කරලා තියෙන්නේ එකතුව 12% යි.මිලියන 5 ගිය වර්ෂ දෙක තුලත් අයවැය ලේඛණ වල ඉලක්ක සපුරා ගන්න හැකියාව ලැබිලා නැහැ. ආදායම එකතුකර ගැනීමට නොහැකියාව නිසා පිටු අංක 46 හි 1210 වෛද්‍ය සැපයුම් පශු වෛද්‍ය සැපයුම් ඇස්තමේන්තුව ලක්ෂ 2 වියදම් කරලා තියෙන්නේ රු.82000 යි. සුණඛ වන්ධ්‍යාකරණය ඇස්තමේන්තුව ලක්ෂ 7 යි වියදම් කරලා තියෙන්නේ රු.456598යි මේ වෙනකොට.පිටු අංක 48හි වෛද්‍ය සැපයුම් ආයුර්වේද මිලියන 3.6 යි. මේ වෙනකොට වියදම් කරලා තියෙන්නේ1.75.පිටු අංක 50 හි රෝග නිවාරණය රසායනාගාර සේවය මිලියනයක් වෙන් කරලා තිබුනට වියදම් කරලා තියෙන්නේ 118284 පිටු අංක 54හි 1500 සමාජසේවා ගෙවීම් ගර්භනී මවුවරුන්ට කිරි පැකට් ලබාදීම ලක්ෂ 5 ක් වෙන් කරලා තියෙනවා වියදම් කරලා තියෙනවා රු.60992 පිටු අංක 58 1307 ආදාහනාගාර යන්ත්‍රසූත්‍ර අලුත්වැඩියාව මිලියන 2ක් වෙන් කරලා තියෙනවා. මේ වෙනකොට වියදම් කරලා තියෙන්නේ රු.397110 ජනතාවට ලබා දිය යුතු සේවාවන් විශාල ප්‍රමාණයක් ඔබතුමා අතපසු කරලා තියෙනවා. මම කලින් පෙන්නා දිපු කාරනා තමයි මේකට බලපාන්නේ. පුනරාවර්තන ආදායම යටතේ අපිට ලැබෙන බදු මුදල් ටික එකතු කර ගන්න බැරිවුනාම ඒ ආදායම අපිට අහිමි වෙනකොට අපිට වෙනවා නිරන්තරයෙන්ම මේවා කප්පාදු කිරිමක් කරන්න අපිට මේ ලේකණයේ ලොකු ආදායමක් පෙන්නනවා කරන්ටි ඉන්කම් එක යටතේ ඒක ලැබෙන්නේ නැහැ. නැවත පුනරාවර්තන ආදායම යටතේ එතන ලැබෙන ආදායම අපිට තියෙනවා. මේ මුදල අනිවාර්යෙන්ම සේවක පඩිනඩි අපි ගෙවන්න ඕනෑ කාර්යාල නඩත්තු කරන්න ඕනෑ ඒවා කප්පාදු කරන්න බැහැ. එහෙම කලේත් අපිට ලොකු ප්‍රශ්ණයක් ඇති වෙනවා. එම නිසා ඔබතුමා යනවා සමාජයට මොරටුව බදු ගෙවන ජනතාවට කරන්න තියෙන සේවාවන් ටික අහිමි කරනවා. මේක තමයි මේ නගර සභා පරිශ්‍රයෙන් එලියේ ජනතාවගේ තියෙන අදෝනාව.

ගරු නගරාධිපතිතුමනි.මොරටුවේ තියෙන ක්‍රීඩා පිටි, ඒවගේම පෙර පාසැල්, වෙළඳ සැල් , කඩ කාමර මේවා වල විශාල වශයෙන් යටිතල ප්‍රශ්ණ තියෙනවා, සේවකයන්ගේ ප්‍රශ්ණ තියෙනවා අපි ගියොත් ක්‍රීඩාංගනයක් බලන්න එතන

මුරකරුවා නැහැ ඒවා තමයි පරිපාලන ප්‍රශ්ණ නමුත් විශාල මුදලක් අපි ගෙවනවා සේවක පඩිනඩි සඳහා. අපි අතිකාල සේවාවට විශාල මුදලක් වෙන් කරනවා. මේකයි තියෙන කඩා වැටීම . මෙතෙන හුදෙක්ම පරිපාලනමය ප්‍රශ්ණයක්, කළමනාකරණයේ ප්‍රශ්ණයක් තියෙනවා කියන එක ඔබතුමාට පෙන්නලා දෙන්න ඕන. මේක තමයි මේ අයවැයේ පෙන්නලා දෙන එකම කාරණාව. අපේ ජාත්‍යන්තර ක්‍රීඩාංගනය මොකද වෙලා තියෙන්නේ. අපිට වහල තාම හදාගන්න බැරි වෙලා තියෙනවා. මහජන ක්‍රීඩාංගන 11 ක් තියෙනවා. මේ හැම මහජන ක්‍රීඩාංගනයක් ලහට අපි ගියොත් විශාල වශයෙන් ප්‍රශ්ණ ගණනාවක් තියෙනවා. ක්‍රීඩා පිටිවල, ක්‍රීඩාගාර වල, ඒ අසල තියෙන ළමා ක්‍රීඩාංගන, සිගිති ක්‍රීඩාංගනය වල් බිහි වෙලා අපිට ඇසින් දකින්නට පුලුවන් ප්‍රායෝගික දේවල් ගරු නගරාධිපතිතුමනි. ඒවගේම වෛද්‍ය රසායනාගාරය. අද රසායනාගාරයක් පවත්වන එක හෙඳ වැඩ පිලිවෙලක් නමුත් මේකට අවශ්‍ය කරන තාක්ෂණය පවත්වාගෙන යන යන්ත්‍ර උපකරණ, රසායනික ද්‍රව්‍ය අද එතන නැහැ කියන එක ප්‍රකාශ කරන්න ඕන. ඒවගේම සුසානභූමි අද බලන්න ඒවට ගියාම ඒවා නඩත්තු කරන්න මුදල් වැය වෙලා නැහැ. සමහර වෙලාවට ආදාහනාගාරය වැඩ කරන්නේ නැහැ. සේවක ප්‍රශ්ණ තියෙනවා. පරිපාලන දුර්වල කම් මේ හැම ස්ථානයකට තියෙනවා කියන එකත් පෙන්නලා දෙන්න ඕන. ඒවගේම ප්‍රජාශාලා 20 ක් තියෙනවා ඒවා නඩත්තු වෙන්නේ නැහැ. ඒ භූමි අපේ ගෙඩනැගිලි තියෙනවා නම් නටබුන් වෙලා ඒවා. සමහර තැන්වල හිස් බීම් විතරයි තියෙන්නේ. මේ භූමි ටික අපි ප්‍රායෝගිකව හොඳ වැඩ පිලිවෙලක් යටතේ අපේ දරුවන්ට නැත්නම් අපේ සමාජයේ ග්‍රාමසේවා මහත්වරුන්ට මොකක් හරි කාර්යාලයක් ගොඩනගලා අපිට ආදායමක් උත්පාදනය කර ගන්නා හැකි යම් කිසි සේවාවක් පවත්වාගෙන යන්නට ඔබතුමා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.නාලනී ප්‍රේමවති පුනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, 2022 අයවැය යෝජනාව ඉදිරිපත් කරන මොහොතේ මේ මාගේ 9 වැනි අයවැය කතාව. මෙම සභාවට මම මේ වසර 4 ඉදිරිපත් වූ මොහොතේ පටන් කියන්න තියෙනවා කායනාවක් මීට ඉහත කතාවක් මගේ සහෝදරයාත් ඒවගේම මගේ පුතා නදීෂ් කුමාරත් සභාව නියෝජනය කරා.ඒ කාලය තුලදි වත් මම නොදුටපු, නොදැකපු සංවර්ධනයක් මෙම කාල සිමාව තුල ඔබතුමා අතින් සිදුවුනා කීම වැරදි නැහැ. මම දකිනවා මොරටුව ජනතාව තුල ඔබතුමාගේ මේ සංවර්ධන වැඩ පිලිවෙල පිලිබඳව ගත්තොත් ඉතාමත්ම සෑහීමකට පත්වෙලා තියෙනවා. ඇත්තටම 2021 අයවැයදි කසල කලමනාකරනය ඒවාගෙම ඩෙංගු මර්ධන ව්‍යාපාරය, කොරෝනා වසංගතය වැනි භයානක උවදුරු ජීවිතවලට හානි කරන මේ කටයුතු වලදි ඔබතුමා අතින් විශාල මෙහෙවරක් සිදු වුනා. අගුලාන ප්‍රදේශය කියන්නේ බොහොම දුප්පත් ජනතාවක් ඉන්න ප්‍රදේශයක්. මේ ප්‍රදේශය තුල කොරෝනා වසංගතය, ඩෙංගු මර්ධන ව්‍යාපාර ඒ වෙනුවෙන් ඔබතුමා ඉතා ඉහලින් කටයුතු කලා. මට කියන්න ඕන ඒ වසර කිහිපය තුල ඔබතුමා විශාල අත්දැකීම් රාශියක් ඔබතුමා විසින්ම ඉටු කරලා දිලා මහජනතාවගේ ප්‍රසාදයට ලක්වෙලා

තියෙනවා.එහෙම නැත්නම් ඔබතුමා මේ වසර 15 ක් නගරාධිපතිවරයෙක් හැටියට කටයුතු කරන්න වරම් ලැබෙන්නේ නැහැ. මම කියන්න කැමතියි මම හිටපු කාලය තුලට වඩා මේ මොරටුව තුල ඉතාමත්ම සංවර්ධන කටයුතු විශාල වශයෙන් සිදුවුනා කියලා. මෙම සංවර්ධන වැඩ පිලිවෙලදි ජනතාවගේ ප්‍රසාදයට ලක්වීම හේතුවෙන් ඒ කටයුතු තවත් ඉදිරියට කරගෙන යාමට ඔබතුමාට ශක්තිය ලැබෙනවා 2022 වර්ෂයට ඔබතුමා ඉදිරිපත් කරලා තියෙනවා කාබනික අපද්‍රව්‍ය ආශ්‍රිතව කොම්පොස්ට් පොහොර ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට, ඒවගේම බ්ලොග් ගල් සහ වෙනත් ගොඩනැගිලි මාර්ග ඉදිකිරීම අමු ද්‍රව්‍ය නිපදවීමේ වැඩ කොටස් ආරම්භ කිරීමට ඔබතුමා සැලසුම් සකස් කරලා තියෙනවා. සෞඛ්‍ය ගැටලු පහසුවෙන් නිරාකරණය කර ගැනීමට එය භාවිතා කිරීමට නගර සභාවේම ගොඩනැගිල්ලක නිරෝධාන සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට ඔබතුමා සැලසුම් කරලා තියෙනවා. ඒවගේම 2022 තුල සංවර්ධන කටයුතු රාශියක් කරන්නට ඔබතුමා මෙයින් නිර්දේශ කරලා තියෙනවා. ඇත්තටම අපිට සතුටුයි අපේ ජනතාව ඉතාමත්ම ගෞරවයෙන් ඔබතුමාව අදහනවා මොකද එතුමන්ලාට අවශ්‍ය කරන සහයෝගය ලබා දිලා තියෙනවා. සංවර්ධන කටයුතු කාණු පද්ධති, පාරවල් සකස් කර දිමට ඔබතුමා විශාල මුදල් වැය කරලා තියෙනවා. මේ ආදි වශයෙන් ඔබතුමාට ඉදිරියේදි 2021 වර්ෂයේ වැඩ කොටස් කලා වගේම 2022 වැඩ කොටස කරන්නට සුභ සාධන කටයුතු පුලුල් කරන්නට අප සියලු දෙනාගේම සහයෝගය ලබාදෙන බව මේ අවස්ථාවේදි මතක් කරමින් 2022 අයවැයට සුභ පතමින් මා නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.සුරංග එන් අපොන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2022 අයවැය ඉදිරිපත් කිරීම සඳහා නොකඩවා වසර 19 ක් තුල කතා කලා සේම මොරටුව මහ නගර සභාවේ 2022 අයවැය වාර්තාව සම්බන්ධයෙන්ද මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. අපි මොරටුවේ ජනතාව වෙනුවෙන් දැවැන්ත කාර්යභාරයක් මොරටු මහනගර සභාව මගින් ඉටු කරනවා. මොරටුව ජනතාවගේ ව්‍යසන අවස්ථාවක සිට ජනතාවගේ සුභසිද්ධිය සඳහා කරන්නාවූ ක්‍රියාදාමයන් මොරටු මහ නගර සභාවෙන් අඛණ්ඩ මෙහෙවරක් ඉටු කරනවා. ඒ විතරක් නොවෙයි මම කර්මාන්ත කමිටුවේ සභාපතිවරයා වශයෙන් 2021 වර්ෂයේ මිලියන 189 ක කාර්යභාරයක් කරන්න හැකි වුන බව සභාපතිවරයා වශයෙන් මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

ගරු නගරාධිපතිතුමනි, දේශපාලන කෝණයෙන් කවුරු කොහෙම කිව්වත් අපි මොරටුවේ ජනතාවගේ සුභ සිද්ධිය සඳහා දැවැන්ත මෙහෙවරක් ඉදිරිපත් කරලා තියෙනවා. දේශපාලන කෝණයෙන් අපිට බලන්න පුලුවන් නමුත් අපි ක්‍රියාදාමය තුලින් එකම අරමුණක් තමයි ක්‍රියාත්මක වෙන්නේ. තම තමන්ගේ දේශපාලන න්‍යායන් ක්‍රියාත්මක වෙන්න පුලුවන් නමුත් ජනතාවගේ අභිලාශය එකම අරමුණක්

වශයෙන් ක්‍රියාවට නැංවීමේදි සියලු ජනතාව සුභ සිද්ධියට හා පැසසුමට ලක්වෙනවා. ගරු නගරාධිපතිතුමනි මොරටුව ජනතාවගේ දැවැන්ත ප්‍රශ්ණයක් නිර්මාණය වූ මොහොතේ රෝගී ව්‍යසනයක් වශයෙන් ව්‍යාප්ත වූ මොහොතේ මොරටුව බල ප්‍රදේශයේ ජීවත් වන්නාවූ එම ව්‍යසනයට ලක් වූ ජනතාවට නගර සභාවේ පාලනය තුලින් නොකඩවාම තමන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට ප්‍රතිකාර ලබාගැනීමේ සිට පීසීආර් කිරීම දක්වා නොකඩවා ඒ දැවැන්ත මෙහෙවර ඉටුකලා. අපගේ නගර සභා බලප්‍රදේශයේහි වෙනත් බල ප්‍රදේශයන් වලත් කොවිඩ් මෘතදේහයන් ආදාහනය කිරීමේදි නගර සභාව නොබියව ඉදිරිපත් වෙලා ඒ ක්‍රියාදාමය ඉටු කරලා දැවැන්ත කාර්ය භාරයක් කලා. එහෙම නම් ගරු නගරාධිපතිතුමනි අපේ මොරටුවේ ජනතාව ගොඩනැංවීම සඳහා මොරටුවේ නායකත්වයේ සංඛේතය වශයෙන් ගරු ඔබතුමා මොරටුවේ ජනතාවට විශාල කාර්යභාරයක් කරන්න 2022 වර්ෂයේ අයවැය ඉදිරිපත් කරලා තියෙනවා. අපි දන්නවා අපගේ ඉලක්කයන් සපුරා ගැනීමට ඉලක්ක ලඟා කර ගැනීමේ හැකියාවෙන් 100% ක්ම අපගේ බලාපොරොත්තු ඉටුකර ගැනීමට නොහැකි වෙන්න පුලුවන්. නමුත් අපේ ඉලක්කය සපුරා ගැනීමට ඔබතුමාට හැකියාව තියෙනවා. මොරටුවේ නිවාස සංකීර්ණයක් ඉදිකිරීමට යෝජනා කරලා තියෙනවා නමුත් අපගේ එම පරමාර්ථය තුලින් ඔබගේ නායකත්වය තුලින් මොරටුවේ ජනතාවට මොන පාලකයෙක් නායකයෙක් බිහි වුනත් එතුමාට නොබියව තමන්ගේ නායකත්වය ඉදිරියට ගෙනල්ලා ඒ කටයුතු කරන්නට පුලුවන් ශක්තියක් අඩිතාලමක් ඔබතුමා නිර්මාණය කරලා තියෙනවා. දේශපාලඥයන්ට කියන්න පුලුවන් මේ අයවැය පුස්සක් කියලා ඉලක්කයක් තියෙන නායකයෙකුට තමන්ගේ අභිලාශය ඉදිරිපත් කරලා තමන්ගේ නායකත්වය වර්ධනය කර ගන්න පුලුවන්.

ගරු නගරාධිපතිතුමනි,අද විපක්ෂය දොඩවනවා අද විශේෂයෙන්ම කාන්තා හිංසනය ගැන ගරු නගරාධිපතිතුමනි,කාන්තා හිංසනය ගැන කථා කරන මිනිස්සු තමයි කාන්තා හිංසනයට ලක් වෙන්නේ. මම වගකීමෙන් කියන්නේ.මහජන නියෝජිතයෙකුගේ ගේකට ගිහිල්ලා තමන්ගේ ප්‍රතිලාභියකුට යම් උපදෙසක් උපකාරයක් ගන්න බැරි මහජන නියෝජිතයෝ ඉන්නවා. නමුත් එතුමන්ලා මහජන නියෝජිතයින් වශයෙන් ඉදිරිපත් වෙලා කාන්තා හිංසනය ගැන තමයි කථා කරන්නේ. මම නම් ගම් කියන්න කැමති නැහැ. කාන්තා හිංසනයට එතුමන්ලාගේ දායකත්වය තමයි වැඩියෙන් තියෙන්නේ. එහෙම නම් ගරු නගරාධිපතිතුමනි මොරටුවේ මහජන නියෝජිතයෝ එකා මෙන් එකට එක්වෙලා දේශපාලන අරමුණු තියෙන්න පුලුවන්, දේශපාලන බලාපොරොත්තු තියෙන්න පුලුවන්, නමුත් අපි සියලු දෙනාම මොරටුවේ ජීවත් වන ජනතාවගේ අභිලාෂය ඉටු කරන්න තමයි. මහජන නියෝජිතයෝ වශයෙන් අපි සේවය කරන්න ඕන. නමුත් අපි මේ ඉදිරිපත් වෙන්නාවූ 2022 අයවැයට අපගේ නායක ගරු ඔබතුමා ඉදිරිපත් වෙලා 2022 වර්ෂයට ගමේ ව්‍යසනයත් එක්කම නිර්මානය වූ ජනතාවගේ ජීවනෝපාය අහිමිවීම සම්බන්ධයෙන් සෑම ගමකම ජනතාවගේ ජීවනෝපය නැංවීම සඳහා ලක්ෂ 100 ක් ඔබතුමා වෙන්

කරලා තියෙනවා. සංවර්ධනයට නොවෙයි ජනතාවගේ ජීවනෝපාය නංවන්න සෑම ග්‍රාමසේවා වසමකටම වෙන් කරලා තියෙනවා. එහෙම නම් අපිට දේශපාලන අරමුණු තියෙන්න පුලුවන් අපි දේශපාලන පක්ෂ භේදයකින් තොරව තමයි ගමේ ජීවත්වෙන්නාවූ ජීවනෝපාය නංවා පුද්ගලයින් නගා සිටුවන්න අඩිතාලම දමා තියෙන්නේ. සෑම ග්‍රාමසේවා වසමකටම ලක්ෂ 100 ක් දෙනවා කියන්නේ ඔබතුමාගේ නායකත්වය තුලින් ඔබතුමාගේ කොටඨාශයේ 40 ක් දිලා තියෙනවා. අපේ නායකතුමාගේ මාර්ගයෙන් ඉතිරි ටික සංවර්ධනය කරනවා. එමනිසා අපි දැවැන්ත සංවර්ධනයක් යෝජනා කරලා තියෙනවා 2022 වර්ෂයට. ගරු නගරාධිපතිතුමනි, දේශපාලන අරමුණු තියෙන්න පුලුවන්

නමුත් ගමේ ජනතාවගේ අරමුණ නිර්මාණය වෙන්නේ මහජන නියෝජිතයාගේ පක්ෂ පාඨ කුමක් වුවත් අපගේ බලාපොරොත්තුව ගමේ ජනතාව නංවංන නම් පාඨ පක්ෂ භේදය අමතක කරලා අපි සියලු දෙනා එක් වෙන්න ඕන. අපි ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම තුලින් 69 ලක්ෂයකගේ බලාපොරොත්තුව මොරටුවේ නායකයා වශයෙන් අපිට ඔබතුමාගේ නායකත්වයෙන් අපිට ඒ ශක්තිය තුලින් අපිට කර ගන්න පුලුවන්. අද නගරාධිපතිතුමනි, මොන මොන බලවේග ආවත් මොන මොන කුමන්ත්‍රණ කෙරුවත් අපගේ ඉදිරි ඉලක්කය සපුරා ගැනිමට මේ ඉදිරිපත් වෙන්නාවූ අයවැය සම්බන්ධයෙන් මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඒවගේම අපගේ ඉලක්කය සපුරා ගැනිමට දායක වුන නිලධාරින්ට මේ සියලු දෙනාට ස්තුතිය පුද කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනි මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මොරටු පුරවරය කියන්නේ ක්‍රීඩාවට, කලාවට දිනෙන් දින දක්ෂයින් බිහිවෙන පුරවරයක්. එවැනි පුරවරයක ක්‍රීඩාවට දක්වන සහයෝගය වගේම මුදල ප්‍රතිපාදන වෙන්කිරීම සිදුවෙනවා. නමුත් දිනෙන් දින ක්‍රීඩාවටත්, කලාවටත් අතහිත දිමක් වෙනවා නම් හොඳයි කියලා හිතනවා. ගරු නගරාධිපතිතුමනි, කුඩා දරුවෙකු වුනත් ක්‍රීඩාවට යොමු වෙන්නේ ගෙදර මිදුලකින් පාසැලේ ක්‍රීඩා මිදුල පිටියකින්. නමුත් මා නියෝජනය කරන සොයිසා පුර කොට්ඨාශය තුල මිදුල කියන දෙය අඩුයි. ක්‍රීඩා පිටිය තමයි සියලුම දරුවන්ට, ක්‍රීඩකයින්ට ක්‍රීඩා කරන්නට ඇති එකම ස්ථානය වෙලා තියෙන්නේ. මේ කොරෝනා වසන්ගතයත් සමග සොයිසා පුර ක්‍රීඩා පිටිය ඒ ප්‍රතිසංස්කරණ කටයුතු ඉබි ගමනකින් යන තත්වයක් තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, ඒ ක්‍රීඩාපිටිය වල් බිහිවෙලා මේ වෙනකොට ප්‍රතිසංස්කරණය වෙමින් තියෙනවා නමුත් ජනතාවට ඒ ප්‍රතිලාභ ලබාගැනිමට අවස්ථාවක් නැහැ. ඉල්ලිමක් කරනවා හැකි ඉක්මනින් ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරනය කරලා ඒ ප්‍රතිලාභ ජනතාවට ලබාගැනිමට

අවස්ථාව උදාකරලා දෙන්න කියලා. ඒවාගේම කලාවට ක්‍රීඩාවට ලැදි නගරාධිපතිවරයෙක් ඔබතුමා. ඒවගේම කලා කරුවන් සිටිනවා කිසිම ආදායමක් නැති තත්වයට පත්වෙන කවුරුත් නොදන්න කලා කරුවන් ඉන්නවා සැගවිලා වගේ. ඒ අය පිලිබඳව සොයා බලලා ඒ අයටත් යම් කිසි සහනයක් සලසා දෙනවා නම් හොඳයි. ක්‍රීඩා සමිති තියෙනවා බෝලයක් බැට් එකක් නැති තත්වයකට පත් වෙලා තියෙන. ඒ අය ගැන සොයා බලා අතහිත දිමක් කරනවා නම් තව තවත් දියුනුවෙන් දියුනුවට මේ ක්‍රීඩාවත් කලාවත් පත්වෙනවා කියලා විශ්වාස කරනවා.

ගරු නගරාධිපතිතුමනි, සොයිසා ක්‍රීඩාංගනය වගෙ මුලු මොරටුව පුරා විසිරි තිබෙන ක්‍රීඩාංගන ඒ සියලුම ක්‍රීඩාංගන වැඩි දියුනුවට පත් කරලා, ක්‍රීඩාවට අතහිත දිලා, දරුවන් තරුණයින් ක්‍රීඩාවට යොමු කරනවා නම් ඉදිරියේදි මේ මොරටු පුරවරය තව තවත් ජයග්‍රහණයන් කරා ලඟා විමට හැකියි කියලා විශ්වාස කරනවා. මන්ත්‍රීවරියක් පැවසුවා මේ නගර සභාව තුලත් කාන්තා හිංසනය පවතිනවා කියලා. ගරු ගරාධිපතිතුමනි එවැනි දෙයක් තිබෙනවා නම් විශේෂයෙන් ඒ පිලිබඳව සොයා බලලා එයට පිලියමක් යොදන ලෙස කාන්තා මන්ත්‍රීවරියක් ලෙස ඉල්ලා සිටිනවා. ඒවගේම ඉදිරියේදි 2022 වර්ෂය ක්‍රීඩාවත් කලාවත් වැඩිදියුනු වූ මේ පුරවරයේ දක්ෂයින් බිහිවෙලා මොරටුවට කිර්තිය අත්පත් කරදෙන වැඩ සටහන් දියත් කරලා මුදල් ප්‍රතිපාදන වැඩිපුර ලබාගෙන මේ සිදු කරන දේ ප්‍රමාණවත් නමුත් තව තවත් ක්‍රීඩාවට කලාවට මුදල් යොදවන ලෙස ඉල්ලා සිටිනවා. 2022 සාර්ථක වසරක් වී ජනතාවට ඉතාමත් වැඩදායි සුභදායි වැඩකටයුතු ඉෂ්ට වෙයි කියලා විශ්වාස කරමින් නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,2022 අයවැය යෝජනාවට සම්බන්ධ විමට මට ලැබිම පිලිබඳව මුලින්ම කටුකුරුන්ද ජනතාවට මාගේ විශේෂ ස්තුතිය මේ අවස්ථාවේදි පුදකර සිටිනවා. ඒවගේම ගරු නගරාධිපතිතුමනි අයවැය කතාවට ප්‍රථම මට පොඩි ඉල්ලිමක් කරන්න තියෙනවා පිටුපස සිටින මාධ්‍යවේදින්ට අපි යම් දෙයක් සාකච්ජා කරලා විසදාගන්න කොට ඇත්තටම අපි කථා කරන දේ අපහසුයි. එතුමියට කියන්න වෙනවා යන කථාව ඇහෙන්නේ නැහැ කියලා එම නිසා මාධ්‍යවේදින්ට සුදුසු තැනක් ලබා දෙන්න කියලා මා ඉල්ලිමක් කරනවා. ගරු නගරාධිපතිතුමනි 2022 අයවැය සම්බන්ධව කථා කරනකොට 2018 මහ නගර සභාව ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ ඔබතුමාගේ නායකත්වයෙන් අපි ලබා ගනිද්දි ශක්තිමත් නගරාධිපතිවරයෙක්

ශක්තිමත් මන්ත්‍රීවරු පිරිසක් සම්බන්ධ වෙලා ඉන්නකොට සෞභාග්‍ය දැක්ම නැමති ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරලා රජයක් පිහිටුවාගෙන දුර දැක්ම තියෙන ජනාධිපතිවරයෙක් හොඳ මන්ත්‍රී මණ්ඩලයක් යටතේ රට පාලනය කිරීමට ලැබීම සම්බන්ධව ශ්‍රී ලංකාවාසී ජනතාව මුලින්ම වාසනාවන්ත වෙන්න ඕනෑ. පසු ගිය කාලයේ ඇති වුන කොවිඩ් 19 වසංගතයට හොඳ තින්දු තීරණ අරගෙන ජනතාවගේ මරණ සීඝ්‍රයෙන් වැඩිවීම වෙනකොට එම අවස්ථාවට හොඳ තීන්දු තිරණ අරගෙන නිසි එන්නත් කරනයක් කරලා රටේ ජනතාවගේ ජීවිත බේරාගෙන අද රට සාමාන්‍ය තත්වයකට ගෙනවා. පලමුවෙන්ම ජනාධිපතිතුමා ඇතුලු කැබිනට් මණ්ඩලය ඇතුලු රජයට මම ස්තුතිවන්ත වෙනවා. ඒවගේම මොරටු ජනතාව වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා නොබියව මන්ත්‍රී මණ්ඩලයත් එක්ක සාකච්ඡා කරලා කොවිඩ් ව්‍යසනයට ඔබතුමාට පුලුවන් ශක්තිමත් ප්‍රතිකර්මයක් කරන්න ලැබීම පිලිබඳව. ඒවගේම අයවැය යෝජනාවේ තියෙනවා ඔබතුමා විසින් සෞඛ්‍ය නිලධාරියෙක් අනුයුක්ත කර ගැනීම ස්ථීර වැඩපිලිවෙලක් අවශ්‍යයි කියලා. ඒවගේම වරලත් ඉංජිනේරු වරයෙක් බඳවා ගැනීම අවශ්‍යයි අපේ 2022 අයවැය වැඩ සටහන් සම්බන්ධව වැඩ කරගෙන යන්න පහසුයි කියලා. ඒකට මම ඔබතුමාට සුභ පතනවා. ඒ වගේ අවශ්‍ය වෙලාවට අවශ්‍ය දේ අරගෙන ඉදිරි කටයුතු කරගෙන යන්න ගන්න තින්දු තිරන අපිත් සමග සාකච්ඡා කරලා මේ විදියට කරගෙන යන්න කියලා අපි සියලු දෙනාට ශක්තියත් ධෛර්යත් දෙනවා. මම නගර සභා මන්ත්‍රීවරයෙක් ලෙස පත්වෙලා මේ වසර 3 ඇතුලත මගේ ප්‍රදේශයේ අවුරුදු 25-30 ක් කරගන්න බැරි වෙච්ච පාරවල් වල තිබුන වතුර කාණු සියල්ල සකස් කරලා අද ජනතාවට පාරේ ගමන් කරන්න පුලුවන් තත්වයට පත් වෙලා තියෙනවා මම පත්වෙන කාලේ ධර්මබන්දු මාවත, සාගර පටුමග, ලකී සෙවන් වැනි පාරවල් වල පාසැල් යන දරුවන්ව වඩාගෙන සපත්තු අතේ අරගෙන තමයි අරගෙන ගියේ. දැන් ඒ කිසිවක් නැතිව ළමයින්ට පාසැල් යන තත්වයට ඔබතුමා අපිට 2021 වසරේ සලසලා දුන්නා. ඒ වගේම මම කියන්න ඕන අපේ ශිරෝමී මන්ත්‍රිතුමිය කාන්තා හිංසනය පිලිබඳව කථා කලා. ඇත්තටම කාන්තා හිංසනයට විරුද්ධයි අපිත්. එතුමිය දන්නේ නැහැ අපේ පක්ෂයෙන් තමයි ලංකාවේ පලවෙනි අගමැතිතුමිය බිහිකලේ ඒවගේම කාන්තා ජනාධිපතිවරියක් බිහි කලේත් අපි.

ගරු නගරාධිපතිතුමනි 2022 අයවැය යෝජනාවලියේ තියෙනවා කැඩුනු ටයිල්,පිගන්, වලං ඒවා එකතු කරලා යම් කර්මාන්තයක් කරනවා කියලා. ඒ මගින් අපිට තවත් රැකියා බිහි කිරීමේ අවස්ථාවක් එතනදි ලැබෙනවා. මේ වගේ දුරදක්නා නුවනින් ඔබතුමා කරගෙන යන මේ වැඩ පිලිවෙලට මාගේ මාගේ පූර්ණ සහයෝගය ලබා දෙමින් කටුකුරුන්ද ජනතාවත් එක්ක ඔබතුමාගේ ඉදිරි ගමණට එකතු වෙනවා අයවැයට පක්ෂපාතිව ජන්දය ලබා දෙනවා කියමින් මා නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එස්.ඛෙසර රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, රාවතාවත්ත සහ කුඩුවාමුල්ල ජනතාව පත්කරල මට සහ සමස්ත මොරටු ජනතාවට නායකත්වය දෙන පෙර පුරුද්ද ,පලපුරුද්ද දැක පුරුද්ද ආදි ගුණාංග වලින් පරිපූර්න නගරාධිපතිතුමනි.මම හිතන්නේ මොරටු ජනතාව හැටියට ඔබතුමාගේ තිබෙන දක්ෂතාතුලින්, ඵලදායිතා කමිටුව නියෝජනය කරන සභාපතිවරයා හැටියටත්, මොරටු මහ නගර සභාවේ ඵලදායිතාවය වෙනුවෙන් ඔබතුමා ලබාදුන් නායකත්වය ගැන යමක් කිවයුතු මයි මේ අවස්ථාවේ. කාලයක පටන් අඩුපාඩුවක් තිබුන අන්තර්ජාලය හරහා ගෙවීම් කරන්නට තිබුන දෝෂ සියල්ලම මකා ගනිමින් ඔන්ලයින් තාක්ෂනය මගින් ගනුදෙනු කිරිමටත් ඒවගේම වරිපනම් ගෙවිම, ආදාහනාගාර වෙන් කිරිම මේ වසර තුල සම්පූර්ණ කරමින් ජනතා සේවය වෙනුවෙන් විශාල වැඩ කොටසක් කලා. ඒවගේම ආයතන මට්ටමින් අවශ්‍ය පරිසනක ලබා දෙමින් ඔවුන්ගේ තාක්ෂණික කටයුතුත් මනාව සිද්ධ කර ගැනිමට ඔබතුමාගේ මහ පෙන්විම යටතේ ඒ සියලු අවස්ථා ලබා දුන්නා ගරු නගරාධිපතිතුමනි අපි බොහොම කාලයක සිට දකින්නාවූ දෙයක් තමයි සම්ප්‍රදායිකව විපක්ෂය තුලින් හැමදාම සිදු කරන්නේ විවේචනය කිරිම පමණයි. මම කියන්න කැමතියි මහජන නියෝජිතයින් නියෝජනය කරන තැනක ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය කියනවට වඩා සුදුසුයි කියලා ශබ්ද කෝෂයට ඇතුල් කරනවා නම් ආණ්ඩු පක්ෂය සහ උප පාලක පක්ෂය විදියට පත් වෙනවා නම් මොකද මේගොල්ලෝ හැමදාම කරන්නේ ගරු නගරාධිපතිතුමනි රියෙල්ටි ෂෝ වල තියෙන සම්භාවිතාවක් තමයි අපි සභා තුල දකින්නේ. ගායකයා හෝ රංගකයා වේදිකාව තුල පුලුවන් තරම් නටනවා ඉදිරිපිට සිටින තීර්කයා විසින් අඩුපාඩු කියනවා. හැබැයි තීර්කයාට නිකං හරි නටන්න කිව්වොත් ඔහු නටන නැටුමකුත් නැහැ කියන පදයකුත් නැහැ. අන්න ඒ කාරණය තමයි හැමදාම විපක්ෂය විසින් දරන්නේ. අන්න ඒ තත්වය ගරු නගරාධිපතිතුමනි මහජන නියෝජිතයින් තුලින් පෙන්විය යුතුයි.

ගරු නගරාධිපතිතුමනි මට මතකයි 2021 අයවැය තුලදි අපේ විපක්ෂය එක්තරා පක්ෂයකින් කිවුවා කසල කලමනාකරනය සහ කසල ප්‍රතිචක්‍රිකරනය සඳහා යන දෙකම එකයි කියලා.ඒ එදා ඇතිවුන තර්කය ගරුනගරාධිපතිතුමනි ඔබතුමාගේ නායකත්වය අරගෙන අද කසල කලමනාකරණය තව තවත් ප්‍රචලිත කරමින් කසල ප්‍රතිචක්‍රිකරණය දක්වා මොරටුව මහ නගර සභාව පියනගලා තියෙනවා. කසල කලමනාකරණය ප්‍රතිචක්‍රිකරනයේදි ගරු නගරාධිපතිතුමනි ඒක බොහෝ විහිලුවක් වුනා බොහෝ අයට. අලුත් වැඩක් පටන් ගත්තා ඔක හෙට අනිද්ද ඉවරයි කියලා.

ඔබතුමා නායකත්වය අරගෙන මමත් හිටියා එදා ඔබතුමා එතන තිබුන කැලි කසල සියලුම දේවල් අතගාලා සේවකයෝ නැති වුනාම රාත්‍රී 12 විතර වෙනකම් වැඩ කලා. එහෙම වැඩ කරල ඒ ලබා දුන් ජවය ශක්තිය ඒ සේවකයන් තුල ඒ ශක්තිය, ජවය ලේ නහර තුල කිදා බැහැලා තියෙනවා. ඒක තමයි ඔවුන් අද ඉෂ්ඨ කරන්න. එවන් වූ සේවයක් ලබා දෙන ඔබතුමන්ට මෙහි ඇතුලේ සිටින ළිං මැඩියෝ වගේ විවිධ කථා කියමින් විවිධ දෝෂ නගනවා. ගරු නගරාධිපතිතුමනි, මට ඉන්නවා විදේශ ගත මිතුරන්,ඥාතින් ,හිතවතුන් ඔවුන් ඉතාමත් ගෞරවයෙන් කියන දෙයක් තමයි මොරටුව කියන්නේ අපිට ගෞරවයෙන් කථා කරන්න පුලුවන් ලෝකේ කොහේ හිටියත් ඔවුන් තුල තියෙනවා ලොකු අභිමාණයක් ඔබතුමා ලබාදෙන නායකත්වය වෙනුවෙන්. මේ තියෙන්නාවු නොයෙකුත් තර්ක-විතර්ක මැද්දේ ඔබතුමා ඉදිරිපත් කරන්නාවු 2022 වර්ෂය අයවැය කියන්නා කෙසේ කිවුවත් ඉතාමත් හොඳ අයවැයක්. ඔබතුමා 2021 අයවැය ඉදිරිපත් කලේ කොවිඩ් වසංගතය දැකලා නොවෙයි.ඒකේ තියෙන බැරෑරුම් කම දැකලා නොවෙයි. හැබැයි ඔබතුමා ඒකට නොබියව මුහුණ දුන්නා. තියෙන්නාවු සියලුම අභියෝග දිනුවා. අපිට විශ්වාසයක් තියෙනවා ඔබතුමාගේ ඒ පෙර පුරුද්ද ,පලපුරුද්ද ,දැක පුරුද්ද සංසාර පුරුද්ද ඔබතුමන්ගේ සියලු නායකත්වයන් වලට ඉතාමත් රුකුලක් වෙනවා. ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ නායකත්වය යටතේ අපට යන්න පුලුවන් දුර

ගමණක් , සුභවාදී ගමණක් තියෙනවා. මොරටු ජනතාව මේසා වෙනුවෙන් බොහෝ දෙනෙක් පෙළ ගැහෙනවා. අපේ පිරිස මෙතනට එකක් කියනවා මට මතකයි ගිය සභාවේදි නිලධාරින්ට දොස් කිවුවා තමන්ගේ යුතුකම් ඉටු කරන්නේ නැහැ ඔවුන්ගේ බදු මුදල් අය කරන්නේ නැහැ කියලා.අපේ මන්ත්‍රීවරුම ගමට ගිහිල්ලා කියනවා මෙච්චර වසංගතයක් මැද්දේ මොරටුව නගර සභාව ජනතාවගෙන් බදු එකතුකරගෙන යනවා කියලා. මේ වගේ දෙපැත්ත බෙදෙන කථාවල් කියලා මඩේ හිටවපු ඉන්න වගේ ඉන්න ඕන නැහැ. මහජන නියෝජිතයෙක් නම් අපි කරන්න ඕන යුතුකම මහජනතාව වෙනුවෙන් කල යුතුයි. ගරු නගරාධිපතිතුමනි, රාවතාවත්ත නැගෙනහිර සහ කුඩුවාමුල්ල ජනතාව වෙනුවෙන් 22 ඉදිරිපත් කලා වූ අයවැයට අපි සියලු දෙනාගේ සුභාශිංසනය පුදකරමින් ඒ වගේම සමස්ත මොරටු ජනතාවගේ සුභාශිංසනය පුදකරමින් මා නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2022 අයවැය යෝජනා වෙනුවෙන් කතා කිරීමට අවස්ථාව ලැබීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. 66 වන පිටුවේ භෞතික සැලසුම් වියදම් යටතේ නගරාධිපතිතුමනි වර්ෂය සඳහා ලක්ෂ 400 ක මුදලක් ඇස්තමේන්තු කරලා

තියෙනවා. නමුත් 2021 වසරටත් එවැනිම මුදලක් ඇස්තමේන්තු කර තිබුනත් මොරටුව දකුණ ප්‍රදේශය බලනකොට මාර්ග වලින් විශාල ප්‍රමාණයක ජනතාවට ගමන් කිරීමට නොහැකි තත්වයට පත් වෙලා තියෙන්නෙ. අපි කොයි තරම් කථා කිව්වත් පහුගිය වැසි කාලයේදි කිසිම මාර්ගයක යන්න පුලුවන් හැකියාවක නමුත් අපිට තිබුනේ නැහැ. එක පැත්තකින් මුහුද අනිත් පැත්තෙන් ගඟ තියෙනවා. නමුත් කිසිම සැලැස්මකට මේ වෙනතුරුත් කිසිම මාර්ගයක් සකස් කරලා නැහැ. සෑම මාවතක්ම බලනකොට වැසි ජලයෙන් යටවෙලා මාර්ගයේ ගමන් කරන දරුවන් අපහසුතාවයන් වලට පත්වෙන්නේ. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි අපි ඉල්ලා සිටින්නේ මේ වගේ දේවල් කරනකොට හොයලා බලලා ක්‍රමානුකූලව මාර්ග නඩත්තු කරන්න. ඒ විතරක් නොවෙයි ජනතාවට රෙදි උස්සාගෙන යන්න වෙලා තියෙන්නේ කොන්ස්ටන් මාවත විතරක් නොවෙයි තවත් තැන් තියෙනවා. අවශ්‍ය නම් රූපරාමුත් පෙන්වන්නම්. නමුත් ලක්ෂ 400 ක් අපි වියදම් කරලා ජනතාවට ප්‍රතිලාභයක් ලැබෙන්නේ නැත්නම් මොකක්ද ඇති තේරුම. මේ අයවැයට මාගේ විරෝධතාවය පල කරමින් මා නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2022 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ඔබතුමාගේ 14 වනි අයවැය. නවක මන්ත්‍රීවරයෙක් විදියට උයන කොට්ඨාශය නියෝජනය කරමින් මම සහභාගි වන 4 වන අයවැය. උයන කොට්ඨාශයේ මහජන නියෝජිතයා වශයෙන් 2022 වර්ෂයේ ඔබතුමා ඉදිරිපත් කරන අයවැයට මාගේ ප්‍රසාදය ගෞරවය පලමුවෙන්ම පල කරනවා. විශේෂයෙන්ම ගරු නගරාධිපතිතුමනි අතීතයට ගියොත් 2018 දි මාර්තු 26 ව දින මා නවක මන්ත්‍රීවරයෙක් ලෙස පැමිණෙන අවස්ථාවේදි ඉතාමත්ම උද්යෝගිමත්ව ආණ්ඩු පක්ෂය විපක්ෂය මේ සභාවේ බලය පිහිටුවන්නේ කවුද සමහර අය රාත්‍රී හෝටල් වල ගත කරලා පහුවදා බස්රථ වල තමයි මෙතනට පැමිණියේ බොහොම උජාරුවෙන් අපි තමයි බලය පිහිටුවන්නේ කියලා. ගරු නගරාධිපතිතුමනි මේ වෙනකොට විපක්ෂයේ පුටු ටික සම්පූර්ණ කර ගන්න බැරි වෙන තරමට විපක්ෂය අද බිම වැටිලා තියෙනවා. ඒ තමයි ඔබතුමා 2018 සිට මේ අවුරුදු 4 තුල ගෙනාපු ඒ වැඩ පිලිවෙලේ සාර්ථකත්වය. අද විපක්ෂනායක කෙනෙක් නැහැ සංවිධායක කෙනෙක් නැහැ ඒ තරමට විපක්ෂය අද දුර්වල වෙලා. ගරු නගරාධිපතිතුමනි පසුගිය කාලය දෙස ආපසු හැරි බැලුවොත්විශේෂයෙන් උයන කොට්ඨාශයට උයන 4 පටුමග, 6 වෙනි පටුමග, 8 වෙනි පටුමග, ඔබතුමාගේ කාලය තුල අපිට කාපට් කරලා සංවර්ධනය කර ගන්න හැකියාව ලැබුනා. ඒ වගේම 4 වෙනි පටුමග, කාණු පද්ධතිය, ලුනාව බෝධිරාජා රාම විහාරස්ථාන අසල කාණුව, බෙකරි

වත්ත මාර්ය ආදි මාර්ග ඉතාමත්ම සංවර්ධන කටයුතු කරලා අපිට මේ තත්වයට ගන්න පුලුවන්කම ලැබුනා.

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ වැඩ පිලිවෙල තුල නිසි කලමනාකරණය තුල කසල ඉවත් කිරිම කාණු පද්ධති කලමනාකරනය කිරිම ආදි කටයුතු ඉතාමත් හොඳින් කර ගන්න පුලුවන්කම ලැබුනා. මම ඉඩම් කමිටුවේ සභාපතිවරයා විදියට ඉඩම් කමිටුව පසුගිය කාලය තුල අපි අත්පත් කර ගත්තු ප්‍රගතිය කියන්න ඕන. අපිට නගර සභාවට අයිති දේපල පිලිබඳව සොයා බැලිමේදි නගර සභාව සතු ඉඩම් කැබලි 812 ක ප්‍රමාණයක් අපි දැනට සොයාගෙන තියෙනවා. එයින් හිමිකම් සහතික අපිට 615 ක් මේ වෙනකොට අපිට ලැබිලා තියෙනවා. ඒ අතර ගරු නගරාධිපතිතුමනි, පොල් වත්ත, ජයගත්, දහම්පුර ආදි ක්‍රීඩාංගන ඒවගේම එගොඩඋයන සුසාන භූමිය කොටස, කොරළවැල්ල සුසාන භූමිය කොටස, අඟුලාන වාහන සේවා මධ්‍යස්ථානය, කිතලන්දලුව පෙර පාසැල් ඉඩම, කොරලවැල්ල ශ්‍රියා පෙදෙස ආයුර්වේද ඉඩම, කොරලවැල්ල විද්‍යාල මාවත ප්‍රජා ශාලාව සහ දන්ත රසායනාගාර පෙර පාසැල් ඉඩම, වීර පුරන්අප්පු ගම ප්‍රජාශාලාව සහ සතුටු උයන, කල්දමුල්ල ඊබට් පෙදෙස ප්‍රජා ශාලාව, මෝල්පේ මාතෘ සායන ගොඩනැගිල්ල මේ ආදි වශයෙන් අපි මේ දක්වා ඒවායේ හිමිකම් සහතික ලබාගෙන තියෙනවා. තව සති දෙකක් ඇතුලත ද සොයිසා ක්‍රීඩාංගනය හිමිකම් සහතික ලැබීමට තියෙනවා. ඒ වගේම නගර සභා සතු ඉඩම් වල දිර්ඝ කාලින පදිංචි කරුවන් වෙනුවෙන් ඔවුන්ට ඔප්පු ප්‍රදානය කිරිම කරලා තියෙනවා. ඉඩම් ලාභීන් 165 දෙනෙකුට. විශේෂයෙන් සිරිබරමැනිකේ පුර, ඉඩම කොට්ඨාශයේ පිරිස් වත්ත, කොරලවැල්ල සුසාන භූමිය පිටුපස කොටස, මෙතායස් පෙදෙස ගඟ ආශ්‍රිත ජනතාව එවැනි කටයුතු ප්‍රමාණයක් ඔබතුමාගේ නායකත්වයෙන් ඉඩම් කමිටුව විදියට අපිට කරගන්න හැකියාව ලැබුනා. ඒවගේම ගරු නගරාධිපතිතුමනි, මම කණගාටු වෙනවා අදහස් දැක්වීමේදී එක මන්ත්‍රීවරයෙක් රංග ශාලාව ඉදිකිරීම් පිලිබඳව යම් අදහසක් දැක්වුවා. මම හිතන්නේ කියමනක් තියෙනවා පාසැලක් විවෘත කලොත් සිරගෙවල් 10 ක් වහන්න පුලුවන් කියලා.

ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකොට අපේ රටේ තරුණ/තරුණියන් යම් යම් ප්‍රමාණයක් මත් ද්‍රව්‍ය අත්හදා බලමින් සිටිනවා. ඔවුන් යම්කිසි විදියකට ඔවුන් කලා කටයුතු වලට, ක්‍රීඩා කටයුතු වලට යොමු කිරිම තුලින් ඔවුන්ගේ තියෙන සහජ හැකියාවන් ඔසවා තබාගෙන ඔවුන්ව නිවැරදි මාර්ගයට ගන්න පුලුවන්. හැම ආයෝජනයකින්ම මුදල් හම්බකර ගැනිම පරමාර්ථය කර ගන්නවා නම් ඒක මහජන නියෝජිතයෙක් විදියට සුදුසු නැහැ මොකද අපි රටේ ජනතාවගෙන් ක්‍රීඩා කටයුතු, කලා කටයුතු ඔවුන්ගේ සංස්කෘතික ගුණාංගයන් ඉස්මතු කර ගන්න ඕන.ඒ එක්කම

මම හිතන්නේ නැහැ රංග ශාලාවකින් මුදලක් නොලැබෙනවා නොවෙයි රංග ශාලාවක් ඉදි කිරීම තුලින් ඔවුන්ට වේදිකා නාට්‍ය , නාට්‍ය හා රංග කලාව එවැනි ආයතන වලට මේ රංග ශාලාව ලබා දෙමින් අමතරව මුදල් ලබා ගන්න පුලුවන්. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, එතුමා නැවතත් කියනවා පිටු අංක 58 පෙරලලා යන්ත්‍රසුත්‍ර අලුත් වැඩියාවට මිලියන දෙකක් වෙන් කරලා තියෙනවා නමුත් වියදම් කරලා තියෙනවා 379110 කියලා. යන්ත්‍රසුත්‍ර වලට අලුත්වැඩියාවට මුදල් වෙන් කරලා තියෙනවා. නමුත් කැඩෙන්නේ නැත්නම් මොකද කරන්නනේ. එතුමා කියන්නේ කඩලා නැවත මිලියන 2 දක්වා සංවර්ධනය කරන්න කියලා. මහජන නියෝජිතයෝ මෙවැනි අදහස් ප්‍රකාශ කිරීමේදි මොනවද මේ කියන්නේ කියලා හිතන්න ඕනෑ.

ගරු නගරාධිපතිතුමනි, හැම දෙනාගෙම කථාවකදි අපේ රවි මන්ත්‍රීතුමා කිවුවා වගේ මේක සම්ප්‍රදායක් විතරයි සම්ප්‍රදායක් විතරයි කිසිම හරයක් නැති අයවැයක් කියලා. මම හිතන්නේ පාර්ලිමේන්තුවේ ගත්තත් අවුරුදු72 ක කාලය තුල හැමෝම කරන්නේ ඕකම තමයි. ඒක නිසා අපි වෙනස් වෙන්න ඕන. මෙහි හොඳ දෙයක් තියෙනවා නම් හොඳ දේ ඉස්මතු කරලා කථා කරන්න ඕන. ඒවගේම නරකක් තියෙනවා නම් නරක විවේචනය කරලා ඒ දේ නිවැරදි තැනට ගෙන්න ඕන. එවැනි තත්වයක් තුල අපි නිවැරදි මාර්ගයකට ගමන් කරමු. මොරටුව පුරවරය සංවර්ධනය කරන්න සියලු දෙනාගේ සහයෝගය ලබාගෙන මේ කටයුතු කරමුයි කියන ඉල්ලිම කරමින් 2022 මෙම අයවැයට මාගේ සම්පූර්ණ සහයෝගය ප්‍රකාශ කරමින් එලඹෙන නත්තල සියලු දෙනාටම සුභ නත්තලක් සහ ලබන්නාවූ නව වසර සියලුම කටයුතු සාර්ථක කර ගන්න ලැබෙවා කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.ලිහිනි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,පුරා වසර 4 කට ආසන්න කාලයක් මෙම සභාවේ සභිකවරියක් ලෙස කටයුතු කරලා අද සහභාගි වන 4 වන අයවැයැ.ඔබතුමාගේ ධුර කාලය තුල 14 කිව්වොත් නිවැරදියි. අයවැය කියන්නේ මොකක්ද අයවැය කියන්නේ සැලසුමක්, දැක්මක් නමුත් මේ අයවැය දිහා බලනකොට කිසිම තේරුමක් නැති අංක හරහයක් කියලා තමයි මට පෙනි යන්නේ. කාලින අවශ්‍යතාවයන් හදුනා නොගත් අයවැයක්. ගිය අවුරුද්දේ අයවැය ඉදිරිපත් කරන කොට මම මගේ කථාවේදි කිව්වා මේ කොරෝනා සමයක තමයි අයවැය ඉදිරිපත් කරන්නේ. කොහොමද බිලියන 3.3 ක අයවැයක් ඔබතුමා කොහොමද ෂාක්සාත් කර ගන්නේ කියලා. ඒක අද මේ සංඛ්‍යාලේඛන බලනකොට සක්සුදක් සේ පැහැදිලි වෙනවා මොකද අද වෙනකොට ඔබතුමාගේ පුනරාවර්ථන ආදායමෙන් 4 වෙනි කාර්තුවටත් ඇස්තමේන්තු කලොත් පුනරාවර්ථන ආදායමෙන් අද වෙනකොට ෂාක්සාත් කර ගැනිමට හැකිවෙලා

තියෙන්නේ 28% ක් පමණයි. එතකොට මේ නගර සභාවට අද වෙනකොට ලැබිලා තියෙන්නේ 28% ක ආදායමක් පමණයි වියදමෙන් 17% ක්. මම අහනවා 28% ක් ආදායමක් ලැබීම සාර්ථකද? අසාර්ථකද? මම කියන්නේ නැහැ ඔබම කියන්න. 2021 වර්ෂයේදි ඔබතුමාගේ අයවැය කථාවේදි ඔබතුමාගෙන් කොටසක් මම උපුටා ගන්න කැමතියි. ඔබතුමා ඒ අයවැයේදී ප්‍රාග්ධන ව්‍යාපෘති ගණනාවක් ඉදිරිපත් කරනවා. මම ඒවා ඇහුවොත් ඔබතුමා කියනවා පීරිස් මාවතේ සුඛෝපභෝගි මහල් නිවාස ඉදිකරනවා. නව ගාලු පාරේ මධ්‍යම වෙලඳ පොල ඉඩමේ සාප්පු සංකීර්ණයක් ඉදි කරනවා. නවින පහසුකම් සහිත අංග සම්පූර්ණ ප්‍රේක්ෂකාගාරයක් ඉදිකරනවා. දැනට අර්ධ වශයෙන් ඉදිකර ඇති ප්‍රේක්ෂකාගාරය ඉඩමේ නව පරිපාලන සංකීර්ණයක් ඉදි කරනවා. වෙරළබඩ මාර්ගයේ මුහුද දක්වා පුලුල් කරනවා මේවා ඔබතුමා සඳහන් කරනවා. එපමනක් නොවෙයි ඔබතුමාගේ තෙවන ප්‍රමුඛත්ව ලෙස ඔබතුමා කියනවා මාතෘ ළමා සායන , පුස්තකාල, කායවර්ධන මධ්‍යස්ථාන, ක්‍රීඩා භූමි සංවර්ධනය කියලා කියනවා. ගරු නගරාධිපතිතුමනී, මම ඔබතුමාගෙන් අහන්න කැමතියි කොරෝනා සමයක මේ දේවල් කරනවා කිව්වා නමුත් මේ දේවල් කරන්න බැරි වෙලා තියෙනවා. ඔබතුමා අයවැය කියන්නේ මොකක්ද ඉදිරිය දිහා බලලා කල යුතු දෙයක් නමුත් ඔබතුමා අයවැය සැලසුමේදි ඔබතුමා අසාර්ථක වුනා කියලා මම ඔබතුමාට කියනවා.

ගරු නගරාධිපතිතුමනි, මම සංඛ්‍යාලේඛන වලට යන්නම් 2020, 2021, 2022 අවුරුදු 3 සංසංදනය කරනවා නම් 2020 පුණරාවර්තන ආදායමේ පරතරය මිලියන 237 යි එනම් ඇස්තමේන්තු ගත ආදායමෙන් උපයාගෙන තියෙන්නේ 76% යි. ප්‍රාග්ධන ආදායම පරතරය මිලියන 263 යි ඒ කියන්නේ ප්‍රාග්ධන ආදායමෙන් උපයාගෙන තියෙන්නේ 13% යි ඒ අනුව බිලියන 1.3 ක් ආදායමක් ලැබීමට අපේක්ෂා කලත් උපයගෙන තියෙන්නේ මිලියන 803 ක් මිලියන 501 ක හිඟයක් තියෙනවා. සමස්ත ඇස්තමේන්තු ගත ආදායමෙන් ලබාගෙන තියෙන්නේ 62% ක ප්‍රමාණයක් 2021 තුන්වන කාර්තුව දැන් වෙනකොට පුනරාවර්ථන අදායමෙන් ලැබිලා තියෙන්නේ 68% යි.ඒ කියන්නේ බිලියන 1.09 කින් මිලියන 650 යි. ප්‍රාග්ධන ආදායම ලෙස ඔබ බිලියන 2.35 ක් අපේක්ෂා කලත් 3 වන කාර්තුව අද වෙනකොට ඔබතුමාට ප්‍රාග්ධන ආදායමෙන් කිසිදු මුදලක් ලබාගැනිමට හැකි වෙලා නැහැ. නගරාධිපතිතුමනි, 2020 වියදම් ගැන කථා කලොත් පුනරාවර්තන වියදම් පරතරය 269 සමස්ත වියදමෙන් මිලියන 405 පරතරයක් තියෙනවා. 2021 තුන්වන කාර්තුව වෙනකොට ප්‍රාග්ධන වියදම ලෙස මිලියන 61 ක් වියදම් කරලා තිබුනත් ප්‍රාග්ධනය සඳහා කිසිදු ආදායමක් ලැබිලා නැහැ. එතකොට ආදායමක් නොලබා ඔබතුමා ප්‍රාග්ධනයට මිලියන 61 ක් වියදම් කරලා තියෙනවා. නගරාධිපතිතුමනි මේ අංක දෙස බලනකොට අපිට පෙනියන්නේ ඔබතුමාගේ මේ අංක කිසිදු දෙයක් ශාක්සත් කර ගැනිමට නොහැකි වෙලා තියෙනවා. මෙම නගර

සභාවේ පුනරාවර්ථන ආදායම සමස්තයක් ගත්තොත් අවුරුදු 3 ක් සංසංදනය කර ගත්තොත් පුනරාවර්තන ආදායම තියෙනනේ මිලියන 750 ත් 850 ත් අතර නමුත් ඔබ පුන-පුනා පුනරාවර්තන ආදායම බිලියන පන්නනවා. එතකොට නගරාධිපතිතුමනි මම ඔබගෙන අහන්න කැමතියි මේක අයවැය ගණනයේදි ඔබතුමාගේ ගණනයේ වරදක්ද ? ඒක ඔබතුමා තිරණය කරන්න කියලා මම ඔබතුමාට කියනවා. ප්‍රාග්ධනය ලෙස ඔබතුමා ගියවර 2.3 ක් ලබාදිලා තියෙනවා. අද වෙනකොට ප්‍රාග්ධනය ආදායම 0 යි. මම මුලින් කිව්වා වගේ නගර සභාවේ 2021 අද වෙනකොට අපිට ආදායම 4 වෙනි කාර්තුවටත් උපකල්පනය කලොත් 28%යි. වියදම 17% යි ඔබ සාර්ථකද? අසාර්ථකද? ඔබ තීරණය කරන්න. ඒ අනුව නගරාධිපතිතුමනි, මම කියන්නේ නැහැ ඔබ ෆේල් ද කියලා ගිය පාර මම කිවුවා ඔබ ෆේල් කියලා මම කියන්නේ නැහැ ඔබ තීරණය කරන්න ෆේල් ද ඔබ සක්සස්ෆුල්ද කියලා. නගරාධිපතිතුමනි, මම කරුණු කියනවා මම දකින විදියට ඇයි මම ඔබ අසාර්තකයි කියලා දකින්නේ. මොරටුව නගරයේ තියෙන ගැටලු වලට මම හිතනවා. නගරාධිපතිතුමනි, ඔබ සාධනිය විසදුම් ලබා දිලා නැහැ. මාර්ග පද්ධතිය ගත්තොත් අපි දකිනවා කාපට් දානවා නමුත් මිනිස්සුන්ගේ ප්‍රශ්ණ වලට මාර්ග පරිපාලනය කිරිම මේවා හරියට නඩත්තු කිරිම කලමනාකරනයක් ඇතුව සිද්ධ වෙනවද අපි දකිනවා ගංවතුරක් වෙලාවට පාරවල් යටවෙනවා යන්න විදියක් නැහැ. කාණු නැති පාරවල් කියක් තියෙනවද? දොරවල් ,ජනේල නැති මාතෘ සායන කීයක් තියෙනවද? වහලවල් නැති ප්‍රජාශාලා කියක් තියෙනවද? ඔබතුමා අවුරුදු 10 ක් අභිමානෙන් කථා කරනවා ඔබතුමා නගරාධිපතිතුමා වුනා කියලා සාධනීය සංවර්ධනයක් ඔබතුමා මොරටුවට කරලා තියෙනවද ඔබතුමාගේ අවුරුදු 14 ක කාලය තුල පොදු ජන පෙරමුණ බලය ඉදිරියදිත් ඔබතුමා සාධනිය දෙයක් මොරටුවට දැනෙන සංවර්ධනයක් කරලා තියෙනවද කියලා ඔබතුමාගෙන් අහන්න කැමතියි.

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අසාර්ථක භාවය ගැන කරුණු කිපයක් සඳහන් කරනවා නම් මම යනවා නගර සභාවේ විගණන වාර්තාවට. විගණන වාර්තාවේ කියනවා නගරාධිපතිතුමනි, ආයතන722 කින් ලැබිය යුතු මිලියන 38 යි සභාවට අයත් ආදායම ආයතන 702 කින් ලැබීමට අපොහොසත් වෙලා කියලා. කසල ගාස්තු නොගෙවන ආයතන වලට විරුද්ධව ඔබ පියවර ගැනිමට අපොහොසත් වෙලා තියෙනවා කියලා. වීථි පහන් නඩත්තුව වෙනුවෙන් සභාවට අයවිය යුතු මිලියන 10 ක් ප්‍රතිපූර්ණය කර ගැනිමට ඔබට නොහැකිවෙලා තිබෙනවා. 2020 ව්‍යාපාර බදු වශයෙන් මිලියන 51 කින් ලබාගෙන තියෙන්නේ මිලියන 1 ක ප්‍රමාණයක මුදලක් පමණයි. ගරු නගරාධිපතිතුමනි, ඔබ කියයි නගර සභාවේ තීරණ අනුව මේ දේවල් වෙනස් වෙනවා කියලා නමුත් විගණන වාර්තාවේ සඳහන් වෙනවා විගණකාධිපතිට ඔබ මේ කරුනු දැක්වුවාද කියලා අපිට ප්‍රශ්ණයක් දිනපොල මධ්‍යම වෙළඳ පොල

සමහර ආයතන වල කඩවල කුලි ශේෂය ලබාගැනිමට ඔබට නොහැකි වෙලා තියෙනවා. මට කණගාටුවට කරුණක් නගරාධිපතිතුමනි විගණන වාර්තාවේ සඳහන් වෙනවා ගිණුම් 13 ක මුදල් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකිවෙලා තියෙනවා. අපි කියන කරුණු නොවෙයි

විගණකාධිපති මිලියන 194 ක් ගිනුම් විෂයන් 13 කට අදාලව තොරතුරු ඉදිරිපත් කිරිමට නොහැකි වෙලා තියෙනවා.ඇත්තටම මේක නගර සභාවේ පරිපාලනයට දිගුවම එල්ල කරනු ලබන පහරක්. මම කියන්න

කැමතියි කොරෝනා සමයේදි සහන මලු 9000 ක් දිලා ඒ වෙනුවෙන් මිලියන 7.6 ක් වියදම් කරලා ඒ සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් බෙදු පුද්ගලයින්ට පවුල් වල නමක් ගමක් විගණනයට ඉදිරිපත් කරලා නැහැ. තව එකක් මහ නගර සභාවේ ආඥාපණතේ අංක 218 වගන්තිය ඔබතුමා උල්ලංගනය කරලා කියලා සඳහන් වෙනවා. වාර්ෂික පරිපාලන වාර්තාව අමාත්‍යවරයා වෙත නිසිකලට ලබා නොදි තියෙනවා. මිලියන 1 ක අධිභාරයක් අදාල පුද්ගලයින්ගෙන් අයකර ගැනිමට ඔබ අපොහොසත් වෙලා තියෙනවා. වාහන 84 ක් දෛනිකව ධාවනය වන මාසික සාරාංග ඉදිරිපත් කරලා නැහැ. වාහන 46 ක මයිලෝ මීටර් අක්‍රියව පවතිනවා. වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරික්ෂාවක් සිදු කරලා නැහැ. නගරාධිපතිතුමනි, අපි කියන දේවල් නොවෙයි රජයේ විගණකාධිපති ඔබගේ පරිපාලනය ගැන කියනවා.

ගරු නගරාධිපතිතුමනි, ආයතනයේ පුණරාවර්තන වියදම පරිපාලනය කිරිමට නොහැකි වෙලා තියෙනවා. පුණරාවර්තන ආදායම ඉක්මවා වියදම මිලියන 36 යි. අපිට ලැබෙන ආදායමට වැඩියෙන් ඔබ වියදම් කරලා තියෙනවා. නගරාධිපතිතුමනි, දෙසැම්බර් 31 දක්වා ලැබිය යුතු ආදායම් හිඟය ඒ කියන්නේ මහජනතාවට ලැබිය යුතු බදු මුදල් මිලියන 297 ක් වරිපනම් කුලි බලපත්‍ර හිඟ වරිපනම් මිලියන 210 හිඟ ආදායම මිලියන 297 යි ඔබතුමා ජනතාවගේ එකතු කර ගතයුතු මුදල් එකතුකර ගැනිමට අපොහොසත් වෙලා තියෙනවා. නගරාධිපතිතුමනි, කසල ගැන ඔබතුමා බොහොම උජාරුවෙන් කථා කරනවා. කසල සංවර්ධනයට ඔබතුමාගේ පූර්ණ දායකත්වය ලබා දෙනවා, නමුත් මම ඔබතුමාට කියන්න කැමතියි විගණන වාර්තාවේ සඳහන් වෙනවා අයවැය සමස්තයක් ගත් කල ආදායමෙන් 45% යි ඔබතුමා අරගෙන තියෙන්නේ ඉතිරි 55 ට මොකද වුනේ කියලා මම අහන්න කැමතියි. මිලියන 20 ක කසල ආදායමෙන් සභාවට ලැබිලා තියෙන්නේ මිලියන 8.9 ක් මානව සම්පත් කලමනාකරණයට ගියොත් ඔබතුමා වැටුප් ප්‍රතිපූර්ණය කරගෙන නැහැ කාඩර් එක සම්පූර්ණ කරගෙන නැහැ කාඩර් එකෙන් මිනිස්සුන්ව පරිපාලනයට ලබාගෙන තියෙනවා. පරිපාලන දුර්වලතා ගැන මේකේ සඳහන් වෙනවා සභාව සතු ක්‍රීඩාංගන නඩත්තු කිරිමට ඔබ අපොහොසත් වෙලා තියෙනවා. එපමනක් නොවෙයි නගරාධිපතිතුමනි, මෙන්න මේ

සියලු දේවල් පරීක්ෂා කර බලනකොට නගරාධිපතිතුමනි, කියන්න තියෙන්නේ ඔබ අසමත් ද? ඔබ සමත් ද? කියලා තීරණය කරන්න. මේ සංඛ්‍යා දිහා බැලුවම අපිට පේනවා විගණකාධිපති කියනවා ඔබ අසමත් කියලා. අපේ විපක්ෂයක් හැටියට මම කරේ සාධනීය විවෙචන අංකත් එක්ක. මේ අංක බොරු කියලා කියන්න බැහැ රජයේ විගණකාධිපති තමයි මේ දේවල් කියන්නේ. ගරු නගරාධිපතිතුමනි, ඔබ නගරයේ පරිපාලකයා අවුරුදු 14 ක් ඔය පුටුවේ ඉදගෙන ඉන්නවා. හොඳ පරිපාලනයක් කිරීමට ඔබ පොහොසත් වෙලා ද අපොහොසත් වෙලා ද සභාවට ලැබිය යුතු ආදායම උපයා ගැනීමට ඔබ කටයුතු කරලා තියෙනවද. මම කියන්න කැමතියි සර් කියනවා අපි තමයි හොඳටම කලේ කියලා. ඔබත් හිතනවද මම තමයි හොඳටම කලේ කියලා. නගරාධිපතිතුමනි, ඔබ කොතරම් අසමත්ද කියලා අපිට පෙනි යනවා. මම කණගාටුවෙන් මේ දේ ප්‍රකාශ කරන්නේ අපි දකින්නේ ඔබතුමා ඔය පුටුවේ ඉදගෙන දේශපාලනය කරලා තියෙන්නේ. නගරයේ සෑම පුද්ගලයෙකුටම එකසේ සලකන්නේ නැතුව ඔබතුමාගේ පාක්ෂිකයන්ට සලකපු කාලයක් අපි දැකලා තියෙන්නේ. මම ඇයි ඒ දේ කියන්නේ ඔබතුමා ජන්දය ඉල්ලනකොට අපි දැක්කා මේ නගර සභාවේ කැංටින් එකේ ඔබතුමාගේ පෝස්ටරය ගහලා තියෙනවා. හරිනම් මේවා රාජ්‍ය ආයතන ඒ දේ කරන එක හරිද වැරදිද කියලා ඔබතුමා තීරණය කරන්න.

ගරු නගරාධිපතිතුමනි, නගර සභාවේ අරමුදල් ගැන කියනවා නම් ඔබතුමා කොරෝනා සමයේදි මිලියන 7.6 ක් සභා අරමුදල් වලින් කොරෝනා ජනතාවට උදව් කරනවා වෙනුවට ඔබතුමා ඔබතුමාගේ දේශපාලනය ප්‍රවර්ධනය කර ගත්තා කියලා මම ඔබතුමාට කියනවා. සදාචාරයක් කියලා දෙයක් තියෙනවා රටේ නීතිය තමුන් ජන්දය ඉල්ලනකොට ඔය පුටුවේ ධුරය දරන එක සාධාරණද අසාධාරණද ඔබතුමා නිදහසට කරුණු කියන්න පුලුවන් නමුත් සම්ප්‍රදායක් තියෙනවා ඔබතුමා ඒ දේ කලාද නැද්ද කියන එක ඔබතුමා තීරණය කරන්න. මම කියනවා අද මේ නගර සභාවේ සේවකයෝ අසරණයි කියලා. මේ සේවකයන්ට යුක්ති ගරුක ලෙස සේවය කිරීමට නිතිගරුකව රාජකාරි කිරීමට හැකි වපසරියක් මෙහි හැදිලා තියෙනවද. නගරාධිපතිතුමනි, පහුගිය අවුරුද්ද නගර සභාවේ සභිකයින් හැටියට අපි ගත කරපු අවුරුදු වලින් ඉතාම අභාග්‍ය සම්පන්න කණගාටුවන අවුරුද්දක් කියලා. මොකද සභිකයින් වන අපේ ගරුත්වයට ඔබ සෘජුවම පහරක් එල්ල කලා. අපිට අපේ කථා කිරීමේ නිදහස අපේ ඔබ උදුරා ගත්තා සභිකයින් ලෙස අපි ප්‍රතිවිරුද්ධ මත දරන කොට ඔබ හැම වෙලේම ඔබ ඔබතුමාගේ මන්ත්‍රිවරුන්ව දාලා ප්‍රතිවිරුද්ධ මත පාගලා දාන්න කටයුතු කලා. සභාවේ සභිකයින් අපිත් මන්ත්‍රී වරප්‍රසාද ලබලා

මෙතන ආවට මොරටුව නගර සභාවේ ජනතාව වෙනුවෙන් හඬ නගන අවස්ථාවල ඔබ අපේ හඬ යටපත් කලා.

ගරු නගරාධිපතිතුමනි. කාන්තා මන්ත්‍රීවරියන්ට ඔබ මේ නගර සභාවේ හොඳ විදියට කටයුතු කරලා තියෙනවද ඔබගේ මන්ත්‍රීවරුන් ගරුත්වයක් ඇති විදියට කටයුතු කරලා තියෙනවද කියලා. මේ සියලු දේ දෙස බලනකොට මම තව දෙයක් කියනවා ඔබතුමා කොරෝනා සමයේදි කොරෝනා එන්නත දේශපාලනය කලා. ඔබ නගරාධිපති තනතුරේ පුටුවට ගරුත්වය හානි කලා නගරාධිපතිතුමනි අද මිනිස්සු අහනවා අපෙන් මොරටුවෙ නගරාධිපතිවරයා මොරටු ජනතාවගේ අභිමානය කෙලෙසුවා කියල මම කියනවා. ඔබ හිතයි ඔබ ශේෂ්ඨ පාලකයෙක් කියලා නමුත් අපි හිතනවා ඔබ ශේෂ්ඨ පාලකයෙක් නොවෙයි ඔබතුමාගේ අයවැය දැක්කම අපිට පේනවා ඔබතුමාගේ කළමනාකරනය අසාර්ථක වෙලා තියෙනවා. පුද්ගලයෙක් හැටියට ඔබතුමා ශිෂ්ඨ සම්පන්න පුද්ගලයෙක් හැටියට නගරාධිපතිවරයෙක් හැටියට මේ නගර සභාවට මොරටුව ගමට පුර්වාදර්ශයක් ලබා දිලා තියෙනවද කියලා අපි ඔබතුමාගෙන අහන්න කැමතියි. ඔබතුමා කොරෝනා එන්නත දේශපාලනය කිරිම අපි ඇත්තටම පිලිකුලෙන් හෙලා දකිනවා නගරාධිපතිතුමනි. මම කියනවා නගරාධිපතිවරයෙක් වුනාම දැක්මක් තියෙන්න ඕන. දැක්මක් තුල ක්‍රියා කරන්න ඕන. ඔය පුටුවට ආවාම දේශපාලනය කරන්න බැහැ. පොදුජන පෙරමුණ බලය හිටියට ඔබතුමා මොරටුව සමස්ත ජනතාවගේ නගරාධිපති. නමුත් නගරාධිපතිතුමනි ඒ දේ අපි දැකලා නැහැ. අපි ප්‍රාර්ථනා කරනවා නගරාධිපතිතුමනි මොරටුව ජනතාවට ඇස් ඇරේවා. මම ප්‍රාර්ථනා කරනවා මේ අයවැය ඔබතුමාගේ අවසාන අයවැය වේවා. මම ප්‍රාර්ථනා කරනවා මොරටුවේ මිනිස්සුන්ට මීට වඩා සාධාරණයක් සිදු විය යුතුයි. මොරටුවේ මිනිස්සුන්ට මොරටුව ඉදිරියට ගෙනයාමට දැක්මක් තියෙන පුද්ගලයෙක් ඔය පුටුවට පත් වෙන්න ඕන. මොකද අපි දකින දෙයක් තමයි දුෂිත පාලනයක් තියෙන තැනක් කිසිම තැනක දියුනු වෙන්නේ නැහැ.මේක මොරටුවටත් පොදුයි රටටත් පොදුයි හරි මිනිස්සු හරි පුටුවල නැත්නම් කිසිම තැනක සංවර්ධනයක් වෙන්නේ නැහැ. මම ආන්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලිමක් කරන්න කැමතියි. අපි දකිනවා ආණ්ඩුවේ මන්ත්‍රීවරු ආණ්ඩුව විවේචනය කරනවා. මම ඔයගොල්ලන්ට කියනවා අපි කඩේ යන දේශපාලනය පැත්තකට දාලා විවේචනය කරමු හරි දේට හරි කියමු වැරදි දේට වැරදි කියමු. නගරාධිපතිවරයාට කඩේ යන්නේ නැතුව මේ අයවැය සාධනීයද නැද්ද හිතට එකඟව එකඟ වෙන්න පුලුවන්ද මේ අයවැය මොරටුව හරි මහට යනවද ඒ දේ මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මේ රට අපි හැමෝගෙම රට අපේ ළමයින්ගේ රට මේ රට දුෂණය වෙන්නේ දිනෙන් දින අගාදයට පත් වෙන්නේ හරි මිනිස්සු හරි පුටුවල ඉදගන්නේ නැති නිසා. පක්ෂ පාඨ

භේදයකින් තොරව හරි මිනිස්සු හරි පුටු වලට යන්නේ නැත්තම් අද රටටත් වෙලා තියෙන්නේ ඒක මොරටුවටත් වෙලා තියෙන්නේ ඒක. මම

ඉල්ලිමක් කරනවා මේ අයවැයට අපි විරුද්ධයි මේ අයවැය කිසිදු සාධනිය දෙයක් පෙන්නුම් කරන්නෙත් නැහැ මොරටුව ජනතාවගේ දැක්මක් පෙන්නුම් කරන්නෙත් නැහැ ඉතාමත් අසාර්ථක අයවැයක්. මම හිතනවා ඉදිරි වර්ෂ වලදි මීට වඩා සාධනීය අයවැයක් ඉදිරිපත් කරන්න පුලුවන් පුද්ගලයෙක් මේ නගර සභාවට පත්වේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා විසින් ඉදිරිපත් කරන 14 වන අයවැය ලේඛණයට අපි සුභ පතන ගමන්ම එයට සමගාමීව වසර 14 ක් එයට සම්බන්ධ වෙමින් අදහස් ප්‍රකාශ කිරීමට ලැබීම පිලිබඳව මා පලමුව මා නියෝජනය කරන ඉදිබැද්ද ප්‍රමුඛ මොරටුව ජනතාවට අපේ ගෞරවනිය ස්තුතිය ප්‍රකාශ කරනවා. ගරු නගරාධිපතිතුමනි, අද මම මගේ යතුරු පැදියෙන් මේ අවස්ථාවට එනකොට මට විනාඩි 2-3 ක කාලයක් ට්‍රැපික් එකේ ඉන්න සිදුවුන නිසා එම් ජේ සී ප්‍රනාන්දු මාවතෙන් දාලා ප්‍රධාන මාවතට දානකොට ත්‍රීවිල් එකක් පිටිපස්සේ තමයි රැදිලා ඉන්න වුනේ. එතකොට මම ඒකේ වාක්‍යක් දැක්කා ‘‘ආසියා කූටමේ වැඩ දැම්මට ජෝකර් එහෙම නැහැ කියලා.’’ අන්න එහෙම කියමනක් තමයි ගරු නගරාධිපතිතුමනි දැක්කේ මම එතනින් එහාට ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. ඔබතුමා ප්‍රායෝගික නායකයෙක් නොවෙයි ඔබතුමා පාස් ද ෆේල් ද. ඔබතුමා හිතා ගන්න කියනකොට අපි ඔයගොල්ලන්ට කියන්න කැමතියි ජනතාව තීරණය කරපු නිසා තමයි ඔබතුමා පාස් කියලා අද ඔබතුමා ඔය පුටුවේ මේ දක්වා ඉන්නේ වසර 14 ක කාලයක්. අද ඒක නිසා තමයි අපිට පුලුවන් කම ලැබුනේ ආණ්ඩු පක්ෂය මොන පැත්තේ තිබුනත් මේ මොරටු මහ නගර සභාවේ බලය අපිට ලබා ගන්න පුලුවන් කම ලැබුනේ. ඔබතුමා පාස් කියලා ජනතාව තීන්දු කලා. එම නිසා අපි ඔය නෝනලට කියන්න කැමතියි ඔහොම කථා කරනකොට තමුන්ගේ පැත්තට ඇඟිලි 4 ක් දික්වෙනවා ඒ නිසා ඒ ගැනත් හිතලා කථා කරන්න කියන පනිවුඩය දෙන ගමන් ගරු නගරාධිපතිතුමනි අපට වසර ගණනාවක් තිබුන ප්‍රශ්ණය තමයි මේ නොදිරණ ද්‍රව්‍ය 37 ක් වගේ ප්‍රමාණයක් මේ වෙනකොට ඔබතුමා ගෙනල්ලා ඒකට ස්ථීර විසදුම් ලබා දිලා තියෙනවා අපි වෙනදට අපගේ සේවකයෝ යොදවලා කාණු පද්ධති සුද්ධ පවිත්‍ර කරන කොට ලොකු ප්‍රශ්ණයක් වෙලා තිබුනා මේ නොදිරණ ද්‍රව්‍ය අද මේ වෙනකොට අපේ මොරටුව බල ප්‍රදේශය තුල ලොකු වසංගතයක් බවට පත් වෙලා තිබුන මෙම ද්‍රව්‍ය අද අපිට නිවැරදි ලෙස ප්‍රතිචකිකරණය කරන්න පුලුවන් කම ලැබිලා තියෙනවා

ඔබතුමන්ගේ නායකත්වය නිසා. අපි ඒක නිසා තමයි කියන්නේ හැම වෙලාවෙම ඔබතුමා ප්‍රායෝගික නායකයෙක් කියලා.

ගරු නගරාධිපතිතුමනි, අපේ ජනතා විමුක්ති පෙරමුණ සුදේශ් මන්ත්‍රීවරයා අද ඔබතුමා වෙනුවෙන් කථාවක් කලාදෝ කියලා මට හිතුනා. මොකද එතුමත් ලිහිනි මන්ත්‍රීතුමියත් අදහස් ප්‍රකාශ කරන කොට කිව්වා කාඩර් එකේ අඩුවක් තියෙනවා මේ වෙනකම් ඔබතුමාට බැරි වෙලා තියෙනවා කියලා ඒක පුරවා ගන්න ඔව් ඇත්ත ජනාධිපතිතුමා ඉන්නේ අපිත් එක්ක පාර්ලිමේන්තුව තියෙන්නේ අපේ පලාත් සභා තියෙන්නේ අපේ නමුත් අපේ කාඩර් එකේ අඩුක් තියෙනවා.නමුත් ගරු නගරාධිපතිතුමනි ඒ කාඩර් එකේ අඩුවක් තිබුනත් අපි ජනතාවට සේවය කරන්න ඕන නිසා මේ සභාවේ මුදල් වලින් හරි ඒ සේවකයන්ට පඩිනඩි ගෙවලා ඔබතුමා සමත් වෙලා තියෙනවා සභාවෙන් හරි මුදල් ගෙවලා ඒ අපේ කාර්යයන් ඉටු කර ගන්න. අද ඒසේවකයෝ තමයි ඒ බ්‍රේල් එකේ ඉන්නේ ,අපේ කාණු සුද්ධ පවිත්‍ර කරන්නේ, දෙනිකව කුණු ගේන්නේ මේ ට්‍රක්ටර් වල අන්න ඒ නිසා තමයි අපි කියන්නේ ඔබතුමා ප්‍රායෝගික නායකයෙක් ඒ නිසා තමයි අපිට මේ සියලුම දේවල් කරන්න පුලුවන් කම ලැබිලා තියෙන්නේ අනිත් පැත්තෙන් අපේ මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කරනකොට කිව්වා ඩෙංගු තිබෙනවා අපි දන්නවා අපිටත් ඔය ප්‍රශ්ණය ලොකුවට බලපානවා. අද දවසෙත් මේ වෙනකොට ඉදිබැද්ද මාර්ග කිපයක දරුවන් මේ රෝගය සඳහා ගොදුරු වෙලා ඉන්නවා. මේ වෙනකොටත් දුම්මානය ගහන්න ශුද්ද පවිත්‍ර කරන්න යොදවලා තියෙනවා. බෝවෙන රෝග වෙනුවෙන් මිලියන 10 ක් වෙන් කරලා තියෙනවා කියන්නෙත් කොරෝනා කියන්නෙත්, ඩෙංගු කියන්නෙත් වසංගතයක් තමයි. ඒවාට තමයි ගරු නගරාධිපතිතුමා මේ අයවැයෙන් මිලියන 10 ක් වෙන් කරලා තියෙන්නේ. මේවා මීට පෙර වෙන් කරලා තිබුනේ නැහැ නගරාධිපතිතුමනි. අපිට වෙලාවකට කණගාටුවක් ඇති වෙනවා ඔබතුමා මේ අයවැය ලේඛණය ඉදිරිපත් කරන්න කලින් කෙටුම්පත දින කීපයක් සියලුම මන්ත්‍රවරුන් ,කොමසාරිස්තුමා,ලේකම්තුමා,ප්‍රධාන ගණකාධිකාරිතුමිය ඇතුලු සියලුම නිලධාරින් එක්ක සාකච්ජා කරනවා අපිට ලිපි එවනවා මේවාට යෝජනා එවන්න, අදහස් එවන්න, සංශෝධන තියෙනවද අපි සියලු දෙනාම එකතු වෙලා කථා කරනවා. කථා නොකරන අය බිල්ලෝ වගේ ඉදලා අද මෙතනට ඇවිල්ලා පාලු ගෙදර වලංන් බිදිනවා සහෝදරයා.මෙන්න මේවා තමයි සම්ප්‍රදාය කියන්නේ. මේගොල්ලෝ මේවා නිවැරදි කරන්න නොවෙයි කථා කරන්නේ. අද ඇවිල්ලා මුහුණු පොතට කථා කරනවා.ගරු උගත් මන්ත්‍රීතුමිය ඕක නොවෙයි කරන්න ඕන මෙතුමා හොඳ වැඩ පිලිවෙලක් මෙතන ඉදිරිපත් කරලා තියෙනවා. මේක ප්‍රායෝගිකව ගමට ගෙනියන්න පුලුවන් විදියට මෙතුමා නායකත්වය දෙනකොට අපි එතුමත් එක්ක ඉදලා එතුමට ශක්තිය දෙන්න ඕන.ඒ ශක්තිය දෙන ගමන් නිලධාරින් ලවා අපි ඒ වැඩ ටික කරවන්න ඕන.

මේක යථාර්තයක් බවට පත් කර ගන්න බැරි නම් තමයි අපි කණගාටුවෙන්න ඕන. නමුත් අපි නිතරම ගරු නගරාධිපතිතුමාගේ නායකත්වය යටතේ මෙය ප්‍රායෝගික කරන්න මෙය ගමට ගෙනියන්න ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු නිරන්තරයෙන්ම ඔබතුමාට ශක්තිය හැම වෙලාවෙම දිලා තියෙනවා. අදත්,හෙටත්,ඉදිරියටත් දෙනවා. ඒ දිපු නිසා තමයි ඔබතුමා ඔතන ඉන්න ගමන් ඒ ජනතාව අපිවත් මේ තත්වයට ගෙනල්ලා තියෙන්නේ.

ගරු නගරාධිපතිතුමනි, කවුරු කොහොම කිව්වත් ඔබ සාර්ථකයි. ඔබ හොඳ බිම්මට්ටමේ ඉන්න නායකයෙක්. ඒක නිසා තමයි අර සුලු සේවකයත් එක්ක බ්‍රේල් එකට වෙලා සුලු සේවකයගේ මට්ටමට වැටිලා නගරාධිපතිකම පැත්තකට දමලා ඒවට සහයෝගය දෙන්නේ.ඔබතුමාටත් පුලුවන් මේ නෝනා/මහත්වරු වගේ ගෙදරට වෙලා ඉදලා සභාවට එනකොට විතරක් බොරුවට කොල කැල්ලක් හරි මොකක් හරි අරගෙන ඇවිල්ලා පම්පෝරි ටිකක් ගහලා ගිහිල්ලා ගමට කිසි වැඩක් කරලා නැහැ. මේගොල්ලො අහනවා ඔබතුමා මොරටුව සංවර්ධනය කලාද කියලා. කියන්න ලැජ්ජයි අපි මොනවද නොකර තියෙන්නේ. අද මේ වෙනකොට කොරෝනා තත්වයක් රටේ තියෙන කොටත් අපිට පුලුවන් ඉහලම මට්ටමින් අපි ගම වෙනුවෙන් වැඩක් කලා ඒ නිසා තමයි ජනතාව අද මොන විදියෙන් හරි ආන්ඩු පක්ෂය වෙන පැත්තක තිබුනත් අපිව බලයට පත් කරලා තියෙන්නේ. ඒක නිසා ඔබතුමාට පවරපු වගකීම මම හිතන්නේ ඒ විදියටම නිවැරදි ලෙස මොරටුව ජනතාව වෙනුවෙන් ඉටු කරලා තියෙනවා. අද ඒක නිසා තමයි අපට මේ ගමන යන්න පුලුවන් කම ලැබිලා තියෙන්නේ නගරාධිපතිතුමනි. අපි මෙතන බොරුවට සද්දෙ දැම්මේ නැතුවට දවස ගානේ හෙටත් උදෑසන ඉදලා ඔබතුමන් එක්ක නිරන්තරයෙන්ම මේක යථාර්ථයක් බවට පත් කරන්නවා ඒ කරන අතරතුර ඔබතුමාගෙන් වැරදි තිබුනොත් අපි ඒවා විවේචනය කරලා බලන්නේ මොරටුවට සේවය කරන්න මිසක් මුහුණු පොතට කථා කරන්න නොවෙයි.එමනිසා ඔබතුමාගේ 14 වන අයවැයට හදවතින්ම සුභ ප්‍රාර්ථනා කරන කමන් ලොකු වැඩ කොටසක් මොරටුව ජනතාවට 2022 වර්ෂයේදි කර ගන්න පුලුවන් වේවා කියමින් නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ඇත්තටම මට කාලයක් වෙන් කරලා තිබුනේ නැහැ ඒක තමයි සත්‍ය.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මම දෙනවා ඔබතුමාට කාලයක් ඕන තරම් කථා කරන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මට කාලය ලබා දීම සමබන්ධව විශේෂ ස්තුතියක් පුදකරන අතර, මම ලොකු සුදානමකින් හිටියේ නැහැ අයවැයට සම්බන්ධ වෙන්න.නියෝජනය කරන්නේ ඵලදායිතා කමිටුව. මට කල හැකි දේ කමිටුව තුලදිත් සභාවක් තුලදි මා යෝජනා කර ඉදිරිපත් කර තිබෙනවා. මා අයවැයට සහභාගි වන 4 වන අවස්ථාවයි. සතුටු වෙනවා මා පිලිබඳව ගත් තීරණයට. මට විපක්ෂයක් විදියට තමයි කථා කරන්න සිදු වෙන්නේ. ආන්ඩු පක්ෂයේ මන්ත්‍රිවරුන් කථා කරද්දි ඇත්තටම මේ 2022 අයවැය යෝජනාව මට හිතුනේ ෆුල් ඔප්ෂන් අයවැයක් කියලා. නමුත් යම්කිසි විදියකට මා අධ්‍යනය කරලා තියෙනවා මට පෙනෙන්නේ නගරාධිපතිතුමනි මේක ඔප්ෂන් කරන්න වෙන අයවැයක් කියලා. මම ඵලදායිතා කමිටුවේ වැඩ කරද්දි වැඩියෙන්ම අධ්‍යනය කරපු කටයුතු කිපයක් තියෙනවා ක්‍රීඩාංගනය සම්බන්ධව ඩික්සන් ජේ ක්‍රීඩාංගනයේ වැඩ කටයුතු සිදුවන බව මා දැක්කා. ඩෙංගු කීට උගුලක් ගැන කථා කලා ඒකත් ඉදිරියේදි ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක තුමා ඒ ගැන අවධානය යොමු කරයි කියලා බලාපොරොත්තු වෙනවා. මට ගැටලු තියෙනවා යාන්ත්‍රික ඉංජිනේරු අංශය පිලිබඳව මේ සම්බන්ධව අධ්‍යනය කලා මම එතකොට පෙනුනා ලස්සන ආදර්ශ පාඨයකුත් තියෙනවා "නිසි කලට ප්‍රවාහන සේවාවන් " නමුත් සභාව සතු වාහන වලින් ක්‍රියාකාරි ගලි බවුසර දෙකයි ක්‍රියාකාරි නොවන ගලි බවුසර් දෙකයි, අත් ට්‍රැක්ටර් හතරයි ක්‍රියාකාරි නොවන හතරයි. යතුරු පැදි 2 යි දෙකම ක්‍රියාකාරි නොවන ඒ කියන්නේ නගරාධිපතිතුමනි අපි සතු වාහන 143 ක් තිබෙනවා මෙයින් 12.5% කට වැඩියේ පාවිච්චියට ගන්න බැරි තත්වයක් උද්ගත වෙලා තියෙන්නේ.එය සැබෑවක් ලෙස අයවැය වාර්තාවෙන් පේනවා. යාන්ත්‍රික ඉංජිනේරු ක්‍රියා කරන ආකාරය පිලිබඳව ගැටලුවක් තියෙනවා.මම බලාපොරොත්තු වෙනවා මේ ප්‍රමාණය 2022 අයවැයෙන් 5% දක්වා වත් අඩු කර ගැනිමේ හැකියාවක් තියෙන්නෙ ඕන. ඒක විය යුතුයි නැත්නම් අපිට අවශ්‍ය සේවය මහජනතාවට කරන්න මේ අයවැය වාර්තාව අනුව නොහැකි බව පැහැදිලි බව ප්‍රකාශ කරන අතරම තවත් එකක් විනෝද බදු අයකර ගැනිම සම්බන්ධව මමත් පොඩ්ඩක් කලාවට සම්බන්ධ නිසාම 2021 දි විනෝද බදු සඳහා වෙන් කරලා තියෙනවා මුදලක් 2022 දි ඒ මුදල රු.100.00 දක්වා තමයි තියෙන්නේ. ඇත්තෙන්ම කැමතියි නගරාධිපතිතුමනි මොරටුව

නගරයේ සිනමා ශාලා 3 ක් තමයි තියෙන්නේ ඒ සිනමා ශාලා 3ට රු.100.00 කොහොමද එකතු වෙන්නේ කොහොමද කියන එකත් හැකියාවක් තිබෙනම් මේ කොරෝනා වසංගත කාරි වතාවරණය තුල කර්මාන්තය බොහොම අඩපන තත්වයකයි තියෙන්නේ. ඒ නිසා මා යෝජනා කරනවා 2022 වර්ෂයේදි සිනමා ශාලාවලින් එකතු කර ගන්නා වූ විනෝද බද්ද අහෝසි කරන ලෙස ඉල්ලා සිටිනවා. ලබන්නාවූ 2022 වර්ෂය හා නත්තල් උත්සවය සියලු දෙනාට සුභම සුභ වේවා කියා ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ 14 වන අයවැය. මාගේ මේ 4 වන අයවැය ප්‍රකාශනය. ඉදිබැද්ද නැගෙනහිර මාගේ මැතිවරණ ප්‍රදේශයේ ජනතාවටත් මොරටුවේ ජනතාවටත් සංවර්ධන හා සුභ කටයුතු 2022 වර්ෂයේදි පුලුල් කිරිමට මේ සභාව ගන්නා වූ උත්සහායට මාගේ පක්ෂපාතිත්වය හා ආශිර්වාදය එක් කරනවා.2021 වර්ෂයේ රටේ පැවැති කොරෝනා වසංගතය හේතුවෙන් මොරටුව පමණක් නොවෙයි රටේ ජනතාවගේ ආර්ථික හා සමාජීය සුභ සාධන කටයුතු විශාල වශයෙන් අඩාල වුනා. අඩාල වූ සුභ සාධන කටයුතු නගර සභාවේ ඔබතුමාගේ නායකත්වයෙන් යුතු සංවර්ධනය 2022 වර්ෂයේදි විශාල සංවර්ධනයක් යොමු කිරිම ගැන මාගේ ස්තුතිය පුදකර සිටිනවා. කැලි කසල කලමනාකරණය සැම වසරකම මෙන්ම විධිමත්ව තවදුරටත් කලමණාකරනය කර කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය කරන්න සුවිශේෂී එකක් වෙනවා. ඔබතුමා තාක්ෂණය යොදා ගනිමින් සභාවේ වැඩ කටයුතු තවදුරටත් සාර්ථක කර ගැනිමට අවධානය යොමු වෙලා තියෙනවා. අවසාන වශයෙන් මාගේ ඉදිබැද්ද ජනතාවට මොරටුව ජනතාවට සංවර්ධනය සමාජ සුභසාධනය සපිරෙන 2022 නව වසරක් වේවා යි ප්‍රාර්ථනා කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මොරටු පුරවරයේ මහජනතාව පුල පුලා බලා සිටින අයවැය වාර්තාවේ මගේ 4 වන වර්ෂය. අයවැය වාර්තාවේ පලමුවම තියෙනවා දැක්ම. සියලුම පුරවැසියන්ට යහපත් ජන ජීවිතයක් තියෙනවා නැවත මෙහෙවර හා පරමාර්ථ කාර්යයන්. ඔබතුමාගේ කාර්යභාරය මේ කාර්ය හා බැදිලා තියෙනවා. ඒවගේම මම ඔබතුමාට මතක් කරන්න කැමතියි සියලුම පුරවැසියන්ට යහපත් ජන ජීවිතයක් කිව්වට සියලුම කියන වචනයේදි අර්ත ගැන්වෙන්නේ නැහැ කියන එක ඔබතුමාගේ ක්‍රියාකලාපයත් එක්ක. මේ අයවැය සමබරව සංවර්ධනය ගෙන යා යුතු වෙනවා.

නමුත් සංවර්ධනය කරගෙන යනකොට ඔබතුමාගේ පෞද්ගලික මත ඔබතුමාගේ පාක්ෂිකයන්ගේ මත ඒවගේම නියෝජිතයන්ගේ මත නිතරම ඉස්මතු වෙනවා දකිනවා. මේ අයවැය අපි දකිනවා මුදල් ගනුදෙනුවක්. ආදායම හා වියදම බැලන්ස් කරලා අපට පොතක්. ඔබතුමා මෙය ක්‍රියාත්මක කරනකොට ඔබතුමාගේ අභිප්‍රායන් ඉෂ්ඨ කර ගන්න. මම දකිනවා හැමවිටම ඔබතුතමා තමන්ගේ ජන්දය ලබා ගැනීමේ අරමුණෙන් මේක ඉෂ්ඨ කර ගන්න යොමු කර ගන්නවා කියලා. ජන්ද ගොඩ වැඩි කරන්න මේ කරන හැම ක්‍රියාමාර්ගයක්ම ඔබතුමා උදවු කර ගන්නවා කියලා. මම පලමුවෙන්ම කියන්න කැමතියි දැන් අවුරුදු 4 ක් තිස්සේ අපි ඉන්නවා අපි නිතර යෝජනා දානවා නමුත් කිසිම දාක විරුද්ධ පක්ෂයේ යෝජනාවක් ඔබතුමා ඉෂ්ඨ කලේ නැහැ. නමුත් ආණ්ඩු පක්ෂයේ අය යෝජනා දානවද නැද්ද කියලා දන්නෙත් නැහැ හැබැයි ඒවා ඔබතුමා ක්‍රියාත්මක වෙනවා. අපි දකිනවා පහුගිය කාලේ ඉතාමත්ම නරක කාලයක් මම ඒක පැත්තකට බෙදන්නේ නැහැ පක්ෂ පාඨ භේදයක් නැහැ එතන කොවිඩ් වසංගතයට අපි කවුරුත් පොදුවේ මුහුණ දුන්නා නමුත් ඔබතුමාගේ දුර්වල තැන් අපි දැක්කා. එන්නත් කරනයේදි,ඒවාගේම රු.5000/- දිමනාවේදි, බඩු මලු බෙදීමේදි. ඒ හැම විටම ඔබතුමා කලේ පාක්ෂිකයන්ට මුල්තැන දිම ඔබතුමාගේ මහජන නියෝජිතයින් ඉස්සරහට දාලා එයාලගේ ලකුනු වැඩි කර ගන්න ක්‍රියා කරපු එක. ඔබතුමා දන්නේ නැහැ මහජන නියෝජිතයින් හැටියට කාටත් වැරැද්දක් නොවි වචනයක් අහන්නේ නැතුව ඒක කලොත් විතරයි නගරාධිපති හැටියට ඔබතුමා සම්මාන ලබන්නේ. නමුත් ඔබතුමා කරන එක පක්ෂයේ ජන්ද වැඩි කර ගන්න ක්‍රියාමාර්ගයක්. නමුත් මුදල් වැය වෙන්නේ මේ අයවැය මගින් ඔබතුමාට පුලුවන් ඒකට මුදල් එහාට මෙහාට කර ගන්න අපි දැකල තියෙනවා ඔබතුමා සභාවේදි අපිට කියපු දේවල් වලින් තමයි මම මේ දේවල් කියන්නේ එහෙම නැත්ව අපි දිව්‍යඥානය නැහැ. අපි දකිනවා මේකේ භෞතික සැලසුම් වලට මුල් තැන දිලා තියෙනවා. ඒ වගේම විශාල මුදලක් ඔබතුමා 2021 ත් යොමු කරලා තියෙනවා 2022 ත් යොමු කරලා තියෙනවා මෙතනදි මම දකිනවා මේකෙන් ඔබතුමා කරන්නේ දේශපාලන වාසි ගැනිම තමන්ගේ නියෝජිතයින්ට ප්‍රසාද ලබා ගැනිම ඒ වගේ ම ජන්ද දායකයන් සිටින ප්‍රදේශ වලට විතරක් වැඩි සලකිලි දැක්විම. අපි දකිනවා ඒ හැමෝම අපිට කියන නිසයි අපි කියන්නේ තමන්ගේ ජන්ද දායකයෝ වැඩියෙන් ඉන්නවා නම් ඒ තැනට ඔබතුමාගේ වැඩි අවදානයක් යොමු වෙනවා.

ගරු නගරාධිපතිතුමනි, ඊලඟට දකිනවා නියමිත ක්‍රමවේදයකට කාර්යාලිය කටයුතු සිදු වෙනවද කියන එක. මේ අයවැය ක්‍රියාත්මක වෙන්න නම් කාර්යාලිය කටයුතු පවිත්‍ර විය යුතුයි. නමුත් මේ කාර්යාලය තුලට අපිත් අපගේ යම් කිසි ක්‍රියාමාර්ග ගන්න, යමක් පාස් කර ගන්න ගියාම අපි දකිනවා පක්ෂග්‍රාහි තත්වයක්. පක්ෂග්‍රහි තත්වයක් නැහැ කිව්වොත් ඒක බොරු. එම නිසා ඔබතුමාට කියනවා මේක යටින්

මුදල් දිලා කර ගන්න ඒවයි ජනතාවට සාධාරණ ක්‍රම වේදයක් මේ සේවය තුල නැති එකයි ඉතාමත්ම කණගාටුදායකයි. මොකද මහජනතාව මොරටුවේ එතනට එන්නේ නැහැ තමන්ට ජන්දය දුන්න පාක්ෂිකයින් පමණක්. එතනට එනවා නොයෙකුත් ක්‍රමවේද වලට අනුගත වුන අය. එතන ඉන්න අයට පොදු ක්‍රමවේදයකට යන්න නම් ඔබතුමාගේ කාර්යාල කටයුතු මීට වඩා ක්‍රමවත් විය යුතුයි. නමුත් ඒක සිද්ද වෙනවා. ඊලඟට මේකේ තියෙනවා අභිමථාර්ත යටතේ සහස්‍ය සංවර්ධනයට සපුරා ගැනීම අරමුණු කොට අධ්‍යාපන, සෞඛ්‍ය, පරිසරය යන ක්ෂේත්‍ර යටතේ ඔබතුමාගේ පරමාර්ථ හා කාර්යයන් ගොනු කර ගන්න ඕන. මෙතන අධ්‍යාපනය කියන මාතෘකාව යටතේ ගත්තොත් පාසැල් 28 ක් තියෙනවා පල්ලි පන්සල් 86 ක් තියෙනවා මේ තුලත් යම්කිසි අධ්‍යාපන ක්‍රමවේදයක් වේවා. ඒක නිසා මම ඔබතුමාට කියන්න කැමතියි මේ පාසැල් පද්ධතියත් පල්ලි පන්සල් වලත් තියෙන්නාවු ගරු කටයුතු දේට අපි ගරු කටයුතු විදියට සලකන්න ඕන. මම ඔබතුමාට මීට කලිනුත් මේක කියලා තියෙනවා ඒගොල්ලන්ගේ කුණු ඉවත් කරන්නයි ඒගොල්ලන්ගේ ප්‍රශ්න වලට උත්තර ලියන්නයි ඒවට මහජන නියෝජිතයින් දෙනවට වඩා ඔබතුමා ගාව ඊට වඩා හොඳ සැලැස්මක් තිබිය යුතුයි.

ගරු නගරාධිපතිතුමනි, පෙර පාසැල් 19 ක් මාතෘ හා ළමා සායන 16 ක්, ළමා සුරැකුම් මධ්‍යස්ථාන 2 ක්, ඔක්කොම 37 යි. මේ ඔක්කොම පාලනය වෙන්නේ නගර සභාවෙන්. මේ නගර සභාවෙන් පාලනය වන මේ ආයතන වලට සැලකිල්ල ඉතා වැඩි විය යුතුයි. අපි දන්නවා මහජන උපයෝගිතා හා ප්‍රජා සංවර්ධන කමිටුව යටතේ මේවා ක්‍රියාත්මක වෙනකොට මේ අවුරුදු 4 ට කටයුතු කරලා නැහැ. එම නිසා පරමාර්ථ හා කාර්යයන් සමබර කරගෙන නැහැ. ගොඩනැගිලි පාරවල් කාණු වලට මුල් තැන දුන්නා මිසක්, තම පාර්ශිකයින් බහුලව සිටින තැන් වලට මුල් තැන දුන්නා මිසක් ඔබතුමා පක්ෂක්ග්‍රහිව කටයුතු කලා කියන

එකයි මම කියන්නේ. ඒවගේම මම කියනවා පොතට විතරක් සිමා වෙච්ච අයවැයක් මේක නගරාධිපතිතුමාගේ කාර්යාලය තමයි අයවැය ක්‍රියාත්මක වෙන්නේ. ඔබතුමාට කියනවා අපි කමිටුවේ දි සභාපතිතුතමා ඔබතුමාගෙන් අහනවා. ඔබතුමාටත් නිදහසක් නැහැ. මේ අයවැය එකඟ විය නොහැකි අසාර්ථක අයවැයක් හැටියට සංඛ්‍යා ලේඛන විතරක් කියලා කියනවා.ඔබ සියලු දෙනාට සුභ නත්තලක් සහා අලුත් අවුරුද්දක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, 2022 අයවැය විවාදය සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරියක් වශයෙන් සිව් වනි වතාවට අදහස් ප්‍රකාශ කිරීමට මා හට අවස්ථාව ලැබීම සතුටට කරුණක්. රටේ පවතින වාතාවරණය කෙසේ වුවද මොරටුව

ජනතාවගේ හෙට දවස වෙනුවෙන් ජනතාවට ආසන්නතම මහජන සේවාවන් සපයන ආයතනය ලෙස ජනතාවගේ දෛනික අවස්ථා ඉටු කිරීමේ වගකීම අප සියලු දෙනාටම පැවරෙන කාර්යභාරයක් ලෙස මා විශ්වාස කරනවා. එම අවශ්‍යතා 2022 වසරේ අප විසින් ඉටු කරනු ලබන ආකාරය කෙසේද යන්න ප්‍රකාශ වන ලියවිල්ල හැටියට අයවැය ලේඛණය හඳුන්වාදිය හැකියි. මෙවර ඔබතුමා ඉදිරිපත් කර ඇති මෙම අයවැය ලේඛණය පරිශීලනය කිරීමේදි මෙහි සාධනීය ලක්ෂණ රාශියක් දක්නට ලැබෙන අතර ජනතාවගේ පැත්තෙන් හිතලා ජනතාවට කල හැකි උපරිම සේවාවන් සැලසීමට ඔබ විසින් ගන්නා ලද උත්සහාය අප ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලෙස අගය කරනවා. පසුගිය කාල සීමාව මෙන්ම ඉදිරියටත් බොහෝ දුරට අපිට ගැටලුවක් විය හැකි කොවිඩ් වසංගතය සමයේදි මොරටුව මහ නගර සභාව හැටියට ගත් සහ ගැනීමට නියමිත මෙම අයවැය ලේඛණයේ සඳහන් කරුනු පිලිබඳව ජනතාවගේ පැත්තෙන් අපි ඔබතුමන්ට ස්තුතිවන්ත වෙනවා. එමෙන්ම ඩෙංගු වසංගතය හිස ඔසවමින් තිබෙන බැවින් ඒ පිලිබඳවද ඔබතුමන්ගේ අවධානය යොමු වී තිබීම ඉතාම සාධනීය ලක්ෂණයක් වන අතර ඒ සම්බන්ධයෙන්ද ඔබතුමන්ට අපගේ ස්තුතිය පිරිනමන අතර, මෙම ඩෙංගු උවදුර මැඩලීම සඳහා තවදුරටත් සුවිශේෂී අවධානයක් යොමු කරන මෙන් ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. අයවැය ලේඛණය තුලින් කරුණු උපුටා දැක්වීමට වඩා ඔබතුමා විසින් මොරටුව ජනතාවගේ යහපත උදෙසා කරනු ලබන ඕනෑම යහපත් කාරණයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය උපරිම සහයෝගය ලබාදෙන බව සපත කරමින් මෙම අයවැය ලේඛණයේ සඳහන් ජනතාවට හිතකාමී සියලු යෝජනා කරුනු කාරනා ඒ ආකාරයෙන්ම ඉෂ්ඨ කිරීමට නිලධාරින්ට ශක්තිය ලැබෙන්න කියා පතන අතර මෙම අයවැය ලේඛණයට අපගේ එකඟතාවය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ 14 වන අය වැය මගේ 4 වන අයවැයට සම්බන්ධ වීමට ලැබීම ගැන ස්තුතිවන්ත වෙනවා.ඇත්තටම නගරාධිපතිතුමනි, මම හිතන්නේ අපේ උගත් නීතිඥ තුමිය කතා කලේ ආර්ථික විද්‍යාව ගැනද කියලා පොඩි ප්‍රශ්ණයකුත් තියෙනවා. ලෝකේ කොහෙවත් සමතුලිත අයවැයක් ප්‍රකාශයට පත් කරලා නැහැ. විශේෂයෙන් නගර සභාවක් කියන්නේ සුභ සාධන ආයතනක් මෙයට මෙතුමි කියන විදියට හොඳ දෙයක් තියෙනවා කරන්න ඔබතුමාට මේ දිගටම ගහන්න කඩ. ඒවා පිට මිනිස්සුන්ට දිලා කියන්න කුලිය නැති අය ඔබලව එලියට දානවා කියලා. අන්න ඒක තමයි මේ කියන්න හදන්නේ. ඔබතුමාට එවැනි දෙයක් වරිපනම් කුලිය ගෙවන ජනතාවට එහෙම ප්‍රහාරයක් එල්ල කරන්න බැහැ. හේතුව එතුමන්ලාට යම්කිසි ප්‍රශ්ණයක් වෙන්න පුලුවන්. කොරෝනා වසංගතය නිසා කුලිය ගෙවා ගන්න බැරි වෙන්න ඇති. එහෙම එලියට දාන්න බැහැ යම්කිසි ගිවිසුමකට

බැදිලා තමයි මේ කඩ දෙන්නේ. මෙතුමිය කියන්නේ අර වගේ කලුකඩ ටිකක් ගහලා නගර සභාවට භාර දෙන්න කියලා. එම නිසා උගත් නීතිඥවරියට කියනවා ඔබතුමිය මේවා මේ වගේ කියන්න එපා. ඔබතුමියගේ නීතිඥ කමටත් අගෞරවයක් මේ වගේ ප්‍රකාශ කරන එක. හේතුව ඔබතුමිය දැන ගන්න ඕන නගර සභාව කියන්නේ සුභ සාධන ආයතනයක්. අපිට අපේ මිනිස්සුන්ගෙන් ලැබෙන ආදායමෙන් පමණක් කරන්න පුලුවන් අයතා විදියට මිනිස්සුන් සමග ගනුදෙනු කරන්න බැහැ. ඒ වගේ හේතුන් මත ඔබතුමිය මේ වගේ ප්‍රකාශ මේ සභාවේ කරන්නේ මාධ්‍ය වලට පමණක් වෙන්න පුලුවන්. නගරාධිපතිතුමනි, අපි ඔබතුමියට විරුද්ධව විශ්වාසභංගයක් ගේනවා. මොකද මේ විගණනයට ඔබතුමා විගණනය පැත්තේ නැහැ. නමුත් මේ ඔක්කොම ඉන්නවා විගණනය පැත්තේ. එහෙම නම් ජනතා විමුක්ති පෙරමුණ නිශාන්ත මන්ත්‍රීතුමා කියන මුදල එකවර ගෙවන්න කියලා මම යෝජනාවක් ගේනවා සභාවට. ඔබතුමිය අපි අදත් කියනවා ඒ දේ වැරදියි කියලා. මේගොල්ලො ඔක්කොම කියන්නේ විගණනය හරියි කියලානේ. විගණනය හරිනම් එතුමාගේ අධිභාරයත් හරි නේද? අපි ඉන්නේ නිශාන්ත මන්ත්‍රීතුමාගේ පැත්තේ නොවෙයි. එහෙම නිලධාරින්ගෙන් සිදුවුන අතපසුවිමකට ඔබතුමා වගකියන්න ඕන නැහැ. නමුත් ඔබතුමන්ලා විගණනය විවේචනය කරනවා නම් එතුමා එක සභා වාරයකදි ඒක ගෙවන්න යෝජනා කරන්න. ඔබතුමන්ලම යෝජනා කරන්න. එහෙම කියන්න එපා හේතුව විගණනය කියන එකේදි අපිට තියෙන්නේ ගයිට් ලයින් එකක්.මේක සම්පුර්ණ තියෙන්නේ විගණනයේදි තියෙන්නේ රංග ශාලාව හදපු නැති එකේ පාඩුව. පාඩු වෙන්න හදන්න එපැයි. ඔබතුමන්ලා බඩු බෙදපු එකේ ඉල්ලනවා ලැයිස්තු පොත් බෙදපු ලැයිස්තුව දුන්නද ඔබතුමන්ලා. බඩු බෙදපු එකේ ලැයිස්තු නැහැ කියලනේ මේ විගනණයේ තියෙන්නේ. එහෙම නම් නගරාධිපතිතුමනි, අපි සියලුම දෙනාට දුන්නා පෙලපොත් විපක්ෂයටත් දුන්නා එතුමන්ලාගේ ලේඛණ ඔබතුමියටත් දුන්නද? එහෙම නම් මේ විගණන ගැන කථා කරන්න එපා. ඔබතුමන්නා කන්න ගියාමකබරගොයා තලගොයා කර ගන්නනේ හදන්නේ. විගණනය තියෙන්නේ අපේ යම් කිසි වරදක් තියෙනවා නම් හදා ගන්න පමණයි. විගණනය ගැන නගරාධිපතිතුමනි අපිටත් ප්‍රශ්නයක් තියෙනවා. ඔය විගණනය සම්බන්ධයෙන් අපි පාරට ගියාම අපි සමාජගත වුනාම අපෙන් අහනවා බොලා ලක්ෂ ගණනකට අරගෙන නේද නගර සභාවෙ කියලා. ලංකාදීප පත්තරේ තිබුනා ඒ කොටස අරුණ පත්තරේ එහෙමම තියෙනවා. මම කියනවා අපේ මාධ්‍යවේදිනියන්ට මේවා නිවැරදි කරන්න කියලා. එතුමා කිව්වානම් මේ විගණනය හරි කියලා එතුමත් ඒ වැරැද්දට අහුවෙලා. අපි අදටත් කියන්නේ ඔබතුමා විතරයිනේ විගණනය හොඳයි කියන පැත්තේ ඉන්නේ. ඒගොල්ලෝ හරි කියනවානම් ඒකත් හරි වෙන්න එපැයි. එම නිසා මාධ්‍යට සංදර්ශණ දාන්න එපා කියලා ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, ඒවගේම ක්‍රීඩා කමිටුවේ සභාපතිවරයා වශයෙන් අද කියනවා අපේ ක්‍රීඩාංගන වලට කරන්න පුලුවන් උපරිම දේ කරලා තියෙනවා. මේ මාසේ විතරක් සොයිසාපුර ක්‍රීඩාංගනයේ ආදායම ලක්ෂ 7 පන්නලා තියෙනවා. කොළඹ තිබෙන හොඳම විකට එක දැන් තියෙන්නේ මොරටුවේ ග්‍රවුන්ඩ් එකේ. ක්‍රීඩාංගනවල තණකොළ කැපීම් ගැන අපිට ප්‍රශ්ණයක් තිබුනා. ඒකට ඔබතුමා මැදිහත් වෙලා ටැක්ටරයකට සවි කරන්න පුලුවන් මැෂින් එකක් හෙට අපි ගේනවා. පොඩි මැෂින් එකකින් කපන්න පුලුවන් විනාඩි 20 යි. විශාල පිට්ටනි කපන්න බැහැ. ඒකටත් අපි සාධනිය පිලිතුරක් සොයලා විශාල පිට්ටනියක් වුනත් පැය 3 කින් කපන්න පුලුවන් තත්වයට ගෙනාවා ක්‍රීඩා කමිටුව වශයෙන් අපි ඒකට සතුටු වෙනවා. මේ කොරෝනා වසංගත තත්වය තුල සමහර මන්ත්‍රීවරු කියනවා අපිට ගමට යන්න බැහැ කියලා. මම නම් අපේ ගමේ ඕන වෙලාවක ඉන්නේ. අද මිනිස්සු පණ අදිනකොට අපිට කෝල් එක එන්නේ අපි තණකොල ටික කපනවා, ලයිට් එක දානවා, කොඩි ටික ගහනවා අන්තිමට ආදාහනාගාර බුක් කරලත් දෙනවා. නගරාධිපතිතුමනි, අද වෙනකොට මන්ත්‍රීවරු ලක්ෂ 10 කට ආසන්න දිමනාව අරගෙන තියෙනවා. එම නිසා කුහක කමින් මේ දෙස බලන්න එපා. ඇත්තටම පුනරාවර්තනයට මුල් තැන දිපු අයවැයක් වෙන්න ඕනෑ. මොරටුව මහ නගර සභාව කියන්නේ මොරටුව ජනතාවගේ හදවත වගෙයි.සමහර අය කියනවා රෙදි උස්සාගෙන තමයි පාරේ යන්න වෙන්නේ කියලා. මම නම් කියන්නේ අපේ පැත්තේ පාරවල් කාපට් කරල පුලුවන් ප්‍රමාණයෙන් හදලා තියෙන්නේ. මේ ජන්දයට බයේ කියලා නොවෙයි. ඇත්තටම නගරාධිපතිතුමනි මහජන නියෝජිතයෙක් වශයෙන් අපි අද සතුටු වෙනවා. හේතුව නගර සභාවෙන් අපිට කරන්න පුලුවන් දේවල් ටික කරලා තියෙන්නේ. අපි මිනිස්සු අතරට ගිහිල්ල් බලන්න ඕන. මම හිතන්නේ අර ගත්ත ලක්ෂ 9 ටත් රෑට නින්ද යන්නේ නැතුව ඇති.අවසාන වශයෙන් මම කියනවා මේ අයවැය ඉදිරියට සාර්ථක කර ගන්න අපි සියලු දෙනාම ඒකමතිකව සම්මත කර ගන්න ඕන කියලා යෝජනා කරමින් නිහඩ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පවුල් 41459 ක් ඒවගේම 2012 වර්ෂයට එක්ලක්ෂහටඅටදාස් දෙසියපනස්පහක් වුන ඒ ජන සංඛ්‍යාව අද වෙනකොට මරණ අනුපාතයත් උපත් අනුපාතයත් ගලපාගත්තට පසුව ලක්ෂ දෙකට ආසන්න ප්‍රමාණයක් සිටින කොටියාශ 29 ක සිටින ග්‍රාම සේවා 42 ත් පුරා විහිදිච්ච දුටුගැමුණු රජතුමාගේ මුර අටුවෙන් ආරක්ෂාව සැලසුන ඒ වගේම අයථා බදු ක්‍රමයට එරෙහිව සත්‍යයේ අසිපතින් අපේ වීරපුරන්අප්පු මහා වීරයා ඉතිහාසය ලියපු මේ වර්ග කිලෝ මීටර් 23.4 ක විහිදෙන මොරටුවේ සිහින ලියවිල්ල තමයි අද සාකච්ජා වෙන්නේ. ගරු

නගරාධිපතිතුමනි මේ සිහින ලියවිල්ලත් එක්ක මම ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. මෙය යථාර්තයක් කර ගැනීමේදි පක්ෂ විපක්ෂ

බේදයකින් තොරව අපි හැම දෙනාම දායකත්වය දෙනවා වගේම නගර සභාවේ දැක්ම හා මෙහෙවර අපි කොහොමද යථාර්තයක් බවට පත් කරගන්නේ කොහොමද කියලා. මෙහි තිබෙන දැක්ම තමයි සියලු පුරවැසියන්ට පහපත් ජන ජීවිත්යක් කියන එක 2022 අයවැයේ තියෙන සහ අපේ දැක්ම බවට පත් වෙලා තියෙන්නේ. මීට කලින් 2019-2021 අයවැයේ තියෙන අපේ දැක්ම තමයි යහපත් පරිපාලනයක් තුල තිසරස සංවර්ධනයක් කරා පියනගමින් මොරටු ආසියාවේ ආශ්චර්යමත් පුරවරය බවට පත්කර ගැනිම. ගරු නගරාධිපතිතුමනි මෙහි දැක්මේ යම් අඩුපාඩුවක් වෙලා තියෙනවා විශේෂයෙන් අපි මේ ලෝකය පුරවටම තිරසර සංවර්ධනය ගැන කථා කරන කොට ඒවගේම අනිත් පැත්තෙන් අපි පංචබල මහා කේන්ද්රයක් ගැන කථා කරන විට එහි යම් වියුක්ත භාවයක් අඩුවක් සිද්ද වුනේ ඇයි කියන එක පිලිබඳව මට ප්‍රශ්ණයක් තියෙනවා. එනිසා අපේ දැක්ම බවට පත්විය යුත්තේ මොරටුවත් අනිත් රටවලට සාපේක්ෂව අපි කොහොමද ආසියාවේ ආර්ශ්චර්ය බවට පත් කරන්නේ කියලා. චින්තන ප්‍රතිපත්තිය විශේෂයෙන් චම්පික ඇමතිතුමා ඉදිරිපත් කල ලියවිල්ලේ අපි පංච බල කේන්ද්රයක් බවට කථා කලා. ඒ නාවික කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන්නේ කොහොමද අනිත් පැත්තෙන් දැනුම් කේන්ද්‍රස්ථානයක්, ගුවන් කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන්නේ කොහොමද කියලා. මම හිතන්නේ විශේෂ අවධානයක් බවට පත් කරන්න ඕන මීට දශක කීපයකට පෙර රොබට්ඉන් කප්රාන් කියන ආර්ථික විද්‍යාඥයා ලියනවා මුන්සුන් කියලා පොතක් ඒ තුල තියෙනවා ලංකාව පිලිබඳව ටොලමි කථා කලාට වඩා අපි අවධානය යොමු කරන්න ඕන කියලා. ඒ මොකද අනාගතයේදි නැගෙන ආසියාවේ සිලිකන් වැලියට එහෙම නැත්නම් අප්‍රිකාවේ නැගෙන ඒ ආර්ථික මර්මස්ථානයට දොරගුලු විවිර කරන්න සපේක්ෂ වාසියක් සහ නිරපේක්ෂ වාසියක් ලංකාවේ තියෙනවා කියලා. ඒ නිරපේක්ෂ වාසියට අනුව මොරටුවත් දැනුම් කේන්ද්‍රස්ථානයක් බවට පත්වෙන සුවිශේෂි මධ්‍යස්ථානයක් වෙලා තියෙනවා. එක පැත්තකින් අපි පහුගිය කාලේ ගුවනට යවපු රාවනා වන් චන්ද්‍රිකාව යවපු ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය තියෙනවා. ඒ අනුව අනිත් පැත්තෙන් ගත්තට පස්සේ අපේ මොරටුව විශ්ව විද්‍යාලය දක්වා ඒවගේම ජර්මනියට විවෘතව තියෙන ජර්මන් ටෙක් එක තියෙනවා ඒනිස ගරු නගරාධිපතිතුමනි මේ දැක්ම අපි වියුක්ත කරන්න නරකයි ඒක පුලුල් කරගෙන තිරසර සංවර්ධනය කරගෙන අපි කොහොමද මොරටුව ආසියාවේ ආශ්චර්ය බවට දොරගුලු විවර කරන්නේ එහෙම නැත්නම් නැගෙන අප්‍රිකාවට කොහොමද මේ සිලිකන් වැලියට දොරගුලු විවෘත කරන්නේ කොහොමද කියලා අපි කථාකල යුතුයි. ඒ නිසා ඒ දැක්ම මෙහෙවර පිලිබඳව අපි වඩාත් පුලුල්ව කථා කරන්න ඕනෑ.

ගරු නගරාධිපතිතුමනි අපි සාමාන්‍යයෙන් විභාග කරනකොට මේ අයවැයත් විභාග වල තියෙන ලකුණු වගෙයි. ලකුණු 75 ට වැඩිනම් දෙනවා D හෝ A වගේ දෙනවා. 35 ට අඩුවෙන් ගත්තොත් ෆේල් ඒ නිසා මම සාධනීය වශයෙන් අපිට මේ තුල ෆේල් වන විශයන් පාස් කර ගන්න තමයි හදන්න ඕන. විශේෂයෙන් අපේ රට ගත්තට පස්සේ සෑම පක්ෂයක්ම අපේ රට යම් විදියකින් ගෙනියල තියෙනවා සුවිශේෂී ස්ථාන දෙකකට එකක් තමයි ලෝකේ සංවර්ධනය වන රටවල් ගත්තම අපි අධ්‍යාපන දර්ශකය හොඳ පැත්තක ඉන්නවා. සෞඛ්‍යත් ඒ වගෙයි. විශේෂයෙන් මේ වැඩ සටහනේදි අපි කථා කලයුතු කාරනා කීපයක් තියෙනවා. ඒවා තමයි අදායමත් වියදමත් පුරෝකථනය කරනවා. ඇස්තමේන්තු ආදායම අපි කොහොමද අයවැයේ සත්‍යත් ඇස්තමේන්තුවත් අතර වෙනස වෙච්ච විචලනයට පිලියම් යොදන්නේ කියලා. ඒ පිලියම් යොදනකොට ගරු නගරාධිපතිතුමනි මූලික වශයෙන් අපිට ලැබෙන ආදායම් පිලිබඳව, අනාගතයේදි ලැබෙන ආදායම් පිලිබඳව ලියවිල්ල තුල විශේෂයෙන් බලාපොරොත්තු වෙනවා බිලියන 304 ක් ඒක කොහොමද ලබා ගන්නේ.විශේෂයෙන් කොරෝනා ප්‍රශ්ණ, කොරෝනා ප්‍රශ්ණ දේශගුණික ව්‍යවපර්යාස වශයෙන් ප්‍රශ්ණ මතු වෙන්න පුලුවන්. ඊලඟට ගොවින්ගේ පොහොර ප්‍රශ්ණත් එක්ක මතු වුන

ඔවුන්ගේ වැපිරිම ප්‍රමාද වුන සිදු වුන තත්වයත් එක්ක යම් සාගත තත්වයක් ඇති වුනොත් අපි මොරටුවේ කොහොමද පිලියම් යොදන්නේ කියලා අපි සාකච්ඡා කලයුතුයි. ඒ නිසා මේ අයවැය තුල දැවෙන ප්‍රශ්ණ වලට ප්‍රමුඛතාවය දෙන්න ඕන ප්‍රමුඛතාවය හදුනා ගන්නේ කොහොමද කියලා අපි කථා කල යුතුයි. ඔබතුමාගේ අවධානය යොමු කරනවා අපි පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අද රට ගත්තට පස්සේ අපි සි සී සී 3 මට්ටමට තමයි ණයගැති භාවයෙන් අපි වර්ග වෙලා තියෙන්නේ. තව ටිකක් පල්ලෙහට වැටුනොත් ඩී කියන තත්වයට වැටෙන්න. ඒ තත්වයට වැටුනට පස්සේ ඒක පක්ෂද විපක්ෂද කියලා නැහැ ඒක රටට බලපාන්නේ. අද සංචිත ප්‍රශ්ණයක් තියෙනවා ඒකත් එක්ක එනකොට සි සි සි 3 මට්ටමේ ඉදලා ඩී මට්ටමට වැටුනොත් ඒක මොරටුවටත් බලපානවා. කොරෝනා ප්‍රශ්ණය වෙලාවේදි අපි හැම මන්ත්‍රීවරයෙක්ම දායකත්වය දක්වලා තියෙනවා. අපි CCC තත්වයට වැටෙන්නේ නැතුව D මටටමට වැටෙන්නේ නැතුව අනාගතයේදි මොරටුව ජනතාව වෙනුවෙන් සංවර්ධන කටයුතු ප්‍රමුඛතාවය අදුනාගෙන කටයුතු කරන්න පොරොන්දු වෙමින් නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එෆ්.බී.නිලංක සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා විසින් අඛණ්ඩව ඉදිරිපත් කරනු ලබන 14 වන අයවැය ලේඛනය. ඒවගේම මෙය 2018 වර්ෂයේ නගර සභාව නියෝජනය කිරීමෙන් පසු අප සහභාගිවන 4 වන අයවැය. එකසිතින් අප සුභ පතනවා. මොරටු ජනතාව අත්වැල් බැඳගෙන අපත් සමග සිටින 4 වන අයවැය ලේඛනය. ඉතාමත්ම සුවිශේෂී වූ කාරනා රාශියක් මේ අයවැය ලේඛනය සම්බන්ධයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් මේ අවස්ථාවේදී ප්‍රකාශයට පත්කරමින් සිටියා.එහිදි අපට ඇසුණා අද කාන්තා දිනයදෝ කියා සිතේන අන්දමින්ද අපගේ සහෝදර මන්ත්‍රීවරියක් කාන්තා හිංසනය පිළිබඳ කථා කරනවා. මේ අවස්ථාවේදි ඉන්පසුව අපිට දකින්න ලැබුණා මන්ත්‍රීවරයෙකුට හිංසා කරනවා. විපක්ෂය වෙනුවෙන් එතුමාට කථාකරන්න අවස්ථාවක් දිලා නෑ. අපට සැකයක් ඇතිවෙනවා එ පැත්තෙන් මන්ත්‍රීවරුන් හිංසනයට ලක්වෙනවාද කියලා තමන්ගේ පැත්තේ දෙවල් තියාගෙන මේ අයවැය පිළිබඳව අයවැයේ තියෙන හොඳ පැත්ත දැකලා එ පිළිබඳ කථාකරන්න බැරි නිසා යම් යම් මාර්ගයන් ඔස්සේ යමින් එක් එක් වචන හරඔයන් මෙතනට ගෙනාවා. සුසාන භූමි සඳහා ආදාහනාගාර සඳහා වෙන් කරලා තිබුනු මුදල් වියදම් කරලා නැත්තේ ඇයි කියලා අහන කොට අපට කියන්න සිද්ධ වෙන්නේ කලින් වියදම් කරාට දැන් සුසාන භූමියක් ආදාහනාගාරයක් කැඩුනොත් අපේ මන්ත්‍රීවරු ඉදිරිපත්වෙලා නගර සභාවට මුදල් ඉතිරිකරලා ඔවුන්ගේ සේවය සපයමින් හොඳ තත්ත්වයට පත්කිරිමට අපේ මන්ත්‍රීවරු ඉදිරිපත් වෙලා තියෙනවා. එවගේ හොඳ කරුණු කාරනා එවගේ හොඳ නගර සභාවක් හොඳ නගරාධිපතිවරයෙක්ගේ පාලනයක් යටතේ මෙගෙන යන්නේ පසුගිය වසර දෙක තුලම සංවර්ධනය කියන්නේ මොකක්ද කියලාවත් නොතේරෙන අන්දමින් ජනතාව බියවැද්දිලා ගෙදරට වෙලා හිටපු කාල පරිච්ඡේදයක් අපි පසු කරමින් ආවේ. මම හිතන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මතක නැතිවේගෙන යනවාද කියා මට හිතෙනවා.එ කාලය තුල පාරවල් හැදෙනවාද කාණු හැදෙනවාද කුණු ටික ගන්න එනවාද ලයිට් ටික වැටෙනවාද යටිතල පහසුකම් සංවර්ධනය වෙනවාද කියන එක හිතනවාටත් වඩා මරණ බිය හා මේ රෝගයෙන් මිදෙන්නේ කොහොමද කියන එක ගැන තමයි මුලු රටම ලෝකයම අසාගෙන හිටියේ. බලාගෙන හිටියේ. එහිදි ඔබ නිර්භීත නායකයෙක් විධියට මොරටුව නගර සභාවේ මන්ත්‍රීවරු එකතු කරගෙන ඔබ එළවළු ටික ගෙනල්ලා මිනිස්සුන්ට බෙදලා දුන්නා. ගෙදර ඉදලා මේ රෝගයෙන් මුදවගන්නේ කොහොමද කියන එක මිනිස්සුන්ට කියලා දුන්නා මුල් වකවානුවේදි.ඔබට ප්‍රශ්ණ ඇතිකලා අපේම මන්ත්‍රීවරු එකතුවෙලා ප්‍රශ්ණ දැම්මා නමුත් ඔබ නොසැලි හැමතැනකටම ගිහිල්ලා හැම වේලේම ජනතාව වෙනුවෙන් ජනතාවාදි නායකයෙක් විධියට ජනතාවගේ බර හිසට අරගෙන කටයුතු කරපු විධිය

අපි දැක්කා ඔබගේ පසු පස යමින් ඔබට සහය දෙමින් ඔබගේ සහය අපි ගනිමින් ජනතාව මුසපත් කලා. නගර සභාවක් තුලින් සිදුවිය යුතු සේවාවන් මේ ව්‍යසන

සමයේ වුවද ව්‍යාපෘති 180 ක් රුපියල් මිලියන 189 ක් වෙන් කරමින් මොරටු ජනතාවට යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා එ කර්මාන්ත තුලින් මොරටු ජනතාවට ඒ සේවාව ලබා දිලා තියෙනවා. අපි අහන්න කැමතියි කුමන ස්ථානයකද කොරෝනා වෙනුවෙන් දෙන්නාවු වැක්සින් එක ලබා දීමට අපි මැදිහත් වීමේදි දේශපාලනික වශයෙන් ජනතාව පිඩාවට පත්කරලා දේශපාලනික අරමුණු මුදුන් පත් කරගන්න ගිය තැනක් තියෙනවා නම් ඔබ තමුන්නාන්සේලා නෙමෙයි ඉලක්කගත කරලා කියන්න මෙන්න මේ ස්ථානයේ මෙහෙම වුනා කියලා. නෑ කියන්න දෙවල් නෑ. මොරටු ජනතාවට වැක්සින් එක ලබා දීමේදි නගර සභාවක් තුලින් නගරාධිපතිවරයා විධියට ජනතාවගේ නායකයා විධියට ජනතාව විසින් ඡන්දෙන් පත්කරපු නගරාධිපතිවරයා විධියට ඔබගේ සේවය මන්ත්‍රීවරු කැටුව අංක එකටම ජනතාවට දිපු නිසා තමයි අද කොරෝනා වෛරසයෙන් යම්තාක් දුරට මොරටුව බේරිලා ඉන්නේ ගරු නගරාධිපතිතුමණි, ගරු මන්ත්‍රීවරුනි ඒවගේම ඔබතුමා මේ අතර වාරය තුලදි අපි දැක්කා අබිලි ද්‍රව්‍ය වලට යමින් තිබුණු රථ වාහන පවා මේ කාලය තුලදි අපේ ඉංජිනේරු අංශය යොදවාගෙන නැවත ප්‍රයෝජනයට ගන්න පුලුවන් අයුරින් එවා සකස් කරලා මහ නගර සභාවට මුදල් ඉතිරි කරලා දිලා ජනතාවට හොඳ සේවයක් සැපයීමට ඔබ කටයුතු කලා. කසල කළමණාකරනය කියන්න ඔන නිසා තමයි මේ ගොල්ලෝ කසල කළමණාකරනය හොදයි කිය කිය එකෙත් පොඩි පොඩි අඩුපාඩු හොයනවා. අපි දැක්කා කසල කළමණාකරනය මේ අවස්ථාවේදි මෙතන සිදුවෙන කොට කොරෝනා ව්‍යසනය තියෙන කොට කොරෝනා හැදුණු නිවසට පවා වෙනමම විශේෂිත වූ රථයක් යවමින් විශේෂිත වූ පුද්ගලයින් යවමින් සේවකයන් යොදවමින් ඔවුන්ගේ ජීවිත අවධානම නොතකා ඔබගේ ජීවිත අවධානම නොතකා මේ සේවය ජනතාවට ලබා දුන්නේ ජනතාවාදී නායකයෙක් හා ජනතාවාදී නගර සභාවක් මොරටුව තුල ස්ථාපනය වෙමින් පවතින බව තිබෙන බවට ජනතාවට ඔප්පු කරමින් එ නිසා එ කාලය තුලදි මම කිව යුතුම කාරණයක් තියෙනවා. මම නියෝජනය කරන මොරටුමුල්ල කොට්ඨාශය ඇතුලු එ ප්‍රදේශය තුලදි මේ කොරෝනා ව්‍යසන කාලය තුලදි ජනතාව ඉතාමත් අපහසුතාවටය පත්වුණා. විශේෂයෙන්ම වඩු කර්මාන්තයේ යෙදෙන විශාල පිරිසක් වඩුකාර්මිකයන් වඩු මඩු හිමියන් විශාල පිරිසක් අපේ ප්‍රදේශයේ හිටියා එ අවස්ථාවේදි ඔබ නිර්භිතව ඉදිරිපත් වෙමින් ජනතාවගේ නිෂ්පාදනය කරන ලි බඩු දිවයිනේ හැමතැනටම බෙදාහැරිය හැකි අන්දමින් පර්මිට් ක්‍රමය යොදාගෙන ජනතාව අපහසුතාවයට පත්වෙන තැන්වලින් මුදවෙලා දිලා ඔවුන්ගේ ජන ජීවිතය ඉදිරියට ගෙන යැම සඳහා ඔබ අවකාශය ලබා දුන්නා අපි දැක්කා.

ගරු නගරාධිපතිතුමනි, සමහරක් අවස්ථාවලදි අපිට හිනා යනවා භූමියේ ජනතාව අපිත් එක්ක නැහැයි කියලා කියනකොට අද වෙක් කොමිස් එකේ ගානට වැටිලා

තියෙන ජනතා විමුක්ති පෙරමුණ ගැන ජනතා විමුක්ති පෙරමුණ හැමදාම දැක්කේ අඩුපාඩු විතරයි.නමුත් ඔවුන්ට ඔවුන්ගේ අඩුපාඩු පෙන්නේ නෑ. ඔවුන් මේ අවස්ථාවේදිත් කරන්නේ යම් කිසි ක්‍රියාදාමයක් සිදුවෙමින් පවතිනවානම් එ ක්‍රියාදාමය හොද ක්‍රියාදාමයක් නම් ඔවුන් මැද්දට පැනලා විෂබීජයක් දාලා එතනින් දානවා. ඔවුන්ගේ ඔලුවේ තමයි තියෙන්නේ ලබන පාර එළියට යනවා කියලා. නමුත් නොබියව ප්‍රකාශ කරන්න ඕන අපේ කොට්ඨාශවල මේ කාල වකවානුව තුල ජනතාවට අවශ්‍යවන්නාවූ නගර සභාවලින් සිදුවිය යුතු සුබසාධක සේවා සහ යටිතල පහසුකම් සංවර්ධනයට අමතරව ඔවුන්ගේ මානසික සංවර්ධනය සහ ඔවුන්ගේ සුවතාවය පිළිබඳ සොයා බැලීමට ඔබ ඇතුලු නාගරික මන්ත්‍රීවරු ඉදිරිපත්වෙලා මේ සියලු සේවා සපයලා තියෙන නිසා ඊළඟ වසරේ අපි මොරටුව මහා නගර සභාව තුනෙන් දෙකක බලයකින් ජයග්‍රහනය කරන බව ප්‍රකාශයට පත්කරමින් මා ඇතුලු මාගේ මොරටුමුල්ල ජනතාවගේ සුභ පැතුම් මෙම අයවැයට ඉදිරිපත් කරමින් ඉතාමත්ම සුභ අනාගතයක් සහිත වසරක් බවට පත්වේවා මිලග වසර

ඒ වගේම ලබන්නාවූ නත්තල එ කිතුණුබැතිමතුන්ට සුභ නත්තලක් වේවා. සුභ අලුත් අවුරුදුදක්වේවා. සුභම සුභ අනාගතයක් වේවායි ප්‍රර්ථනා කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමන්ගේ 14 වන අයවැය වන අතර, මාගේ 4 වන අයවැයයි. ප්‍රථමයෙන් මා මේ තැනට ගෙන එමට අතහිත දුන් සහය දුන් අගුලාන කොට්ඨාසයේ ජනතාවට මාගේ ස්තුතිය ප්‍රකාශ කරන අතර, 2021 වර්ෂය ගැන නැවත හැරි බලන කොට ඉතාමත් පිඩාකාරී තත්ත්වයෙන් නිම වූ වසරක් හැටියට මේ වසර හදුන්වන්න පුළුවන්. ඒ මන්ද කොරෝනා ව්‍යසනය මාධ්‍යයේ ගැටුණු වසරක් විධියට මෙම අවුරුද්ද හදුන්වන්න පුලුවන්. එනමුත් ඔබතුමාගේ මැදිහත් වීමෙන් එ කොරෝනා කමිටු කැදවලා ජනතාවගේ ප්‍රශ්ණ සොයා බලලා අප සමග සාකච්ජා කරලා එ අවශ්‍ය කටයුතු ඔබතුමා සිදු කරා. වෛද්‍ය ජංගම රථ යොදවලා රෝගින් පරීක්ෂා කරලා එ රෝගින්ට බෙහෙත් ලබා දිලා එම කටයුත්ත ඉතාම සාර්ථකව ඔබතුමා සිදු කලා. ඒවගේම ජීවත් වීමට අපහසු දිළිදු ජනතාවට ඒ වියළි ආහාර ලබා දිලා එමගින් ඔවුන් ශක්තිමත් කලා. එවගේම බාධක මැද ජනතාවගේ සේවා කටයුතු අපි බෝහොම සාර්ථකව සිදු කලා.කාණු පද්ධති පිරිසිදු කිරීම් ළමා මාතෘ සායන ළමා උද්‍යාන අස්කිරීම් එවගේම සුසාන භූමි අස්කිරීම් එ කටයුතු අපි ඉතාම සාර්ථක අන්දමින් සිදුකරනු ලැබුවා. එවගේම මේ විදුලි අංශයේ කටයුතු ඔබතුමාගේ මැදිහත්වීමෙන් දුල්සිරි මහතා එ වකවානුවේදි අපිට විශාල සේවාවක්

ලබා දුන්නා. ඔබතුමාගේ 2022 වර්ෂයේ අයවැය පිළිබඳ කථාකිරීමේදී සෞඛය සුබසාධක කටයුතු, කුණු කසල මෙහෙයවීම එ වගේම භෞතික සැලසුම් මහජන උපයෝගිතා සේවා ඉතාමත් ක්‍රමවත්ව මොරටු ජනතාවගේ සුබසිද්ධිය සහ සංවර්ධනයට සැකසූ අයවැයක් හැටියට අපිට මේ අයවැය හදුන්වන්න පුලුවන් අගුලාන කොට්ඨාශයේ මන්ත්‍රීවරයා විදියට ජනතාවගේ සුබසිද්ධිය සඳහා ඔබතුමන් සැකසූ මේ අයවැයට මාගේ පක්ෂපාතිකත්වය පුදකරමින් ලබන්නාවු නව වසර එවගේම ලබන්නා වූ නත්තල ඔබ සියලු දෙනාට සාමය සතුට පිරි සුබ නත්තලක් හා සුබ නව වසරක් වේවායි කියලා ප්‍රර්ථනා කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම මාගේ 4 වෙනි අයවැයටයි මේ සහභාගිවෙන්නේ එවගේම ඔබතුමාගේ 14 වෙනි අයවැය ඔබතුමාගේ 14 වෙනි අයවැය පිළිබඳ ඔබගේ පක්ෂයේ අය කථා කරද්දි තනිකරම මේ කසල කසල කසල කසල ගැනමයි කථා කරේ මේ අයවැයත් කසලම කසල අයවැයක් කියලා මම මුලින්ම කියනවා. ගරු නගරාධිපතිතුමනි, මම මුලින්ම ඔබතුමාගේ අවධානය යොමු කරනවා පිටු අංක 81 වැය ශීර්ෂය 1301 වෙත යොමුකරන්න කැමතියි. එම ක්‍රීඩාංගන නඩත්තු වියදම් වෙනුවෙන් 2021 අයවැයෙන් වෙන් කරලා තිබුණා මිලියන 3 ක්. නමුත් ඒ වෙන්කල මුදලින් නමවෙනි මාසේ 30 වෙන කොට වියදම් කරලා තිබුණේ සියයට 10 ක් පමණයි.බජට් එකේ මුදල් තිබුණාට ඔබතුමන්ලාට කරන්න දේවල් නෑ. මම මේ ක්‍රීඩාංගන කිහිපයක් පිළිබඳ කථාකරන්න හිටියා මගේ සහෝදර දිලාශිණි මන්ත්‍රීතුමිය සොයිසාපුර ක්‍රීඩාංගනය පිළබඳ කථා කලා.

ගරු නගරාධිපතිතුමනි, මැටිවත්ත ක්‍රීඩාංගනය ඩික්සන් ජේ පිරිස් ක්‍රීඩාංගනය අද තියෙන තත්ත්වය පෙනවා.එම ක්‍රීඩාංගනයේ දුර්වලකම් මම ක්‍රීඩා කමිටුවේ ඉන්න කොට මම දිගින් දිගටම කිව්වා. මිලියන 3 ක් තිබ්ලා තියෙනවා. මිලියන 3කින් ඔබතුමාට කරගන්න බැරිවෙලා තියෙනවා. ඔබතුමාගේ නොහැකියාව තමයි ඒකෙන් පෙන්නේ ඔබතුමා මහ ලෝකුවට කියනවා අයවැය 14 ක් දුන්නා කියලා. ගරු නගරාධිපතිතුමනි, මේ ක්‍රීඩාංගනයේ ක්‍රීඩාගාරය අබලන්වෙලා තියෙනවා කඩන්වැටෙන්න ඔන්න මෙන්න. ඔබතුමාගේ නොහැකියාව අපි දිගින් දිගටම කිව්වා. නැත්නම් මේ ක්‍රීඩාකමිටු සභාපතිවරයාගේ නොහැකියාව. ක්‍රීඩාංගනයේ වැසිකිලියක් නෑ මේවායින් තාමත් නගර සභාව ආදායම් ලබනවා මෙ ක්‍රීඩාංගන වල ළමා උද්‍යානයක් තියෙනවා. ළමා උද්‍යානයට වෙලා තියෙන තත්වය අපිට අද ගියාම පෙනවා. පොඩි ළමයෙකුට යන්න තැනක් නෑ. ගරු නගරාධිපතිතුමනි, මම යොමු කරනවා පිටු අංක 28හි 1206 නිල ඇදුම් සම්බන්ධව ඔබතුමා 2021 වර්ෂය සඳහා

අයවැයෙන් වෙන් කරලා තියෙනවා. ලක්ෂ 52 ක් නමුත් ඔබතුමා ලක්ෂ 3ට ත් අඩු මුදලක් තමයි වියදම් කරලා තියෙන්නේ. ඔබතුමා 2022 වර්ෂයට ලක්ෂ 62 ක් වෙන් කරලා තියෙනවා. මම දන්න විදියට 2018 විතරයි මේ නිළධාරින්ට ඇදුමක් ලැබුණේ. චක්‍රලේඛනයෙන් ඇවිල්ලා තියෙන්නේ මේ රාජ්‍ය සේවකයන්ට නිළ ඇදුම් දෙන්න කියලා. චක්‍රලේඛනයෙන් ඇවිල්ලා තියෙන එක ඔබතුමා දෙන්නේ නෑ. අපි ඔබතුමාට කියනවා මින් ඉදිරියට මේවා වෙන්න දෙන්නෑ. ඔබතුමාට බැරිවුනා මේ පාරේ රථවාහන ප්‍රශ්ණය විසඳන්න රථගාලක් හදන්න ඔබතුමාට බැරිවුනා. අපේ ඉරාන් මැතිතුමාගේ ඉල්ලිම මත චම්පික ඇමතිතුමා රථගාලක් හදලා දුන්නා එ හදලා දුන්න රථගාලවත් විවෘත කරගන්න බැරි නගරාධිපතිතුමා ඔබතුමා ෆේල්. ඔසද මන්ත්‍රීතුමා කිව්වා 2022 ඔබතුමාව ඔතන තියන්නෑ කියලා. අපිට සැකයක් ඇතිවෙනවා ඇතුලේම කුමන්ත්‍රණයක් තියෙනවාද කියලා. ඔබතුමා මොරටුවට ප්‍රශ්ණ ගොඩක් තියෙද්දි ඔබතුමා ඔබතුමාගේ සංවත්සරයක් වෙනුවෙන් ලිෆ්ට් එකක් හදනවා. අර පඩිපෙල නගින්න බැරි ජනාධිපතිතුමාට නගින්න. ස්භාවධර්මය එකට හොද උත්තරයක් දුන්නා. ඔබතුමාගේ උත්සවය තියන්න හම්බවුනේනෑ. මොරටුවේ බදු ගෙවන මිනිස්සුන්ගේ සල්ලි පඩිපෙල් දෙකක් නගින්න ලිෆ්ට් එකක් හදලා අපරාදෙ සල්ලි වියදම් කරලා තියෙනවා. ඔබතුමා මොනවාද මේ කරන්නේ අයවැයෙන් වෙන්කරලා තියෙන එවා කරන්න ඔබතුමාගේ අයත් දිගින් දිගටම ලිහිණි මන්ත්‍රීතුමියට අපහාස කරනවා. එතුමියගේ වෘත්තියට අපහාස කරන්න එපා කියලා ඉල්ලා සිටිනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - පී. අශෝක ඉන්ද්‍රතිලක පුනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ අයවැයේ ඉලක්කම් හුවමාරුව ගැන කථා කරනවා මිසක් අපි කරපු වැඩ ගැන කවුරුත් කථා කරන්නෑ. මොරටුවට ඔබතුමාගේ නායකත්වයෙන් විශාල වැඩකොටසක් කරලා තියෙනවා. ඡන්දයක් දිනාගන්න බැරි මිනිස්සු කොටියාසයෙන් මෙතන ඇවිල්ලා සිංහයෝවගේ කථා කරනවා.කථා කරන්න ඡන්දයක් දිනලා ඒන්න ඕන. ඔබතුමන්ලා කථාකරනවා නගරාධිපතිතුමා සල්ලි වියදම් කරපු එකක් ගැන. නගර සභා ආඥා පනතේ පුන්‍ය කොමසාරිස් කෙනෙක් ඉන්නවා. නගර සභාවක පුන්‍ය කොමසාරිස් කෙනෙක් නැත්නම් කොමසාරිස්ට බලය තියෙනවා. වියදම් කරන්න මොරටුවට වැඩ කෙරුන් නැද්ද කියලැ අපි අහන්න ඕන. අඩුපාඩු තියෙනවා එක වෙනම කථාවක් සභාවට අපහස කරන්න එපා. නගර සභා ආඥා පනතේ ප්‍රධාන විධායකයා නගරාධිපතිතුමා හොද දේට හොදයි කියන්න මොරටුවට විශාල වැඩ කොටසක් කරලා තියෙනවා. එක්සත් ජාතික පක්ෂයටත් ගානක් හම්බවෙනවානේ වියදම් කරන්න. මෙතන ඇවිල්ලා බනිනවා බනින්න එපා. අයවැය හොදද නරකද නෙමෙයි මොරටුවට කරපු වැඩ ගැන

කථා කරන්න. මොරටුවට විශාල වැඩ කොටසක් කරලා තියෙනවා පාරවල් හදලා තියෙනවා.මේ අයවැයට අපේ පක්ෂපාතිකත්වය පලකරනවා ස්තුතියි.

<u>මහ නගර සභා මන්ත්‍රී - යූ. ලලිත් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ 14 වෙනි අයවැය මගේ 4 වෙනි අයවැය මේ 14 වෙනි අයවැයේදි මැතිවරණ කීයක් ආවද? මැතිවරණ තුනයි. තුනටම පරද්දගන්න බැරිව තව මොනවද අනේ මේගෝල්ලෝ කියවන්නේ. ඔය ගෝල්ලෝ ජන්ද පරද්දන්න බැරිව මෙතන පරද්දන්න පුලුවන්ද? ඒක කරන්න බැහැනේ. ඒක නිසා නිහඬ වෙන්න. මම 2022 අයවැයට සම්පූර්ණ සහය දක්වමින් නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.සුනිල් නන්දසිරි මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම ස්තුතිවන්ත වෙනවා මෙන්ම කලින්ම ඔබතුමාට විශේෂයෙන්ම මම කණගාටුවට පත්වෙනවා. කණගාටු වෙන්නේ මොකක්වත් නිසා නෙමෙයි. මම නගර සභාවේ අවුරුදු 30 ක කාලය තුල මම ගොඩක් අයට පුද්ගලිකව උදව් කරපු කෙනෙක්. සමහර වෙලාවට ආසනයක් ගන්නත් අමාරු වුනා. අපිට එ කාලේදි කොහොම කථා කලත් මම හිතන්නේ නගර සභාවේ අයවැයට කවුරුත් කියනවා සම්ප්‍රදායික අයවැයක් කියලා. අනිවාර්යයෙන්ම අයවැයක් සම්ප්‍රදායික තමයි.ඕනෑම තැනක අයවැට ඒන්නේ ඉලක්කම් එහා මෙහා විමකින්. අවුරුද්දෙන් අවුරුද්දට එන සම්ප්‍රදායික අයවැයක් තමයි ඔබතුමා මෙ කරලා තියෙන්නේ. එ අනුව මම හිතන්නේ සමහර අවස්ථාවලදි මට මතක් වෙන්නේ මම ඉන්න ඔන විපක්ෂ නායක හැටියට.නමුත් මම කණගාටුවෙන්නේ නෑ. හොද මනුස්සයේක් ආව නිසා.ගරු නගරාධිපතිතුමා එතුමාව පැරැද්දුවේ 2006 දි. එත් අපේ කට්ටිය.දැන් කව්රු උදම් ඇණුවත් කව්රු කැගැහුවත් . මනාප ඡන්දයක් ආවනම් මම කවුද කියන එක ඔබතුමා විතරක් නෙමෙයි මේ කව්රුත් සාන්ෂි දරයි.මොකද මනාප ඡන්ද 4 කදිම හා 2011 ඡන්දය ගත්තෝතින් නගරාධිපති උප නගරාධිපති මන්තුවරු ගණනාවක් එළියට දාලා මම 8 වෙනියාට ආව කෙනෙක්. නවදෙනෙක් පත්වෙද්දි ද 1997 සිට මම ඉන්නේ. කණගාටුවේන්නේ මෙන්න මේ නිසයි. සමහර අවස්ථාවල ඔබතුමා එක්කත් රණ්ඩු කරන්නේ කැගහගෙන යන්නේ නිකන් නෙමෙයි. සමහර වෙලාවලදි ගොඩක් ප්‍රශ්ණ ඇතිවෙනවා.

ගරු නගරාධිපතිතුමනි, සභාවටමේ ලගදි සර් කෙනෙක් ආවා. ඔබතුමත් දන්න සමහර අංශවල වැඩ කෙරුවාව තුල නගරාධිපතිතුමා මිනිස්සුන්ට ගරු කිරිමක් නෑ කථා කරන්න දන්නෑ. වරිපණම් අංශයේ, මිශ්‍ර ආදායම් අංශයේ වැඩක් කරගන්න ඇවිල්ලා ඔයා මේයා කියලා කථා කලේ. මගේ මුහුණ දිලා බලලා ඇයි දරුවෝ මෙහෙම වෙන්නේ කියලා එතුමා අහනවා. එනිසා නගරාධිපතිතුමණි මම ඔබතුමාගෙන් ඉල්ලිමක් කරනවා කළමණාකරන කමිටුව තුලදි හෝ ගරු කොමසාරිස්තුමා ඒ ගැන හිතලා ඒ අයට උපදේස් දෙන්න. හැම අංශයෙන්ම එවගේ. කර්මාන්ත අංශයේ මම ඉංජිනිය නෝනටත් කිව්වා. කලින් අපේ වැඩක්වත් අපිට කරගන්න බැරිවෙලා තියෙනවා. සමහර වෙලාවට එක බලන්න ඔන අනිවාර්යෙන් මොකවත් නිසා නෙමෙයි. නගර සභාව කුණු ඇදිමෙන් ලංකාව තුල හොද ස්ථානයක ඉන්නවා. අපේ නගර සභාවේ විතරයි කුණු අදින්නේ. වෙන කොහෙවත් නෙමෙයි. කසල කියන්නේ නගර සභාව එනිසා එ දෙවල් කිරිමට හැමවෙලාවේම අපි සහය ලබාදිලා තියෙනවා. එදා මෙදා තුල මම පිටිපස්සේ ඉදලා ඉස්සරහට ආව මණුස්සයෙක්. එ නිසයි මම ඉල්ලිමක් කරන්නේ . අපි කව්රුත් වැඩ කරන්න ඔන. වැඩ කිරිමේදි කකුලෙන් අදින්න එපා. කව්රු කලත් වැඩේ හොදනම් හොදයි කියන්න. නරකනම් නරකයි කියන්න. කිසිදෙයක් නොදැන නිකම් කැකොස්සන් ගහන්න එපා. සභාවට ඔබින්නැති විධියට නිලධාරින්ට කථාකරන්න එපා කියලා. නවක මන්ත්‍රිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. රංගශාලාවක කථාවක් ආවා ටිරෝන් ප්‍රනාන්දු මන්ත්‍රිතුමා 1991 ඇතිකරන්න ගිය එකක්. එක ඇතිකරන්න හේතුව මොරටුවේ

සර්වෝදය ශාලාවට ගියත් විශාල මුදල් අය කරනවා. එවගේම තමයි ගරු නගරාධිපතිතුමණි, විශේෂයෙන්ම අපි කථාවක් කරන්නේ එ කථාව සිමා කරන්න එපා. මම එදා ඉල්ලිමක් කලා ඔබතුමාට එ ජී ඔෆිස් එක ගාව තියෙන වාහන පාර්ක් කිරිමට ස්ථානයක් සම්බන්ධව හා අපේ නගර සභාව ඉදිරිපිට හෝන්ස් වගයක් තියලා තියෙනවා. ඒ හින්දා මිනිස්සුන්ට ඉන්න තැනක් නැහැ. එතකොට පොලිසිය ගිහිල්ලා ලියනවා. පොලිසියත් සමහර වෙලාවට ඔබතුමත් එක්ක ප්‍රශ්ණ ඇතිකර ගන්නවා. මගේ පක්ෂය පිරිමි පක්ෂය. මම පිරිමි පක්ෂයෙන් වැඩ කරනවා. හේතුව තමයි අපි කැම ටික කලා අපේ දිමනාව අරගෙන වැඩ කරපු නිසා තමයි මම මනාප ඡන්දවලින් ඉතාම උඩින් ආවේ. පක්ෂ විපක්ෂ කව්රුත් දන්නවා මම කවුද කියන එක. නිලධාරිත් දන්නවා. අපි කවදාවත් වංචාවක් දුෂණයක් සිදු කරලා නැහැ. අපි ඇවිල්ලා ඉන්නේ සේවය කරන්න. චේතනයක් ගන්නවා චේතනයට වැඩකරන්න අපිට පඩියක් නෙමෙයි දිමනාවක් දෙන්නේ මිනිස්සුන්ට වැඩකරන්න. මේ අයවැයේදි මට කියන්න කිසිම දෙයක් නෑ. 19 කථාව මේ තියෙන්නේ කව්රුත් බලාපොරොත්තු වුණා මම 18 නවති කියලා ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා. හේතුව තමයි මමත්

බලාපොරොත්තු වුනේ නැ ගොඩක් අය ගියා නමුත් රනිල් වික්‍රමසිංහ මැතිතුමාටම දෙදෙනෙක් කථා කලා. මමත් කථා කලාට පස්සේ කිවුවේ ඔහොම යන්න කියන කථාව විතරයි. විශේෂයෙන්ම අපිව වට්ටන්න මම හිතන්නේ නැහැ එහෙම කරන එක සාධාරණයි කියලා. මොකද හේතුව මම ඉස්සේල්ලා කියපු කථාව නැවතත් කියන්නම්. මම පිටිපස්ස හැරිලා බැලුවොත් හැම කෙනාටම මම පුද්ගලිකව උදව් කරපු කෙනෙක් හැම පවුලකටම උදව් කරලා දිලා තියෙනවා. නමුත් සමහර වේලාවට මගේ මුහුණවත් බලන්නැතිව කට්ටිය යන අවස්ථා තියෙනවා. කථා කරන්නැතිව යන අවස්ථා තියනවා. අපි එවා ගණුන් ගන්නේ නැහැ. මේගෝල්ලන්ගෙන් ඉල්ලා සිටිනවා මම ඉල්ලිමක් කරනවා වැදගත්වෙන්නේ මුල අමතක කරන්න එපා කියලා. මතකය අපිට අමතක වෙන්න නරකයි. මම ඔනෑ කමින් ඉල්ලා සිටින්නේ හරියට ජීවත්වෙන්න හරි කෙනාට උදව් කරන්න. ජීවිතයම අපි දාලා යනවා එනිසා එ සියල්ල වෙනුවෙන්ම ඉතා හොඳින් බලන්න කියලා ඉල්ලා සිටිමින් අපේ නගරය දියුණු කරන්න කව්රුන් හෝ කරනවානම් එකට උදව්කරන්න කියලා ඉතා ඔනෑකමින් ඉල්ලා සිටිනවා. එකට හොඳම උදාහරණය තමයි 2004 දි සුනාමිය වේලාවේදි රවිනාත් ජේ ගුණසේකර මැතිතුමන්ට ඔබතුමා උදව්කරා. එනිසා මම නැවතත් එ පිළිබඳව මතක් කරමින් ලබන්නාවු නව වසරත් කිතුණුබැතිමතුන්ට සුභ නත්තලක් වේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.ඩබ්.ඩී.රන්දූ නිරෝෂණ මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ මාගේ නමවන අයවැය කථාවයි. ගරු නගරාධිපතිතුමණි පසුගිය වසර දෙක ගත්තොත් මුලු රටක් හා මුලු ලෝකයටම වසංගත තත්ත්වයකට මුහුණ දිලා එකෙන් බැටකමින් සිටින අවස්ථාවක පසුගිය වසරේත් අපි අයවැය යෝජනා හැටියට ඉදිරිපත් කරපු යම් යම් යෝජනා ඔබතුමාට එවට එහා ගිය වැඩ කොටසක් කරන්න වුන වසරක් පසුගිය වසරේ අපි බලාපොරෝත්තු නොවූ ලෙස වැඩිවීම නිසා මේ කොවිඩ් රෝගයට ගොදුරුවෙන මොරටුව ජනතාව වෙනුවෙන් ඉමහත් වැඩ කොටසක් කරා කියලා අපි එක ඇස්දෙකෙන්ම දැක්කා.එන්නත්කරනය කොවිඩ් රෝගින්ව ප්‍රවාහනය විෂ බිජ හරනය කිරීම විවිධ වූ කාරණා කරන්න සිද්ධ වුනු වසරක්.විපක්ෂය තේරුම් ගන්න ඔන අපිට සිද්ධ වුනේ කොවිඩ් එක්ක සංවර්ධනය කරා යන්න අපේ ජනතාව ආරක්ෂා කර ගන්න මම හිතන්නේ එක අපි කරා.එක ඔබතුමා කරා එ කරාවු සේවයට අපේ සුබ පැතුම් අපේ ස්තුතිය පිරිනමනවා.පසුගිය වර්ෂයේ කරන්න බැරිවුණු දේ 2022 වර්ෂයේ කිරිමට ඔබතුමා යෝජනා කරනවා.එවගේම පසුගිය වසර තුල කසල කළමණාකරණයෙන් අපි ප්‍රථම ස්ථානය ලබාගෙන තියෙනවා.නගර සභාවක් හැටියට අපිට ප්‍රධාන වශයෙන්ම කරන්න තියෙන්නේ කසල වලට අදාල කරුණු ඔබ නොම්බර එකට ඉටු කලා.එ

සම්බන්ධවත් ඔබතුමාට ස්තුතිය පුදකරනවා.මොරටුවේ යම් යම් වැඩසටහන් වලට ඔබතුමා යොමුවෙලා එ කටයුතු

කලා.සියලුම නාගරික මන්ත්‍රීවරුන්ට ඔබතුමා සහයෝගය දුන්නා වැඩ කරගෙන යන්න. ගරු නගරාධිපතිතුමණි එලඹෙන 2022 වර්ෂයේ කොවිඩ් පරාජය කරලා මොරටුව සංවර්ධනය කරා ගෙන යද්දි යම් යම් වැඩ කොටසක් කරන්න වෙනවා විශේෂයෙන්ම බොල්ගොඩ ගඟ මම නියෝජනය කරන මෝල්පේ කොට්ඨාශය සංචාරකයන් ආකර්ෂණය කරන්න පුලුවන් වපසරියක් හැදිලා තියෙනවා.ජල ක්‍රීඩා ඇතුලු සංචාරක පහසුකම් සපයන ආයතන ගණනාවක් මෝල්පේ තුල ස්ථාපනය වෙලා තියෙනවා.ඔවුන්ටත් යම් සහනයක් අපිට ලබන වසරේදි ලබා දෙන්න පුලුවන්නම් මම හිතන්නේ එක කාලෝචිතයි.ප්‍රභූවරු එ මෝල්පේ කොට්ඨාශයේ තියෙන සංචාරක නිකේතන ජල ක්‍රීඩා කරන ස්ථාන වලට පැමිණෙමින් සිටිනවා.ඉදිරියෙදි සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කරද්දි එ සදහා අපිට මොරටුව යොමු කරන්න පුලුවන් ඔවුන්ගේ ඉල්ලිමක් තිබ්බා ජපන් ජබර ඉවත් කරන්න අපිට සහයෝගයක් දෙන්න කියලා.ජපන් ජබර අරගෙන කොම්පොස්ට් පෙහොර නිෂ්පාදන ආයතන වලට දෙන්න පුලුවන් එතුලින් අපිට ආදායමක් එනවා වගේම එම සංචාරක ව්‍යාපාරයට අදාල ප්‍රදේශ දියුණු කරගන්න පුලුවන් මෝල්පේ හා විල්ලෝරාවත්ත ප්‍රදේශ අපිට එ සදහා යොමු කරගන්න පුලුවන් මම ලී බඩු ව්‍යාපාරයේ යෙදෙන කෙනෙක් හැටියට ගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා ගත්ත එ ඍජු තීන්දුව පිට රටින් ආනයනික දැව භාණ්ඩ ගෙන්වීම සම්පූර්ණයෙන්ම නතර කලා. අපේ ව්‍යාපාරයට සම්බන්ධ දැව භාණ්ඩයට හොඳ මිලක් ලැබිලා තියෙනවා එ වගේම ඉහල ඉල්ලුමක් ලැබිලා තියෙනවා.මීට අවුරුදු කිහිපයකට ඉහතදි නිෂ්පාදනය කරපු භාණ්ඩ නෙමෙයි මම දැන් නිෂ්පාදනය කරන්නේ ලිහිණි මන්තිතුමිය හිටියනම් එතුමියත් මේකට සාක්ෂි සපයයි.මොකද එතුමියගේ මහත්තයත් එසම්බන්ධ ව්‍යාපාරයක් කරන්නේ අපිට අද පිට රටින් ගෙන භාණ්ඩ නිෂ්පාදනය කරන්න පුලුවන් වෙලා තියෙනවා.ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා දුන්න සහයෝගයෙන් අද මොරටුවේ ව්‍යාපාරිකයන්ට හොඳ කලක් ගිහින් තියෙනවා.අපේ ස්තුතිය ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට පුදකරන්න ඔන යම් අවස්ථාවක නැවත පිටරටින් ලීබඩු ගෙන්න හැදුවොතින් ඔබතුමා එයට විරුද්ධ වෙලා මේ මොරටුවට නැගිඑන අපේ ව්‍යාපාරයට රුකුලක් ලබාදෙන්න කියලා ඉල්ලා සිටිනවා. එක වඩු කර්මාන්තයේ නියුතු ජනතාවට ගන්න ඉමහත් තීන්දුවක් වෙනවා.තවත් වසර ගණනනාවක් කතාකරයි ඔබතුමා ගැන මේ සම්බන්ධයෙන් දක්වන සහයෝගය ගැන මේ ව්‍යාපාරය කරගෙන යනකොට සේවක ප්‍රශ්ණයක් අපිට ඇති වෙලා තියෙනවා.විශේෂයෙන්ම මෙ වඩු කර්මාන්තයට එනිසා ඔබතුමාට යම් හැකියාවක් තියෙනවානම් නෙටා ආයතනය එවගේම ජර්මන් ටෙක් ආයතනය වැනි

ආයතන වලින් ඔබතුමාට හැකියාවක් තියෙනවානම් පුහුණු ශ්‍රමිකයන් අපිට ලබා දෙන්න සහ එවගේම ශ්‍රමිකයන් පුහුණු කිරීමට ස්ප්‍රෙ තාක්ෂණය කුෂන් තාක්ෂණය යුයුබ් ෆේස් බුක් වල දකින නිර්මාණ අපිට මොරටුව තුල කරන්න අවශ්‍යයි.ශ්‍රමිකයන් පුහුණු කිරීමේ පාඨමාලාක් වැඩ මුලුවක් සංවිධානය කරලා එතුලින් අපෙ තරුණ තරුණියන්ට අවස්ථාවක් ලබාදෙන්න රැකිරක්ෂා ප්‍රශ්ණය යම්තාක් දුරකට විසඳෙයි. එවගේම යම් යම් වැරදි දෙවල් වලට යොමුවන තරුණ තරුණියන් ඔවුන් අතමිට මුදල් එන කොට ඔවුන් මං හිතන්නේ ව්‍යාපාර එක්ක සම්බන්ධවීම තුල තාක්ෂණික දැණුම සම්බන්ධවීම තුල ඔවුන්ගේ ජීවිතවලට හෙට දිනයේ හොඳ කලක් උදාවෙයි කියලා මම විශ්වාස කරනවා.මම නවවසරත් මේ අයවැයත් එක්ක මේ මොරටු මහා නගර සභාවේ නාගරික මන්ත්‍රී කෙනෙක් හැටියට ඉන්නවා.ඉදිරියෙදි අපිට ඔබතුමත් එක්ක එකතුවෙලා මෙ ගමන සාර්ථක කරගන්න විශේෂයෙන්ම 2022 වසර මේ කොවිඩ් වලින් තොර මොරටුවේ ඉදිරි අනාගතය සාර්ථක වන වැඩ පිළිවෙලක් ඔබතුමා ඉදිරිපත් කරා කියලා මම විශ්වාස කරමින් එසදහා මම නියෝජනය කරන ශ්‍රීලංකා නිදහස් පක්ෂය මා ඇතුලු මාගේ මොරටු ආසනයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක ගරු තිලංක සුමතිපාල මැතිතුමාගෙත් සුභාශිංශනයත් ඔබට එක්කරමින් මේ අයවැයට පක්ෂපාතිවෙමින් එවගේම 2022 වර්ෂය ස්යලු දෙනාට සුභ අලුත් අවුරුද්දක් වේවා සුභ නත්තලක් වේවා කියලා ප්‍රර්ථනා කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - යු.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ 14 වෙනි අයවැය මගේ 13 වෙනි අයවැය. ගරු නගරාධිපතිතුමනි, මම ඉස්සේල්ලාම පොඩ්ඩක් කියන්න ඕන ලිහිණි මන්ත්‍රීතුමිය කියපු දෙයකට එතුමිය කිව්වා. නගරාධිපතිතුමා ආවට පස්සේ ඔබතුමා මොනවද කලේ කියලා. ලිහිණි මන්ත්‍රීතුමිය 2002 - 2006 රවිනාත් ගුණසේකර නගරාධිපතිතුමා ඉන්න කාලේ කටුබැද්දේ හන්දියේ ඉදන් පිළියන්දලට යනකොට ඕනෑ ඇස් පේන්නැති මනුස්සයෙක්ට කියන්න පුළුවන් මේ පිළියන්දල ටවුම කියලා. එ කියනවා වගේම 2002 - 2006 වර්ෂ වලදි මුළු මොරටුවේම විශාල කුණු ගොඩක් තිබ්බේ. ඩෙංගු හැමතැනම, කුණු ගොඩවල් පාරක් පාරක් ගානේ මාස 6 කට වැඩි කාලයක් ගියා නගරාධිපතිතුමාට කුණු ටික අස්කරන්න. උදේ පාන්දර 5 ට එනවා. ඒවගේ සේවයක් කරේ නෑ කවුරුවත් එ කාලේ මට මතකයි රවිනාත් ගුණසේකරව වටකෙරුවා මිනිස්සු නගර සභාව ඇතුලේ එවගේ යුද්ධයක් වගේ කුණු තිබ්බා.

ගරු නගරාධිපතිතුමනි,මොරටුව හොඳ තැනකට ගෙනාවා. දැන් කුණු තියා ප්ලාස්ටික් බෝතලයක් හොයාගන්න තැනක් නෑ මොරටුව නගරය තුල එකට සන්තෝෂ වෙන්න ඕන. පක්ෂ විෂක්ෂ දෙපාර්ෂවයම මොකද මේතුමාගේ මොලෙන්

තමයි මේ වගේ දෙයක් කලේ. එවගේම අපේ දුල්සිරි මහත්තයා ඇතුලු කණ්ඩායම නගරාධිපතිතුමාගේ උපදෙස් මත නිවසක මළගෙයක් තියෙනවා නම් කොඩිටික දානවා. කාණු ටිම් එක දාලා කාණු ශුද්ධ කරලා දෙනවා. කරුවල තියෙන තැනට ප්ලැෂ් ලයිට් දාලා දෙනවා. අංශභාගය හැදිලා නැගිටින්න බැරි අයට ඉන්ජෙක්ෂන් එක ගෙදරට ඇවිල්ලා ගැහුවා. කරපු දෙවල් අපේ මිනිස්සුන්ට මතක නැහැ. එවගේම ගරු නගරාධිපතිතුමා මෝල පාරේ පලමුවෙන් කරන්න නගරාධිපතිතුමා ලක්ෂ 35 ක් දුන්නා එය හැදුවා. මේ වසරේ දැන් මාස 6 ක් ඇති විජේසිංහ මාවතේ කාණු පද්ධතියක් හැදුවා. අවුරුදු ගාණකට කාණු නෑ උඩ ඉදන් පල්ලේහාටම ටී අකුරේ ඉදන් දුන්නා. මෙය කරන්න කියලා සභාවේ මුදල් මොනදේ තිබ්බත් ගමට දෙයක් කරන්න අපිට ලැබිලා තියෙනවා. නගරාධිපතිතුමා කරපුදේ තමයි මොරටුවේ පෙන්න තියෙන්නේ. ඉතිහාසයේ කිසිම නගරාධිපති කෙනෙක් තුන්පාරක් නගරාධිපතිවෙලා නෑ. මොරටුවේ නෙමෙයි ලංකාවේවත් ජනතාව කෙරේ විශ්වාසයක් තියෙනවා. ඔබතුමාගේ වටිනාකම දන්න නිසා තමයි ජනතාව තුන්වෙන් පාරටත් ඔබව නගරාධිපති ලෙස පත්කලේ. ලබන්නා වූ වසර කිරියෙන් පැණියෙන් ඉතිරේවා. සුභම සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ.ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ මොහොතේදී අපිට කරන්න තියෙන්නේ ජනතාවට උපතේ සිට මරණය දක්වා මොරටුව මහ නගර සභාව විදියට කරන්න තියෙන දේ කරන්න. විශේෂයෙන්ම මොරටුවේ ජනතාවට සහ සම්බන්ධතාවයක් තියෙන ආයතනයක් තමයි මොරටුව මහ නගර සභාව කියන්නේ. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, අපිට තියෙනවා මොරටුවේ ක්‍රීඩාංගන කිහිපයක් ඒ ක්‍රීඩාංගනවල තත්ත්වය දිහා අද බැලුවොත් විශේෂයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඉදිබැද්ද ක්‍රීඩාංගනය හා මොරටුවේ තියෙන හැම ක්‍රීඩාංගනයක්ම ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. වර්තමාන තත්වය දිහා බැලුවාම ඒ වගෙම ගරු නගරාධිපතිතුමනි, රන්දු මන්තිතුමා කිව්වා ලී බඩු වලට හොඳ මිලක් ලැබිලා තියෙනවා කියලා. නමුත් නගරාධිපතිතුමනි, මේ මොහොතේදි මොරටුවේ වඩු කාර්මිකයා විශාල අපහසුතාවයකට පත්වෙලා තියෙනවා. විශේෂයෙන් ඉහල යන ලී මිල, ලී ගම්, ඇණ පිළිබඳව වඩු කාර්මිකයා හදන බඩුවට සාප්පු හිමියා දෙන මිල දිහා බැලුවාම සාප්පු හිමියා තමයි විශාල මුදලක් හිමිකරගන්නේ වඩු කාර්මිකයාට සහන සැලසිම සම්බන්ධයෙන් ඔබතුමාට විශාල කාර්යය භාරයක් තියෙනවා.එවගේම තමයි ගරු නගරාධිපතිතුමණි රන්දු මන්ත්‍රීතුමා කිව්වා 2002 2006 කාලේදි රවිනාත් ගුණසේකර නගරාධිපතිතුමාගේ කාලේ කුණු ගොඩවල් මොරටුවේ තිබුණා කියලා අපි පෞද්ගලිකව එය දන්නවා.

සමාවෙන්න සුදත් මන්ත්‍රීතුමා සඳහන් කලේ ආණ්ඩුපක්ෂය නියෝජනය කරේ අපි විශාල කුණු කදු තිබුණා. අපිට නැහැ කියන්න බෑ. ගරු නගරාධිපතිතුමනි, අපිට කුණු කසල දාන්න තැනක් තිබුණේ නෑ රවිනාත් නගරාධිපතිතුමාගේ අන්තිම කාලේ තමයි අපිට කුණු දාන්න වත්තක් හම්බවුනේ කුණුවත්තට ගිවිසුම් ඇතිකරගෙන විශේෂයෙන් පළාත් පාලන ඇමති ජනක තෙන්නකොන් ඇමතිතුමත් එක්ක එ සම්බන්ධතාවය ඇතිකරගෙන ඒද්දි තමයි බල පෙරලිය ඇතිවෙලා ඔබතුමාට එ අවස්ථාව ලැබුණේ. ඔබතුමා විශාල පරිශමයක් ගත්තා මොරටුවේ කැලි කසල ඉවත් කිරීම සම්බන්ධයෙන් අවිවාදයක් නැහැ.

ගරු නගරාධිපතිතුමනි, සේවක ප්‍රශ්ණය නගර සභාවේ සමහර සේවකයෝ ඉන්නවා කාඩ් එක ගහන්නවත් එන්නේ නෑ. කාඩ් එක ගහන්නේත් වෙන සේවකයෙක් නමුත් මාසේ අන්තිමට ඇවිත් පඩිය ගන්නවා දීමනාව ගන්නවා. අපිට ආයුබෝවන් කියලා යනවා.මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමුකරන්න ඕනෑ මගේ ඥාතියෙක් කිව්වා ඔයගෝල්ලෝ හැමදාම නගර සභාවට යනවා නගර සභාවේ සේවකයෝ මෙහේ ට්‍රැක්ටර් එලවනවා, ලි කපනවා, ලි පටවනවා වඩු මඩුවේ වැඩ සේවකයා තමන්ගේ සේවය නෙමෙයි කරන්නේ භාහිර සේවාවන් ඉෂ්ඨ සිද්ද කරනවා. ඔබතුමාගේ ඉදිරි කාලේදි විශේෂ අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. එවගේම ගරු නගරාධිපතිතුමනි, ඉලක්කම් හරඹ ගැන මම කථා කරන්නේ නැහැ නගරාධිපතිතුමාට බලය තියෙනවා අවශ්‍ය අවස්ථාවේදි තින්දු තිරණ ගන්න නමුත් කොවිඩ් ව්‍යසනයේදි නගර සභාවෙන් ජනතාවට අපි කරන්න ඕන හැම කටයුත්තක්ම කරා සනිපතා මාස්පතා රැස්වීම් තියලා විවිධ ආයතන ඒක්ක සාකච්ජා කරලා. ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍යතුමාගෙන් අපිට එ සහයෝගය ලැබෙන්නේ නෑ. ඔබතුමාගේ ඉලක්කයක් තියෙනවා නගර සභාවට වෛද්‍යවරයෙක් අරගෙන එ සුවිශේෂී වූ සේවාව කාර්යක්ෂම කරන්න. එ සදහා ලබන වසරේදි ඔබතුමාට එ අවස්ථාව ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා.

ගරු නගරාධිපතිතුමනි, මේ මොහොතේදි කියන්න තියෙන්නේ අපි දිනපතා නගර සභාවට පැමිණෙන මහජන නියෝජිතයන් ජනතාවගේ අවශ්‍යතාවයන් අපි කරන්නේ එ එනකොට අපිට මුණ ගැහෙනවා නාගරික කොමසාරිස්තුමා, නියෝජ්‍ය නාගරික කොමසාරිස්තුමා, නාගරික ගණකාධිකාරිතුමා එවැනි අය අපිට හම්බවෙනවා අපි ආවාම එ කාර්යය සදහා විශාල සහයෝගයක් ලබා දෙනවා. එ පමණක් නෙමෙයි සේවකයන් විශේෂයෙන් වරිපණම් අංශයේ ගත්තත් නාගරික ඉංජිනේරු අංශයේ සැලසුම් අංශය ගත්තත් නාගරික වැඩ අධිකාරිවරු විශාල සේවයක් ඉටු කරනවා. සමස්ථ මොරටුව නගර සභාව ගත්තාම සුවිශේෂී සේවයක් ඉටුකරන නිළධාරින් කිහිපදෙනෙක් ඉන්නවා විදුලි අංශය භාරව කටයුතු කරන

දුල්සිරි මහත්තයා. පක්ෂ විපක්ෂ හැම මන්ත්‍රීවරයෙක්ගෙම ප්‍රසාදය ලබාගෙන වැඩ කටයුතුවලට විශාල සහයක් ලබා දෙනවා. නාගරික ලේකම්තුමණි ඔබතුමාටත් ස්තුතියි. අපි පැමිණෙන ඔනම වෙලාවක එ කාර්යය ඉෂ්ඨ සිද්ද කරනවා. එවගේම ගරු නගරාධිපතිතුමණි රැස්වීම් අංශයේ නිලධාරින් වාර්තා හරියට ලබාදෙනවා. මහ සභා රැස්වීම ඉවර වෙලා ඊලග සතියේ ගියානම් ඔවුන් කරන කාර්යය කුමක්ද කියලා අපිට හිතාගන්න බෑ. ලොකු වගකීමක් ඔවුන් ඉෂ්ඨ සිද්ද කරන්නේ මාස අවසානේදි එ වාර්තාව ලබාදෙන්න. එ නිසා අපි මේ අවස්ථාවේදි එ අයව අපි පුදන්න ඕන විශේෂයෙන් රැස්වීම් අංශයේ අයට අපි ස්තුතිය පුදකරන්න ඕන. නගරාධිපතිතුමා ඔබගේ කාර්යය මණ්ඩලය ඕනෑම මොහොතක එම කාර්යය ඉෂ්ඨ කරලා දෙනවා. එ සේවක මණ්ඩලයට අපි ස්තුතිය පුදකරන්න ඕන. නියෝජ්‍ය නගරාධිපතිතුමාට එ කාර්යය මණ්ඩලයට අපි ස්තුතිය පුදකරන්න ඔන. දිනපතා පුවත්පත්, ලිපිද්‍රව්‍ය ගෙනත්දෙන පණිවිඩකරුවන් එ අය මේ මෙහොතේදි අපි ආදරයෙන් මතක්කරන්න ඕන. එවගෙම ගරු නගරාධිපතිතුමණි මේ මොරටුව මහ නගර සභාව තුලත් නගර සභාවෙන් එළියේ අපි මොරටුවේ ගත්තත් අපිට කරන්න ඔන වැඩ කටයුතු ගොඩක් තියෙනවා. මං ඔබතුමාගේ අවධානය යොමු කරනවා අපි පානදුරේ ගත්තත් රත්මලාන ගත්තත් පිළියන්දල ගත්තත් එ ප්‍රදේශ සිසුන් දියුණුවකට පත්වෙලා තියෙනවා. මොරටුව මහ නගර සභා බල සීමාව ගත්තොත් එ බල සීමාව තාම එහෙමමයි මං ආසයි තව ටිකක් එක දියුණුවට පත්වෙනවාට ඔබතුමාගේ ආණ්ඩුව ඔබතුමාට එ වැඩකටයුතු කරන්න පුලුවන් විශේෂ අවධානයක් යොමුකරන්න කියලා ඉල්ලා සිටිනවා. මෙවැනි දේවල් තමයි අපිට කියන්න තියෙන්නේ විශේෂයෙන්ම මාධ්‍ය සහෘදයන් මේ මොහොතේදි අපි මතක් කරනවා.

ගරු නගරාධිපතිතුමණි, මම ඔබතුමාගෙන් ඉල්ලිමක් කරනවා නගර සභාවෙන් ඉටුවිය යුතු සේවාවන් ඉදිරියේදි මීට වඩා වැඩි දෙයකින් කරන්න වෙනවා ඔබතුමා මෙහි තියෙන අඩුපාඩු අපිට වැඩිය හොදට පේනවා දිනපතා පැමිණෙන හින්දා. මං හිතන්නේ අපිට කරන්න ඔනේ වැඩ කිහිපයක් තියෙනවා. විශේෂයෙන් විපක්ෂ මන්ත්‍රීවරුගේ අදහස් අහක දාන්න එපා එ අය ඔබතුමාට කරුණු ඉදිරිපත් කරන්නේ මේ නගර සභාව යම් කිසි ස්ථානයකට ගේන්න. එනිසා සහයෝගය ලබා දෙන්න. එ වගේම අවසාන වශයෙන් ඉදිරියේදි නත්තල පැමිණෙනවා එ නත්තල 2022 වර්ෂය සමකාමී වර්ෂයක්වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. අපිට පණිවිඩයක් ආවා දකුණු අප්‍රිකාවේ තියෙන කොවිඩ් ප්‍රභේදය අනික් එවට වඩා සිසුයෙන් ව්‍යාප්තවෙනවා කියලා. එහෙම වුනොත් වැඩකටයුතු අකර්මණ්‍ය වෙනවා එසේ නොවෙන්නට කියා අපි ප්‍රාර්ථනා කරනවා. නගරාධිපතිතුමා, නියෝජ්‍ය නගරාධිපතිතුමා, විශේෂයෙන් සහෝදර මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා කොමසාරිස්තුමා, ප්‍රධාන සියලුම නිළධාරි

මණ්ඩලයට මේ මොහොතේදි අපේ සුභ පැතුම් අපේ සුභදත්වය පිරිනමමින් මම නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මාගේ 22 වෙනි අයවැය විවාදයටයි මම මේ සහභාගිවෙන්නෙ. ඔබතුමා 2022 මොරටුව මහා නගර සභාවේ ප්‍රධාන මුල්‍ය ලියවිල්ල ඉදිරිපත් කරන මේ අවස්ථාවේ, අපේ රටෙත් ප්‍රධාන මුල්‍ය ලියවිල්ල පාර්ලිමේන්තුවේ සාකච්ඡා වෙමින් පවතින අවස්ථාවක් ඔබතුමා මේ අයවැය ලේඛනය ඉදිරිපත් කලේ. අපේ රට සාමාන්‍ය තත්වයක තියෙන අවස්ථාවක නෙමෙයි. අපේ ජීවිත කාලය තුල රටක් විදියටත් ලෝකයක් විධියටත් මුහුණ දිපු භායානකම ව්‍යසනයකට මුහුණ දිපු කාල පරිච්ඡේදයක්. මේ කථාකරන මොහොත වෙනකොට ඇමරිකා එක්සත් ජනපදයේ විතරක් ලක්ෂ 111 ක් පාරට වැටිලා ඉන්න වෙලාවක ඇමරිකා එක්සත් ජනපදය මේ කථා කරන මොහොත වෙන කොට 43 ලක්ෂයක් ආයතන වලින් එලියට දාලා තියෙන වේලාවක්. 1930 න් පස්සේ මුලු ලෝකයේම ආර්ථිකය බරපතල විධියට කඩන් වැටිලා උද්දමනය වැඩිවෙන වේලාවක අපි මේ සාකච්ඡාව සිදු කරන්නේ. මේ ගතකරපු වසර 22 ඇතුලත ආණ්ඩු පක්ෂය ඉදිරිපත් කරන අයවැය විපක්ෂය විවේචනය කරන සාම්ප්‍රදායික විවේචනයම තමයි තිබුනේ. ඊයේ වෙනකොට කිසිදු එන්නතකට මර්ධනය කර නොහැකි කොවිඩ් ප්‍රභේදයක් ලෝකය පුරා පැතිරෙමින් පවතින මොහොතක්. ඒ කියන්නේ 2022 වර්ෂයෙත් කොවිඩ් ව්‍යසනයෙන් තොර ජීවිතයක් තියෙයි කියලා අපි විශ්වාස කරන්නේ නෑ. කොවිඩ් සමග සටන් කරමින් නව සාමාන්‍යකරණයක් යටතේ තමයි අපි සියලු දෙනා මේ ඉදිරිපත් කරන මේ අයවැය ලේඛනය ක්‍රියාවට නංවන්න වෙන්නේ. විපක්ෂයේ කිහිප දෙනෙක් යම් යම් සාධනීය කථා ඉදිරිපත් කරා එවා අපි එකග වෙන එවා වෙන්න පුලුවන් එකග නොවෙන එවා වෙන්න පුලුවන් නමුත් යම් සාධනිය පිළිවෙතකින් සාධනිය ප්‍රවේශයකින් ඔවුන් මේ අයවැය සම්බන්ධයෙන් යම් විග්‍රහයක් කලා.

ගරු නගරාධිපතිතුමනි, අපි දන්නවා උපතේ සිට විපත දක්වා සියලු කාර්යයන් කිරීමේ බලය සහ හැකියාව අපේ මහ නගර සභාවට තියෙනවා. මාතෘ ළමා සායනයේ ඉදලා සුසාන භූමිය දක්වා එ අතර මැද සියලු කාරණාවලට මැදිහත්වෙන්න අපේ මහ නගර සභා ආඥාපනතේ බලය තියෙනවා. මට මතුකරන්න ඕන කාරණා කිහිපයක් තියෙනවා. මේ අවස්ථාවේ විශේෂයෙන්ම අපේ විපක්ෂයේ මන්ත්‍රිතුමියන්ලා හා මන්ත්‍රිතුමන්ලා කිහිප දෙනෙකුගෙන්ම කියවුනා ඔබතුමා ෙල්ල් එවගේම හරිකෙනා නෙමේයි පුටුවේ ඉන්නේ සුදුසු කෙනාට නෙමෙයි මේ පුටුව තියෙන්නේ. එවගේම ඔබතුමා සලකන්නේ පාක්ෂිකයන්ට ගොඩක් දෙනා අතින් කියවේවිව පොදු විවේචනය තමයි මේ. මුලින්ම කියන්න ඕන මොරටුව නගර සභා

ඉතිහාසයේ ඔබතුමාගේ කාලපරිච්ඡේදය දැන් අවුරුදු 14 ක් අපි ඊට කලිනුත් රවිනාත් ගුණසේකර නගරාධිපතිතුමාගේ කාලේත් කොහොමද ගෙනිච්චේ කියලා අපි දැකලා තියෙනවා. ඊට කලින් ඒ. ටී. කේ. චන්ද්‍රදාස මැතිතුමා මේ නගර සභාව කෙහොමද ගෙනිච්චේ කියලා අපි දැකලා තියෙනවා. එතුමන්ලා පිළිබඳ විවේචන නෑ අඩුපාඩු තිබුණා. මං කියන්නේ එක නෙමෙයි. මේ නගර සභාව පහුගිය අවුරුදු 14 ඇතුලත මම නියෝජනය කරා අවුරුදු 8. මේ මගේ 8 වෙනි අවුරුද්ද ඔබතුමාගේ කාලේ ඔබතුමාගේ නගරාධිපතිධූරය යටතේ ඔබතුමාගේ නායකත්වය යටතේ මේ සභාව නියෝජනය කරා. මෙම සභාවේ ඊට කලින් මම වෙන ආකාරයකින් ඔබතුමාත් සමග සම්බන්ධවෙලා තියෙනවා. මේ සභාවේ හැබැයි මම දැක්ක ඇත්ත කාරණාවක් තියෙනවා නගරාධිපතිධූරය .වි අයි. පි. ධූරයක් බවට පත් නොකලේ නම් එක මේ මහ පොළවේ ජීවත්වෙන මිණිස්සුන්ට බද්ද කරා නම් එ ඔබතුමා කියලා මම බොහොම පැහැදිලිව කියනවා.අපි දන්නවා වෙනත් සභාවල එ නගරාධිපතිධූරයත් එක්ක ලැබිච්ච ලොකු චිත්‍රයක් තියෙනවා.නමුත් ඔබතුමා බිම ඉදගෙන උදේ පාන්දර එන මණුස්සයා දිහා බලලා කථා බහ කරලා සමහර වේලාවට නගර සභා සේවකයෝ එන්න කලින් මෙතන ඉන්නවා මහ පොළොවේ ඉදගෙන ඔනම තැනක සරල භාෂාවෙන් කියනවා නම් ඔනම තැනක රිංගන්න පුලුවන් හැකියාව තියෙනවා.මොරටුව මහ නගර සභාවේ සමහර ක්ෂෙත්‍රවල පසුගාමී බවක් තියෙනවා.සෞඛ්‍ය පැත්තේන් සමහර මං මාවත් පැත්තෙන් ඉතා විශාල ප්‍රමාණයක් සෞඛ්‍ය පැත්තේන් සියල්ල මේ වගේ භෞතික පැත්තේන් විශාල ප්‍රමාණයක් සුභ සාධනය පැත්තෙන් විශාල ප්‍රමාණයක් ඔබතුමාගේ වසර 14 ඇතුලේ බොහොම හොඳට ඔබතුමා නිම කරලා තියෙනවා.එ වැඩ සටහන් ක්‍රියාත්මක කරලා තියෙනවා.

ගරු නගරාධිපතිතුමනි, අපිට සුදුසුකම සාපෙක්ෂයි ගරු නගරාධිපතිතුමණි කෙනෙකුට හිතෙන්න පුලුවන් ඔබතුමා සුදුසු නෑ.කෙනෙකුට කියන්න පුලුවන් ඔබතුමා සුසුසුයි.හැබැයි ඔබතුමා සුදුසු ද නැද්ද කියලා තීරණය වෙන්නේ ඔබතුමාගේ ක්‍රියාවෙන්.ඔබතුමාගේ ක්‍රියාව අනුව මහ නගර සභාවක් තියෙන්න ඔන මූලික කාරයයන්වලින් ඔබතුමා අසමත්නම් ඔබතුමා එ දේවල් නොකරනවා නම් අන්න ඔබතුමා සුදුසු නෑ.මොරටුවේ ජනතාව ඔබතුමාට තුන්පාරක් ඔය පුටුව ලබා දිලා තියෙන්නේ ඔබතුමා අසමත් නිසා නෙමෙයි සුදුසුකම් නැත්නම් දෙන්නැනේ නැහැනේ. ඔබතුමත් මණුස්සයෙක්. ඇස් කන් නහර වලින් හැදිච්ච කෙනෙක්. අපි කවුරුත් රහත් වේච්ච අය නෙමෙයි. අපි කවුරුත් මාර්ගඵල ලබපු අය නෙමෙයි.අඩුපාඩු තියෙන්න පුලුවන්.හැබැයි එ අඩුපාඩු එහෙම තිබුණා කියලා අඩුපාඩු ගැනම විවේචනය කර කර ඉන්න එකම නෙමෙයි අපේ යුතුකම වෙන්නේ ඔබතුමාගේ දෙයක් නමුත් මම කියන්නේ අපි යම් විවේචනයක් ඉදිරිපත් කරන කොට එය උපේක්ෂාවෙන් බලන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

එවගේම ගරු නගරාධිපතිතුමනි, මෙතන කියවුණා පාක්ෂිකයන්ට පමණයි ඔබතුමා සලකන්නේ කියලා. හරිනම් ඔව් අපි පාක්ෂිකයන්ට සලකන්න ඕනෑ. දේශපාලක්ඥයන් විදියට මේ පුටුවේ ඉන්නේ පාක්ෂිකයන් නිසා.ඔබතුමා ඔය පුටුවේ ඉන්නේත් පාක්ෂිකයෝ නිසා. මෙතන මේ මන්ත්‍රිවරු ඉන්නේත් පාක්ෂිකයෝ නිසා. අපිට 23 ක් හම්බවුනෙත් ආණ්ඩු බලයක් පිහිටවන්න හම්බවුනෙත් පාක්ෂිකයෝ නිසා. ජනාධිපති පත්කලෙත් පාක්ෂිකයෝ නිසා අගමැති පත්කලෙත් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලයක් පිහිටවන්න හම්බවුනෙත් අපේ පාක්ෂිකයෝ නිසා. අපේ පාක්ෂිකයන්ට සලකන්න බැරිනම් මොකටද අපි ඉන්නේ.නමුත් එකෙන් කියන්නේ පාක්ෂිකයන් නොවන අයව තලා පෙලා ඔවුන්ට සම්පූර්ණයෙන් නිශේධ කරලා සලකනවා කියන එක නෙමෙයි. හැබැයි එහෙම කියපු අය එගොල්ලන්ගේ ආණ්ඩු බලය තිබුණු කාලේ කොහොමද සැලකුවේ. මම උදාහරණයක් කියන්නම් මොරටුවේ සමaද්ධි ලබා ගන්නා අය සමaද්ධි ගන්න සුදුසුකම් තියෙන අයද එදා එක්සත් ජාතික පාක්ෂිකයෝ විතරක් සුදුසුකම් විදියට අරගෙන එකම සුදුසුකම යු. එන්. පි. විම මේ ගමේ සමaද්ධි ලබා දෙන්න. තට්ටු දෙකේ ගෙවල්වලටත් සමaද්ධි තියෙනවා බොරුපන මගේ කොට්ඨාශයේ.පොරොත්තු ලේකනයේ බොරුපන එක ගෙදර නම් දෙකක් තියෙනවා. එහෙම කරලා කියනවා අපි පාක්ෂිකයන්ට සලකනවා කියලා.

ගරු නගරාධිපතිතුමනි, මම මහජන උපයෝගිතා හා ප්‍රජා සංවර්ධන කමිටුවේ සභාපති විදියට මේ වසරේ විශාල වැඩ ප්‍රමාණයක් සැලසුම් කරලා තිබුණා. නමුත් එ සැලසුම් කරපුවා එ ආකාරයෙන් කරගන්න බැරි වුණා. මේ කොවිඩ් වසංගතයත් එක්ක සැලසුම් කරපු බොහෝ දේවල් ප්‍රජාවත් එක්ක එකතුවෙලා කරන්න තියෙන එවා.එ අනුව විශේෂයෙන්ම 2022 වර්ෂය සදහා ඔබතුමා සුභසාධන සේවාවට විශෙෂයෙන්ම පුස්තකාල, ප්‍රජා මණ්ඩල, පෙර පාසල්, විනෝද ක්‍රීඩා වගේ එ සුභසාධන වලට මිලියන 7 ක මුදලක් වෙන් කරලා තියෙනවා.එ මිලියන 7 විශේෂයෙන්ම පෙර පාසල් සදහාත් ප්‍රජා සංවර්ධන කමිටුව විදියට එම කාන්තා කටයුතු වෙනුවෙනුත් කටයුතු කරනවා. අපි බලාපොරෝත්තු වෙනවා ලබන අවුරුද්දට විශේෂයෙන් පෙර පාසල් දරුවන් සහ පුස්තකාල ඉලක්ක කරගෙන විශේෂ වැඩ සටහන් ටිකක් සම්පාදනය කරන්න.විශේෂයෙන් දරුවන්ගේ පරිකල්පනය ලොකු කාලයක් දරුවෝ ගෙවල්වල ඉදලා ඔවුන් දැන් එක්කෝ ජංගම දුරකථනයට හුරුවෙලා තියෙනවා.රූපවාහිණියට හුරුවෙලා තියෙනවා.එ නිසා ඔවුන්ව එතනින් එහාට ගිහිල්ලා ඔවුන්ගේ පරිකල්පන හැකියාව වර්ධනය කිරිම වෙනුවෙන් අපි අපේ සීයලා ආච්චිලාගෙන් ඉගෙන ගත්ත කතාන්දර කලාව හරහා අපි ලබාගත්ත පරිකල්පනීය හැකියාව ඔවුන්ට අත්පත්කර දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න බලාපොරෝත්තු වෙනවා. එවගේම පෙර පාසල් දෙකක් පුස්තකාල දෙකක්

අවුරුද්දකට සැරයක් අංග සම්පූර්ණ පෙර පාසලක් හා අංගසම්පූරණ පුස්තකාලයක් බවට පරිවර්තනය කිරීම සඳහා වැඩසටහනක් යෝජනා කරලා තියෙනවා. ඒ සඳහා ඔබතුමාගේ සහය ලබාදෙන්න කියලා ඉල්ලා සිටිමින් මෙම 2022 අයවැයට මගේ පක්ෂපාතිකත්වය පිරිනමමින් මම නිහඬ වෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍ර ගාමිනී පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම පහුගිය අයවැය ලේකන හෝ විගණන වාර්තා පරිශීලනය කරන්න ඒවා මගේ ලග නොමැති නිසා මම එ පිළිබඳව කථා කරන්න යන්නේ නෑ. නමුත් මං ප්‍රවේශයක් ගන්න ඔන නගරාධිපතිතුමනි, පහුගිය කාලේ වෙච්ච දේවල් මම දන්නේ නෑ.ඔබතුමාගේ අයවැය ප්‍රකාශය තුලින්ම. ඉතාම සංවේදි ප්‍රකාශයක් ඔබතුමාගේ කථාවේ තිබුණා. අපි දන්නවා කොවිඩ් නිසා සිදු වූ මරණ ගැන ගම් මට්ටමේ දි මහා අපරාධයක් කලා වගේ ගමේ මිණිස්සුන්ගෙන් කොන්වෙලා මුල්ලකට වෙලා ඥාතින්ගෙන් බැණුම් අහගෙන කන්න වේල නැතිව දුක්විදගෙන ඉතාම ගෞරවයෙන් ජීවත් වෙච්ච මිනිස්සු පොලිතින් රෙදි කඩක අවසන් ගමන් ගියා. සියලුම ආගමික වතාවත් හෝ ගෞරවයක් නොමැතිව එ බර මොරටුව මහ නගර සභාව වෙනුවෙන් ඔබතුමා දරා සිටම ගැන මාගේ පෞද්ගලික ප්‍රශංසාව ඔබතුමාට පුදකරන්න ඕන. අසරණ වෙච්ච මනුස්සයෙකුට අවසන් ගෞරවය හිමි නොවන අවස්ථාවක අවසන් ගෞරවය දක්වන්න ඉදිරිපත්වීම භාරගැනිමම සැබවින්ම මනුෂ්‍යත්වයේ නාමයෙන් මං ගරු කරනවා. ඇත්තටම ගරු නගරාධිපතිතුමනි, ඉතාම සුලු වැරදි කිහිපයක් ඉදිරිපත් කරන්න ඔන රෝම ඉලක්කම් 9 වෙනි පිටුවෙහි 19 වෙනි කරුණෙ හි තියෙනවා ජල කාණු මිට ඉස්සේල්ලා තිබුණා දැන්නම් එකක්වත් නෑ කියලා. ඇලපිල්ලක් භායානක වුනාට තොරතුරු ගන්න කෙනෙකුට ජල කාණු නැතිවීම නම් ඉතා භායානකයි. එය ජලකණු ලෙස නිවැරදි වෙන්න ඕන.

ගරු නගරාධිපතිතුමනි, මගේ පෞද්ගලික දෙයක් එහි තියෙනවා. රෝම ඉලක්කම් 16 පිටුවෙහි කාඩර් එකේ ප්‍රජා සංවර්ධන නිළධාරි තනතුරු මේ වනවිට නැහැ කියලා සඳහන් වෙලා තියෙනවා. ඒත් මොරටුව මහ නගර සභාවේ ප්‍රජා සංවර්ධන නිළධාරි තනතුරක් ලබපු කෙනෙක් මම, දෙහිවල නගර සභාවේ දැන් සේවය කරන්නේ දේශපාලන හේතුවක් මත මිසක් වෙන හේතුවක් නිසා නෙමෙයි. මම ස්ථාන මාරු වෙලා ගියේ ලගම මහ නගර සභාවට මම තාමත් සේවයේ ඉන්නෙ ප්‍රජා සංවර්ධන නිළධාරිවරයා විධියට දෙහිවල නගර සභාවේ කාඩර් එකේ ප්‍රජා සංවර්ධන නිළධාරි තනතුරක් නෑ. මම වෙනත් තැනක වැඩ බලන්නේ නමුත් මට විශ්‍රාම යන්න බැහැ. එ තනතුරට පත්වීම තියෙන්නේ මොරටුව මහ නගර සභාවේ නිසා කවදාහරි දවසක මට මොරටු මහ නගර සභාවෙන් තමයි විශ්‍රාම යන්න වෙන්නේ. එදාට එනකොට

නැති තනතුරක් වෙනුවෙන් මා විශ්‍රාම ගන්වන්න හැකියාව තියෙයිද කියන එකත් මම දන්නේ නෑ. එහෙම දෙයක් නැත්නම් ප්‍රශ්ණයක් නෑ. එ නිසා එ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ප්‍රජා සංවර්ධන නිළධාරි තනතුරක පත්වීම ලබපු මට දෙහිවල නගර සභාවෙන් විශ්‍රාම යන්න බෑ. එහෙම තනතුරක් එහෙ නැහැ. එක විශේෂ කරුණක් විධියට ඔබතුමාට සිහිපත් කරන්න ඕනෑ. ගරු නගරාධිපතිතුමනි, මේක යෝජනා කරන්න අවස්ථාව නොවුනත් ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරන්න ඔන දෙහිවල හා මොරටුව කොළඹ දිස්ත්‍රිකයේ අපි දැකලා නැහැ කාන්තාවෝ සිගරට් බොනවා. නමුත් ගරු නගරාධිපතිතුමනි, දැන් කාන්තාවෝ පවා මත්ද්‍රව්‍ය පාවිච්කරන තත්වයකට පත්වෙලා තියෙනවා එ නිසා අනාගත පරම්පරාව ගලව ගන්න ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලනවා. ස්ථාවර කාරක සභාවට මත්ද්‍රව්‍ය නිවාරනයත් ඇතුලත් කරන්න එ තුලින් අපේ දරුවන් බෙරගන්න අපිට දෙයක් කරන්න හැකිවෙයි. ගරු නගරාධිපතිතුමනි, මේ ඔබතුමාගේ 14 වෙනි අයවැය. මන් එකේ සඳහන් කරුණු වලට එකඟ නොවුනත් මම එකට ඡන්දය දුන්නත් නොදුන්නත්, මෙය මොරටුවේ ජනතාවගේ වටිනා ලියවිල්ල එක ඔබතුමාගේ 14 වෙනි අයවැය නිසාත් මම පෞද්ගලිකව ඔබතුමාට සුභ පතනවා. මේ ලියවිල්ල තුල සාර්ථක නොවුනත් ඔබතුමාගේ හැකියාවෙන් මොරටු ජනතාවට සේවයක් කිරිමට හැකිවේවායි. ප්‍රාර්ථනා කරමින් අපි ආදායම් උත්පාදනය හෝ ආදායම් එකතු කිරිම තුලින් තමයි අපේ නගරයේ පැවැත්ම තියෙන්නේ එකතු නොවන මුදල් එකතු කර ගැනිමේ වැඩ පිළිවෙලක් ගැන සඳහන් නොවෙන ලොකු ආදායම් මාර්ග පෙන්වන අයවැයක් තමයි අද ඔබතුමාගේ තියෙන්නේ. ඇත්තටම මම සජීත් මන්ත්‍රිතුමා කිව්වා සිහින අයවැයක් කියලා එකට පෞද්ගලිකව එකඟ වෙනවා. හේතුව අපි පෙන්වන අය එකතු නොවුනාට නගරාධිපතිතුමණි ඔබතුමා පෙන්වන වැය අනිවාර්යෙන් වියදම් කරන්න ඕන. අය නැතිව වියදම් කරන්න ගියාම තමයි ඔබතුමාට විශාල ප්‍රශ්ණවලට මුහුණ දෙන්න වෙන්නේ. වැය කපා හරින්න පුලුවන් කමක් නෑ අය නොලැබුණත්, ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්නට ඕන. මොකද අපි ව්‍යාපාර ආයතනයක් නෙමෙයි නිසා උපත ලබන්න කලින් සිට මරණය දක්වාම සේවා සපයන ආයතනයක් විධියට එකෙන් අපිට ගැලවෙන්න නොහැකි නිසා. කොන්ක්‍රිට් සංවර්ධනය විය යුතුයි. මානව සංවර්ධනයට වියයුතු දේවල් ඇතුලත් වුනානම් ඇත්තටම මම පෞද්ගලිකව අගය කරනවා. අපේ කාන්තා හිංසනය ගැන කථා කරද්දි ඔබතුමාගේ පාර්ශවයෙන් කිව්වා පලමුවෙන්ම ගෞරවය දුන්නේ ඔබතුමාලගේ පක්ෂයෙන් කියලා පිළිගන්නවා. ප්‍රථම අගමැතිනියත්, ඔබතුමාලගේ ප්‍රථම ජනාධිපතිනියත්, ඔබතුමාලගේ නමුත් අපේ පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා තමයි සියයට 25 අනිවාර්යය කරලා කාන්තාවන්ට දේශපාලනයට එන්න දුන්නේ, නිසර මන්ත්‍රිතුමාගේ කථාවේදි කියවුනා මව්වරුන්ට කිරිපැකට් දිම තාමත් එය ක්‍රියාත්මක විම ගැන මම මගේ හදවතින්ම සතුටුවෙනවා.

ගරු නරාධිපතිතුමනි, නගර සභා ආඥා පනත අනුව පක්ෂ විපක්ෂ මන්ත්‍රීධුර නැහැ. අපි සියලු දෙනාම මහජන නියෝජිතයෝ හරි දෙට එකඟ වෙන්නත්, වැරදිදේට විරුද්ධ වෙන්නත්, අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා. හරිදේට අපි අනිවාර්යෙන් සහය දෙනවා. කුණු ගැන කථා කරන්න ඕන. රවිනාත් ගුණසේකර මැතිතුමාගේ කාලේ කුණු ගොඩවල් තිබුණා තමයි. එතුමා භාරධූර කටයුත්තකට මුහුණ දුන්නේ කුණු දාන්න තැනක් තිබුනේ නැහැ. අපිට එතුමාගේ අවසාන කාලේ දි හැකිවුනා කරදියාන වත්ත අරගෙන කසල තැන්පත් කරන්න පුළුවන් වුණා. අදටත් ක්‍රියාත්මක වෙන්නේ එතුමා පටන් ගත්ත දේ තමයි. කොහාම වුනත් එය ක්‍රමාණුකූලව කිරීම පිළිබඳව ඔබතුමාට ප්‍රශංසාව පුදකරනවා. එය විය යුතු දෙයක් නිසා ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා භෞතික සැලසුම් වලට වැඩි පමුඛතාවයක් දිලා සියයට 58.27 භෞතික සැලසුම්වලට එක අවශ්‍යයි. නමුත් ගරු නගරාධිපතිතුමනි, සෞඛ්‍ය සඳහා වියදම් කරන මුදල අනිවාර්යෙන් වියදම් කල යුතුමයි. මම දකින විධියට 4.84 ට වඩා වැඩි ප්‍රමාණයක් සෞඛ්‍ය සේවා සඳහා වෙන් කරන්න ඕන. හේතුව කොවිඩ් විතරක් නෙමෙයි. ඩෙංගු, කලු දිලීර වගේ වසංගතත්, ගංවතුර, ස්වාභාවික ආපදා බොහෝ තියෙනවා. ඒක නිසා මෙක මීට වඩා වැඩි උනානම් මම මීට වඩා සතුටු වෙනවා. ට්‍රැක්ටර් 28 ක් තියෙනවා. 3 ක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. 25 වැඩ කරන්නේ. 25 තුල හරි කුණු කසල ඇදෙනවා. නමුත් ගරු නගරාධිපතිතුමනි, නාගරික කොට්ඨාශ තියෙන්නේ 29 යි. අපිට තව 4 ක් ගත්තනම්, එක කොට්ඨාශයකට එක ට්‍රැක්ටරයක් යොදවන්න පුලුවන්. ඒ පිළිබඳ ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි. පහුගිය කාලේ ගරු ආණ්ඩුකාරතුමා ආවා. මම එදා කමිටුවකට සහභාගි වෙන්න පැමිණියේ ගරු නගරාධිපතිතුමාගේ ඉල්ලිම පරිදි. මම එතනට ගියා යන්න ඉස්සෙල්ලා එළියෙදි මට වේදනාවක් දැනුනා. එම ස්ථානය අපි රගහලක් විධියට තමයි හැදුවේ. අපේ ඔලුවේ තියෙන්නේ රගහල අපරාදේ අපේ රගහල නගරාධිපතිතුමා කුණුගොඩක් කරානේ කියන හැගීමෙන් තමයි ගියේ, නමුත් ගියාට පස්සේ එ හැගීම වෙනස්වුනා. කසල කියන අප්‍රසන්න වචනය වෙනුවට එහි සුන්දරත්වයක් තිබුණා. ඔබතුමා නිවාස සංකීර්ණ ඇති කරන්න රගහලක් හදන්න බිලියන ගණනින් මුදල් වෙන් කර තියෙනවා. ඒක යථාර්තයක් වෙනවානම් එය මොරටු ජනතාවගේ යහපතක් කියලා කියමින් මම නැවත සෞඛ්‍ය කේෂත්‍රයට මීට වඩා දායකත්වයක් දක්වන්න කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා. සියලු දෙනාට ඉතාමත් වාසනාවන්ත දවසක් එවගේම සුභ නත්තලක් හා වාසනාවන්ත නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කල 14 වෙනි අයවැය අපිත් අපේ ශක්තිය සහය සුභ පැතුම් එක්කරන 14 වෙනි අයවැය මුලින්ම මතක්කරන්න ඕනෑ සජිත් දුමින්ද මන්ත්‍රීතුමා කිව්වා මේක සිහින අයවැයක් කියලා. සිහින තමයි මිනිස්සු ජීවත් කරවන්නේ සිහින වලින් තමයි මිනිස්සු යථාර්තයට කිට්ටු කරන්නේ. එ නිසා අපි ඔබතුමාත් එක්ක එකගයි.මිනිස්සු දකින විදිය තමයි වෙනස් චන්ද්‍රගාමිණී මන්ත්‍රීතුමා කසල දකින්නේ එක විදියකට. රුවන්මල් මන්ත්‍රීතුමා දකින්නේ එක විදියකට. ඔහු කියනවා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කථා කරන්න ගත්ත වේලාවේ ඉදන් කසල කසල කසල මේ ලියවිල්ල කසල ගොඩට දාන්න කියනවා.අපි 2006 බලයට පත්වෙනකොට අපි ඉස්සරහා තිබුන දැවැන්තම අභියෝගය තමයි කසල ගොඩවල් වලින් ජනතාව මුදවා ගැනීමේ ප්‍රශ්නය. මොරටුව නගරාධිපතිවරයා විදියට සමන්ලාල් ප්‍රනාන්දු පත්වුනාට පස්සේ අපිට මාස ගාණක් නිදිවරාගෙන ඉන්න සිද්ධවුනා. ඔබතුමා දන්නවා සජිත් දුමින්ද මන්ත්‍රීතුමා එතකොට අපිත් එක්ක හිටියේ අපි මොරටුවේ කසල ගොඩවල් මුරකරලා එවා සුද්ද කරන්න ගත්තා. දැවැන්ත කාර්යයක් කරලා තමයි මොරටුවේ මේ කසල ගොඩවල් නැතිකලේ එහෙම නැතිකරාම එ ගැන කථාකරන්න අපි කැමතියි එ අපි කරපුවා. එක නිසා අපිට එහෙම තමයි හැබැයි කුණු අයින් කරලා නිකන් හිටියේ නෑ බස්නාහිර පළාත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරන අධිකාරිය එ ජනනය වන නොදිරන කසල එක බිංදුව කරන්න වැඩ සටහනක් හදුන්වලා දෙනකොට අනික් අයට සිහිනයක් වෙලා තියෙන එක යථාර්තයක් කලේ මොරටුව මහ නගර සභාව. ගරු නගරාධිපතිතුමණි, එහි ගෞරවය අපි ඔබතුමාට දෙනවා. අපේ නායකයා විධියට ඔබතුමා ඉතාම හොඳ දැක්මකින් එය කල නිසා තමයි අද වෙන නගර සභාවලින් ප්‍රාදේශිය සභාවලින් අපේ මේ කසල අංගනය බලන්න එ ආයතන වලින් එනවා. සභාපතිවරු එනවා. එ විතරක් නෙමෙයි පසුගිය දවසක බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා මේ ස්ථානයට ඇවිල්ලා එතුමා ප්‍රශංසාවට ලක්කලා ගරු නගරාධිපතිතුමාගේ වැඩ පිළිවෙල ඉතාම හොඳයි. මොරටුව මහ නගර සභාව හැමදාම මේ විධියද කියලා එතුමාගේ හිතේ එතුමා එනකොට විතරක් මේ විධියට පිළවෙලට තියෙනවා කියලා. ඔබ හැමොම දන්නවා. ඉතාම පිරිසිදුවට එ ස්ථානය පවත්වාගෙන යනවා විතරක් නෙමේයි වැඩ ඉවර වුනාම එ සේවකයෝ එතැන ක්‍රීඩා කරනවා.එ තරමට ඔවුන් එය පිරිසිදුව පවත්වාගෙන යනවා. ආණ්ඩුකාරතුමා විතරක් නෙමෙයි පසුගිය දවසක අනුරාධපුර සදහිරු සැය ඉදිරිපිට ඔබතුමාට කියනවා "නගරාධිපතිතුමා ඔබතුමාගේ වැඩ පිළිවෙල මට ආරංචී මට විස්තර හම්බවුනා මම නොදුරු දිනයක ඔබතුමාගේ වැඩ පිළිවෙල බලන්න මොරටුවට එනවා" කියලා. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් ඔබතුමාට කියනවා. එක නිසා එ ගැන අපිට ආඩම්බරයක් තියෙනවා. ගෞරවයක් තියෙනවා.

ගරු නගරාධිපතිතුමනි, එ වගේම සහෝදර මන්ත්‍රීතුමා කිව්වා කොමසාරිස්තුමාගේ නොහැකියාවක් ගැන හැබැයි ගරු නගරාධිපතිතුමණි මටත් එහෙම හිතෙනවා. එතුමාට එහෙම හිතුන එක ගැන හේතුව තමයි එතුමා උදේ හවස දකිනවා ලුනාවේ ඉස්පිරිතාලය ඉදිරිපිට තුන්මහල් නිවසක් හදලා. බොහෝම නීති විරෝධී නිවසක් හදලා තියෙන්නේ. ඉතින් එයට විරුද්ධව කටයුතු කරන්න මොරටුව මහ නගර සභාව අපොහොසත්වෙන කොට එතුමාට හිතෙන එක සාධාරණයි ඔබතුමාලගේ නොහැකියාවක් තියෙනවායි කියන එක. එක නිසා ගරු නගරාධිපතිතුමනි, මම ඉල්ලා සිටිනවා එතුමා වෙනුවෙන් එ පිළිබඳ හොයා බලන්න කියලා ඉතාම උවමනාවෙන් ඉල්ලා සිටිනවා. ශිරෝමී කුරේ මන්ත්‍රීතුමිය කල කථාව මුහුණු පොතේ එක්කරලා සටහනකුත් දාලා තියෙනවා මොරටුව මහ නගර සභාවේ කාන්තාවන් වෙනුවෙන් කිසිම දෙයක් කරලා නෑ. රුපියලක්වත් වෙන්කරලා නෑ. එ නිසා තමයි කරේ කියලා. ඉදිරිපත් කරලා තියෙනවා.මම එතුමියට කියනවා මිනිස්සු නොමග යවන්න එපා. එය නිවැරදි කරන්න ඔබතුමිය බලන්න අයවැයේ 54 පිටුවේ තියෙනවා ගර්භනී මව්වරුන්ට එ මුදල වෙන් කරලා තියෙන්නේ කාන්තාවන්ට ගරු මන්ත්‍රීතුමිය මම එකත් මතක් කරන ගමන් ගරු නගරාධිපතිතුමණි මේ ගෝලිය වසංගතය හමුවේ අපේ ආදායම් එකතුකර ගැනීමට අපහසුතාවයන් ඇතිවුනා. එ පිළිබඳ අපේ මන්ත්‍රීවරු කථා කලා කවුරුත් දන්නවා අපිට මොන තරම් ආදායම් ඇස්තමේන්තු කරලා තිබුණත් අපිට විතරක් නෙමෙයි මුලු ලෝකයටම ඇතිවුන තත්වය හමුවේ මිනිස්සුන්ගේ ව්‍යාපාර කඩන් වැටීමේ තත්වය යටතේ අපිට සමහර ආදායම් එකතු කරන්න නොහැකි වුනා. එක අපි පිළිගන්නවා. ගිය අවුරුද්දේ කරගන්න නොහැකි වුනා කියලා මේ අවුරුද්දේ ඇස්තමේන්තු නොකර ඉන්නේ නෑ. ආදායම් එක කරන්න ඔන. අපි කවුරුවත් බලාපොරෝත්තු වෙන්නැ කොවිඩ් එක දිගටම තියෙන්න කියලා හැබැයි අලුත් ප්‍රභේද එනවා කොවිඩ් එක ඉස්සරහට යන්නත් පුලුවන් පාලනය වෙන්නත් පුලුවන් නොවෙනනත් පුලුවන් හැබැයි අපි කොහොම වුනත් ඉස්සරහට යන්න ඔන. අපි ඉස්සරහට යන්න තමයි මේ කටයුතු කරන්නේ අපි කවුරුත් පිළිගන්නට ඔන මේ කොවිඩ් වසංගතය වේලාවේ මොරටුව මහ නගර සභාව තමයි සමන්ලාල් ප්‍රනාන්දු මහත්තයාගේ නායකත්වයෙන් ලංකාවේ කිසිම නගර සභාවක් එ ආසාධිතයන්ව පි සි ආර් කරන්න යන්න රථයක් නිර්මාණය කරලා තිබුණේ නෑ. මොරටුව මහ නගර සභා නිලධාරින් නාගරික කොමසාරිස් ඇතුලු නිලධාරින් තමන් පරිහරනය කරන රථ පරිත්‍යාග කරලා එවෙනුවෙන් රථ නිර්මාණය කරලා කටයුතු කලා එ වගේම තමයි ජංගම වෛද්‍ය සායන එ අදාල ගමට ගිහිල්ලා වෛද්‍යවරු ගමට අරගෙන ගිහිල්ලා වෛද්‍යවරයාත් රෝගියාත් අතර දුරස්ථභාවය ඇතිවෙන විධියට කටයුතු කරලා ඔවුන්ට බෙහෙත් හෙත් දෙන වැඩ පිළිවෙලක් මොරටුව මහ නගර සභාව කලා. විශේෂයෙන්ම සංවර්ධනය ගැන කථා කරන කොට මොරටුව මහ නගර සභාව පසුගිය කාලය තුල විශේෂයෙන්ම එ සංවර්ධනය කටයුතුවලත් යම් යම්

බාධාවන් ඇතිවුනා. කොවිඩ් තත්වය නිසා යම් ප්‍රමාණයක්. මන්ත්‍රීවරයෙක් කථා කලා මොරටුව තාම එක තැන නගරයේ එකතැන අපි සතුටුවෙන්නට ඔන විශේෂයෙන්ම නව රජයේ අතිගරු ජනාධිපතිතුමාගේ නගර 100 ක් සංවර්ධනය කරන සැලැස්ම ඇතුලට මොරටුව නගරය ඇතුල්වෙලා. තව නොබෝ දිනකින් එ කටයුතු ආරම්භ වෙනවා. අපේ සිහිනයක් තියෙනවා. එකට බලාපොරෝත්තුවක් තියෙනවා. එ මොරටුව සංවර්ධන වැඩ සටහන ඉක්මණින් ක්‍රියාත්මක වෙලා ඔබතුමාත් අපිත් බලාපොරෝත්තුවෙන මේ මොරටුව ජනතාව වෙනුවෙන් එ කටයුතු ඉෂ්ඨ සිද්ධවෙයි කියලා. අපි බලාපොරෝත්තුවෙනවා එ වගේම අපේ රංගන මන්ත්‍රීතුමා මතක් කරා. ගරු නගරාධිපතිතුමනි, මොරටුව දකුණු ප්‍රදේශයේ අපි මොනතරම් මාර්ග පිළිසකර කලත් එ ප්‍රදේශයට ආවේණික වේච්ච ගැටලුවක් තමයි එ ජලය බැස නොයා රැදි සිටීම. ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා විශේෂ සාකච්ඡාවක් කරලා අද වෙනකොට සියලු මිණුම් කටයුතු කරලා ඔවුන් සැලසුම් සකස් කරලා එකට අවශ්‍ය මුලික කටයුතු කෙරෙමින් තියෙනවා. දකුණු කලාපයේම ජලය රැදෙන ස්ථාන නිසි ආකාරයෙන් සකස් කිරීමේ වැඩ පිළිවෙලක් මහ නගර සභා මට්ටමින් නෙමෙයි ඊට වඩා වෙනස් ක්‍රමවේදයකින් කරන්න අවශ්‍ය මුලික කටයුතු කරලා තියෙනවා. එ නිසා එවගේ දැවැන්ත කටයුතු රාශියක් එක්ක තමයි අපි ඉදිරි කාලයෙත් කටයුතු කරන්නේ.

ගරු නගරාධිපතිතුමනි, මෙය හැමදාම සාම්ප්‍රදායිකයි සාම්ප්‍රදායිකයි කියන එක්කෙනා කියන්නේ එහේම තමයි. හැබැයි මම ඔබට ආරාධනා කරනවා. චන්ද්‍ර ගාමිණී මන්ත්‍රීතුමාලාවගේ දකින්න උත්සාහ කරන්න සජිත් දුමින්ද මන්ත්‍රීතුමාගේ කථාවේ යම් සාධනීය කථා තිබුණා. මේක සමන්ලාල්ගේ මේක පෙහෝට්ටුවේ කියලා හිතන්නනේ නැතිව හොදයිනම් හොදයි කියන්න අපි පුරුදුවෙන්න ඕනෑ. ඔබතුමාගේ 14 වෙනි අයවැයට පක්ෂපාතිකත්වය වගේම විශේෂයෙන්ම මේ කාලය තුල මේ කටයුතු කරගෙන යන්න අපිට ශක්තිය දුන්න නාගරික කොමසාරිස් ඇතුලු නිලධාරින්ට අපි අපේ ගෞරවනිය ස්තුතිය එවගේම මේ කටයුතුවලට ඔබතුමාට විශාල ශක්තියක් වෙන නියෝජ්‍ය නගරාධිපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රීවරුන්ට අපේ සතුට සුභාශිංශන එකතු කරනවා.

ගරු නගරාධිපතිතුමනි, අපි බොහොම ආදරය කරන බෙස්ට් කියන දාර්ශනිකයා කියපු කවියක් මහාචාර්යය කාලෝ පොන්සේකා මහතා පරිවර්තනය කල මේ කවියෙන් මාගේ කථාව අවසන් කරනවා. ගරු නගරාධිපතිතුමණි තන්හාවේ දෝෂය දුටු බුදුන් වහන්සේ තන්හාව නසා විමුක්තිය පතා නිවන මෙයයි පෙන්වා දුන් සේක. එම නිවන් මග ගැන බුදුහාමුදුරුවෝ කිව කාරනය පිළිබඳව ගෝලයෝ ඇසූ පැනය ගැන තමයි තියෙන්නේ. මේ කවිය දිග වැඩි හින්දා මම අවසාන හරියෙන් කියන්නම්. මේ නිවන මොනවගේ එකක්ද කියලා. එ ගොලයෝ අහන කොට ලෝව්තුරා

බුදුහාමුදුරුවෝ දෙන පිළිතුර තමයි මේ කවියට මුලික වේලා තියෙන්නේ එහෙත් එම දිනයේ සැදෑ සමයේ බෝරුක් සෙවනේ වැඩ සිටි සමීදා පැන ඇසු සිසු පිරිස ගිය පසු එහි සිටි සෙසු සැමදෙන අමතලා දෙසුවා මෙම සුලු උපමා කථාව.

"දවසක් මම ගෙයක් දුටිමි
එය ගින්නට හසුව තිබුණි
රත් පැහැගත් ගිනි ජාලා එහි පියසින් උසට නැගුණි
එහි තුල මා දනන් දුටිමි
දොරහැර ඔවුනට හඬගා පිටවෙන්නයි මම කිවෙමි
එත් එදෙන සැලුනේ නැත, හදිසි බවක් පෙන්නුවේ නැත
එක් අයකුගේ රැවුල පවා පිලිස්සේද්දි ඔහු ඇසුවේ
ගෙයින් පිටත මීට හොඳද ? වැසිවසිද ? සුළං තදද ?
දැවෙන නිවෙස දමා ගොසින් ඉන්න ගෙයක් තියෙනවාද ?

මේ වැනි ප්‍රශ්ණ රාශියක්ලු මම පිළිතුරු නොදී ඔහුට නැවත වරක් වුනෙමි නිහඬ

මට සිතුනා මෙ දරුවන් නගන ප්‍රශ්ණ නවත්වන්නේ ගින්නේන් නැසුනාම කියලා

සත්තකින්ම පිය දරුවනේ යම් මිනිසෙකු පොළව තලේ තැබූ දෙපා දැවෙන තුරා
වෙන තැනකට නොයාවිනම් එ දන හට සරණ යන්න බණක් නැතිය මට කියන්න

සත්තකින්ම පිය දරුවනි යම් මිනිසකු පොළව තලේ තැබූ දෙපා දැවෙන තුරා
වෙන තැනකට නොයාවිනම් එ දන හට සරණ යන්න බණක් නැතිය මට කියන්න "

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි, 2022 අයවැය ලේඛනයට ජනතා විමුක්ති පෙරමුණ විධියට අපේ විරුද්ධත්වය පලකරා.මේ අයවැය ලේඛනය අපි කාටත් වැදගත් වෙන්නේ අපේ නිල මන්ත්‍රිදුර කාලේ අපි සම්බන්ධවෙන අවසාන අයවැය ඡන්දය කල් නොදැම්මොත්. එ නිසා අපි කාටත් මේ ගතවෙච්ච අවුරුදු 04 ඇතුලේ අපි කරපු කියපු දැ අපේ මහජන නියෝජිත හැටියට ආපස්සට හැරි බැලීමක් මේ කථාව ඇතුලේ කලයුතුව තිබුණා. ගරු නගරාධිපතිතුමණි,අපි කවුරුත් උදේ ඉදලා මේ අයවැය විවාදයට සම්බන්ධවුනා. ගරු නගරාධිපතිතුමණි,අපි කවුරුත් ජීවත්වෙන සමාජ තත්වය අතිශය බරපතල

තත්වයක්. මේ තත්වය වියුක්ත කරන්න බැ. මේ මොරටුවේ මහ නගර සභා අයවැයෙන් මෙය සාම්ප්‍රදායික අයවැයක් එක පැත්තකින් අපේ රට විශාල ආර්ථික අර්බුදයක ඉන්නේ එ ආර්ථික අර්බුදය මත ගොඩනැගෙන මහා දේශපාලන අර්බුදයක්. එ පමණද නොවෙයි සමාජ ව්‍යසනයක් අපි කරා ලඟා වෙමින් තිබෙනවා.මීට වසර එකහා මාරකට දෙකකට ඉස්සේල්ලා මේ රටේ බහුතරයක් තරුණ කුඩා මහලු මේ හැමට තිබිච්ච බලාපෝරොත්තු බිද වැටිලා.විශ්වාසය බිදවැටිලා.විශ්වාසය භංගත්වයට පත්වෙලා.අත්‍යාවශ්‍ය ආහාර භිගයක් ගෑස් පොලිම් වල යන්න වෙලා.පිටි පොලිම් වල යන්න වෙලා.සිනි විතරද නෙවෙයි ජීවිතයේ හැම දෙයක්ම අතිශය අමාරු තත්වයකට ගොදුරු වෙලා.ආනයන සිමා වෙලා.ඩොලර් නෑ කියනවා.රුපියල් අව්චුගහනවා. උද්ධමනය වැඩිවෙනවා.බඩු මිල වැඩි වෙනවා. මිනිස්සු අසරණ වෙලා.අපනයනය කඩා වැටිලා.අද අපි ඉන්නේ එහෙම රටක ලෝක බල පුලුවන ගැටුමේ ලංකාව ඔවුන්නොවුන්ගේ දඩ බිම බවට පත්කරගෙන ඉවරයි. ලෝක බල පුලුවන ගැටුමේ එක පැත්තකින් ඇමරිකන් ඉන්දියන් බලපෑමත් අනෙක් පැත්තෙන් චින බලපෑමත් ඇතුලේ රටක් විධියට අපි අසරණ වෙලා.විකුණන්නේ නෑ විකුණුපුවා ගන්නවා කියපු පාලකයෝ ආන්න සෙලෙන්දිවා හදාගෙන මහ තැපැල් කාර්යාල ගොඩනැගිල්ල ඉඩම, විදේශ කටයුතු අමාත්‍යාංශ ගොඩනැගිල්ල ඉඩම, දර්බුන් ගොඩනැගිල්ලේ ඉඩම, වැලිකඩ හිරගෙදර ඉඩම මේ රටේ සම්පත් විකුණනවා.එ විතරක් නෙවෙයි පරිසරය රකිනවා කියපු පාලකයෝ අපේ රටේ අධි ආරක්ෂිත වනාන්තර ඩොසර්කරමින් ඉන්න වෙලාවක්. එහෙම වෙලාවක තමයි ඔබ මම ඔබෙ අවසාන අයවැය පිළිබඳ මේ විවාදය කරන්නේ. එ නිසා අපි කාටත් වැදගත් වෙන්නේ අපේ රට, අපි කාටත් වැදගත්වෙන්නේ අපේ අනාගතය, මේ මහා ව්‍යසනය තවදුරටත් දේශපාලන කඩතුරාවලින් වහගෙන අපි ඉන්නවද එහෙම නැත්නම් මහත්තයෝ මේ මහා ව්‍යසනය අපේ දෙව්රමත තව පටවගෙන මේක වෙනස්කර අපේ අනාගත දරුවන්ට යහතින් ජීවත්වෙන්න පුලුවන් රටක් නිර්මාණය කරනවාද ? ඔක තමයි අපි ඉස්සරහා තියෙන ප්‍රශ්ණය ට්‍රිලියන 16.42 ක ණයක් ණය වාරිකයක් ගෙවා ගන්න විධියක් නෑ.අතමාරුවක් ඉල්ලුවාම ඉන්දියාවෙන් කියනවා කාලේ ඉවරවෙන තෙල් ගිවිසුම දික්කරන්න, දාලා තියෙන කොන්දේසි දෙක, තෙල් බෙදා හැරීම, තෙල් ගබඩාව තව කොන්දේසි දෙකක් දාන්න පිරිපහදුව තෙල් ගෙන එම තෙල් ගෙන එමත් දුන්නාම තෙල් බෙදා හැරීම තෙල් ගබඩාව දුන්නාම අපේ තෙල් සංස්ථාව මොකටද අපේ රට මංකෝල්ල කනවා.අපිව එ තරමට යටත්කරලා තියෙන්නේ දැන්මේ තත්වය එන්නේ රෑ12.05ට යුග දනව් බලාගාර ගිවිසුම අත්සන් කරනවා.මේතන ඉන්න හැම කෙනාම උගත්, අපි ඉගෙන ගත්තේ අපේ රට ලෝකේ වාසනාවන්තම රට දැවැන්ත වාරි කර්මාන්තයක් ඇතුලේ කෘෂි කරමාන්තය ගොඩගිය රට එ මහා දැවැන්ත ජාතිය මහා වාරි කර්මාන්තය ලෝක ශිෂ්ඨාචාරයට කියාදිපු ජාතිය. තිස්සමහාරාම වැව හාරන්න දෙනවා චීනට ගරු නගරාධිපතිතුමණි,

එනිසා එකපැත්තකින් අපිට ගැලවෙන්න බෑ අපි ඉන්නේත් මේ ආර්ථිකය ඇතුලේ. බඩු මිල අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල අපේ කොල්ලන්ගේ කෙල්ලන්ගේ රස්සාව දැන් අපි කවුරුත් අමාරුවෙන් ජීවත් වෙන්නේ. ලංකා ඉතිහාසයේ දේශපාලනයේ ගොඩනැගිච්ච බලය 2009 වර්ෂයේ මහින්ද රාජපක්ෂ මහත්තයා යුද්ධය දින්නා මහා රජා කියලා මේ රටේ මින්ස්සු කිව්වා.2010 ඡන්දය තිබ්බා ආසන 127 යි මේ තුමාට 146යි මිනිස්සු විශ්වාස කලා.මේ දේශපාලඥ්ඥයෝ ඔක්කෝම හොරු. දේශපාලඥ්ඥයෝ නොවන මිනිහෙක්වත් මේ රට හදයි කියලා මිනිස්සු හිතුවා.එ නිසා තමයි මේච්චර බලයක් ආවේ.මහජන නැගිටීම් අපේ රටේ හෙට අනිද්දා සිදු නොවුනොත් මතක තියාගන්න.පොදුජන එක්සත් පෙරමුණු පාලනය අසාර්ථකයි.මේ රට මේතෙක් පාලනය කරපු හැම පාලකයාම ආපු පාර වෙන පාරක් නෙමෙයි මෙක ආර්ථික දේශපාලන වැරදි මේ මහා ව්‍යසනය ඇතුලේ අපේ රටේ දේශපාලඥයෝ හොරකම් කරනවා.කොටි ගණන් හොරකම් කරනවා පොහොර වලින් හොරකම් කරනවා. සිනි වලින් ගහනවා.භාණ්ඩ මිල තිරණය කලාම තම ගජමිතුරු වෙළෙන්දෝ මිනිස්සුන්ව නරක විධියට සුරා කනවා.

ගරු නගරාධිපතිතුමනි, මේ ආයතනයේ පරිපාලනය සම්පුර්ණයෙන්ම බිඳවැටිලා.මේ අයවැයම මිනිසෙක්නම් එ මිනිසාගේ මොළය බිඳවැටිලා.මේ මිනිසාගේ හදවත සම්පුර්ණයෙන්ම කුණුවෙලා.අතපය දන්නේ නෑ කකුල්වලට ඔනවිධියට වැඩ.මේ අත වැඩ කරන විදිය අනෙක් අත දන්නේ නෑ.මේ පරිපාලනය සම්පුර්ණයෙන්ම අවුල් ජාලයක්.සේවකයෝ තොග පිටින් පොත් අත්සන් කරලා යනවා.තමුන්නාන්සේගේ අතින් පාලනය ගිලිහිලා.සේවකයන්ට ඔන විධියට සේවකයෝ ඔක්කෝම නෙමෙයි මේකට ආසකරන මිනිස්සු තමන්ගේ ඩියුටිය කරනවා.හැබැයි තමුන්නාන්සේලාගේ හයියෙන් ආපු අය එක තමයි සත්‍යය ගරු නගරාධිපතිතුමණි මේ අයවැය ලේඛනයේ බොහෝ දේවල් කියන්න ගියොත් මම ඔවා කියන්න නෙමෙයි ආවේ. ප්‍රාග්ධන ආදායම් කොටි 235යි සතපහක්වත් නෑ.අයවැය ඇස්තමේන්තු කියන්නේ අපි බලාපොරෝත්තුවෙන මුදල් තමයි.අඩුම තරමේ අයවැය කථාවේ කියන්න එපැයි මේ මුදල බලාපොරෝත්තුවුනා මෙක ගන්න බැරිවුනා ගන්න බැරි වුනේ මේ හේතුව නිසයි මොකක්වත් නැනේ.එනිසා මේ අයවැයට සාධනිය මැදිහත් වීමක් කවුරුත් කලේ නෑ.ඔයගෝල්ලො කවුරුත් මේ අයවැයට සාධනිය ලෙස කථා කලාද තමන්ගේ කොට්ඨාශයේ තියෙන ජනතාවගේ ඇත්ත ප්‍රශ්ණ මට හිතෙන්නේ ප්‍රජා ශාලාවකට ගිහිල්ලා නෑ.පුස්තකාලේකට ගිහිල්ලා නෑ. ක්‍රීඩා පිටියකට ගිහිල්ලා නෑ.පෙර පාසලකට ගිහිල්ලා නෑ.මාතෘ සායනයකට ගිහිල්ලා නෑ.අදාහනාගාරයකට ගිහිල්ලා නෑ.ඔයගෝල්ලෝ කොහෙද ගිහිල්ලා තියෙන්නේ.ඔයගෝල්ලෝ කැරකිලා තියෙන්නේ මෙක ඇතුලේ.ලස්සන කරන තරමක් ලස්සන කරන්නේ මේක වටේ. ප්‍රජා ශාලාවකට යැවුවා ආදායම් එකතු කර ගන්න අපේ ජංගම සේවය මාත් ගියා එතනට මගේ

බලපත්‍රයක් ගන්න හත්ඉලව්වේ යන්න වැසිකිලිය නෑ.විදුලි පංකාව කැරකෙන්නේ නෑ.අපේ නිලධාරින් ආදායම් එකතු කර ගන්න යන්නේ.කොච්චර අමාරුවෙන්ද එගොල්ලෝ එක කරන්නේ.සොයා බැලිම් නෑ.අපි ඔයිට ඉස්සෙල්ලත් කිව්වා.සොයා බැලිම් නෑ.එ නිසා ගරු නගරාධිපතිතුමණි මොරටුව මහා නගර සභාව කියන්නේ මේ හතර මායිම නෙමෙයි.

ගරු නගරාධිපතිතුමනි, කථා කරනවා කසල කළමණාකරනය. කසල කළමණාකරනයට එකගයි.ඔබ ඔය කරපු වැඩෙට පක්ෂයි. ස්ථානය රංග ශාලාව ඔන තරම් මේ නගර සභාවේ ඉඩකඩම් තියෙනවා. ඔය කසල කළමනාකරනයට ගන්න.ඔක හදලා දෙන්න එකග වුනා.එ එකගතාවයට ලුනාවේ ඉඩම දුන්නේ නිවාස සංවර්ධන අධිකාරියට.එගොල්ලෝ ගෙවල් ටික හැදුවා.විවෘත කරා ඔබත් ගියා.ඔබකිව්වා රංගශාලාව හදලා දෙනවා.කෝ සජිත් ඇමතිතුමා එක්ක කථා කලා විරවංශ ඇමතිතුමා එක්ක කථා කලා අවසාන අදියරේ තියෙන්නේ මේ රංගශාලාව.මේ රංගශාලාව කසල කළමණාකරන මධ්‍යස්ථානයක් කරන්න ඔන නෑ.එකට අවස්ථා ඉඩ කඩ ඔන තරම් තියෙනවා.එකෙන් කියන්නේ කසල කළමණාකරනය ප්‍රතික්ෂෙප කරනවා නෙමෙයි.අපි යායුතු ස්ථානය මේතුමාට ඔන මේ ස්ථානයේ තියෙන දේවල් ලස්සන කරන්න.මේ ස්ථානයේ කැරකුනොත් ඔබට ඔන තරම් අනිවාර්යය නොවන බොහෝ ඉදිකිරිම් මේ අවට හොයාගන්න පුලුවන්. දකින්න පුලුවන්. ප්‍රයෝජනයක් නෑ.එවට වියදම් කරලා.අපි දිර්ඝකාලයක් තමුන්නාන්සේලාගේ වැඩ බැලුවා.තමුනාන්සේලාගේ වැඩ වෙනස් කරන්න උත්සාහ කරා.විවේචන කරා.අද අපි කොච්චර විවේචන කරත් වැඩක් නෑ.නිලකාලය පෙබරවාරි නම් පෙබරවාරි යනකොට වැඩේ ඉවරයි.එ නිසා අද ප්‍රාර්ථනා කරනවා මොරටුවේ ජනතාවට ප්‍රාර්ථනා ලෙස අරගෙන යනවා කරන්න පුලුවන් හැමදේම කරනවා.ආයෙනම් පෙහොට්ටුවේ පාලනයක් මේතනට එපා.පොදුජන එක්සත් පෙරමුණේ පාලනයක් එපා.අපි හදන්නම්.මෙ නිළධාරින් දක්ෂ නිළධාරින්. වගකිම ඔවුන් ඉටුකරන නිළධාරින්.මේ ආයතනයේ බොහෝ නිළධාරින් ඉනනවා අපිට මේ ආයතනයේ පරිපාලනය ඉතා හොඳින් දියුණු කරන්න පුලුවන්. නිළධාරින් අපිට එ පිළිබඳ අවබෝධයක් විශ්වාසයක් තියෙනවා.අද කරන්න දෙන්නේ නෑ කරන්න බෑ.හැමදේම කරද්දි ඔවුන් පරිස්සම් වෙන්න වෙලා.මේ ආයතනයේ නිළධාරින්ට අවස්ථාව හදන්න ඔන.ඔවුන්ට අවශ්‍ය පහසුකම් දෙන්න ඔන.අපේ සේවකයාට යුක්තිය ඉෂ්ඨ වෙන්න ඔන.පුරප්පාඩු 159 අපි අරගෙන කරන්න ඔන. පුරප්පාඩු 159 යේ වැටුප් පතිපූර්ණය ගන්න 159 බදවාගෙන අපේ තනතුරු ගණනාවක් නෑ.දිර්ඝකාලයක් පුස්ථකාලාධිපති කෙනෙක් නෑ. පුස්ථකාලාධිපති තනතුරු තුනක්.බදු මුදල් ගෙවනවා ලක්ෂ 130ක්.මේ මහජනයාට සේවය කරන්න තියෙන මුදල්.අපි දිර්ඝකාලයක් කිව්වා.මහජන නියෝජිතයෝ ලෙස විතරක් නෙමෙයි මනුස්ස

හදවතක කැක්කුම තියෙන මිනිසුන් ඉතිහාසයේ වැඩිහිටියන්ට මියදෙන මිනිසුන්ට ගරු කරන ජාතිකයන් අපේ රාවතාවත්ත සුසාන භූමිය අපිට භූමිදානය කරන්න ඉඩකඩම් මේ අවට කොහෙවත් නෑ.මේ අවට පිටිටනි අලුතින් හදන්න බෑ.ඔබත් මමත් දන්න ප්‍රසිද්ධ රහසක් තියෙනවා. සේවකයාගේ වරදක් නෙමෙයි. අභියෝගයක් තියෙනවා.නෛතික පැත්තේ ප්‍රශ්ණයක් තියෙනවා.තවදුරටත් සිමෙන්ති ඕනද එහෙම නැත්තම් අපි යෝජනා සම්මත කරලා නෛතික ප්‍රශ්ණය අධිකරනයට ගිහිල්ලා විසදගෙන පස් තට්ටුවක් පුරවලා තව පරම්පරා ගණනාවක් මියදෙන මිනිසෙකුගේ මිනිය පස්වෙන්න ඉඩ හදනවාද අපි මහ නගර සභාව විධියට අපිට තියෙන වගකීම් නොවෙයිද මේවා.මේවා කරන්න ඔන නැද්ද ?

ගරු නගරාධිපතිතුමණි, ඔබේ ප්‍රකාශය තුල කියනවා 2021 වර්ෂය තුල බල ප්‍රදේශය තුල මාර්ග හා කාණු ඇතුලු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 182ක් පමණ රු මිලියන 189ක් රු මිලියන 189ක් මේ තියෙන්නේ අයවැය ලේඛනය ගරු නගරාධිපතිතුමණි දැන් මේ මිලියන 189 වියදම් කලේ පුනරාවර්තන ප්‍රාග්ධන වැය ශිර්ෂවල මොකක්ද කියලා.එක්කෝ පුනරාවර්ථන වැය ශිර්ෂය වෙන්න කාණු බෝක්කු පාරවල් එහෙම නැත්නම් ප්‍රාග්ධන වැය ශිර්ෂයේ වෙන්න ඕනෑ ඔබ පුලුවන්නම් මට පෙන්නන්න නැත්නම් ඔබ බොරු කියනවා. කියන්නේ මේ වැඩේ මම දන්න විධියට මේ වෙනකොට මාස 9 ක් ඇතුලත ඔබ වියදම් කරේ මිලියන එකයි.මේ අයවැය පෙන්නන්න.ලක්ෂ 11 යි.හැබැයි ඉතුරු කාර්තුව මේ අයවැය ලේකනයට ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි අපේ විරෝධය පල කරනවා.එ වගේම මේ තත්වය කාත් එක්කවත් පෞද්ගලික ප්‍රශ්ණයක් නෙමෙයි.මේ රටේ මංකෝල්ලකාරී දේශපාලනය ව්‍යාපාරයක් බවට පත්වෙලා තියෙන දේශපාලනය මහජන සවියක් බවට පත්කිරීම වෙනුවෙන් අපිට කල හැකි ඔනම දෙයක් කරනවා.මේ රට ගොඩ නගන්න මේ රටේ නිෂ්පාදන ඉහල දාන්න පුලුවන් ඉතාම හොඳ වැඩ පිළිවෙලක් සහිතව අපි අපේ දේශපාලන ගමන ඉස්සරහාට අරගෙන එනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමණි, අපි අහගෙන හිටියා කන්දක් ගිලලා මී පැටියෙක් වැදුවා හා සමානව කථාවක් මිට ඉස්සේල්ලා ඇහුවා.ජනතා විමුක්ති පෙරමුණට වේච්ච දේ ගැන කථා කරනකොට බොහෝම දුකයි.පටන්ගත්තේ මහා ලොකුවට දාර්ශනික අනික් මන්ත්‍රිවරු ඔක්කෝම සැහැල්ලුවට කථා වලින් ලක්කරා.අයවැය ගැන කථා කලේ නෑ කියලා.නිශාන්ත ප්‍රදිනාන්දුගේ අයවැය කථාවේ තියෙන්නේ එකම එක කරුණයි ප්‍රාග්ධන ආදායම කොටි 235 යි.සතපහක්වක් ප්‍රාග්ධන ආදායම් මේ අවුරුද්ද තුල

උපයාගෙන නොමැත. මම නිශාන්ත ප්‍රදීනාන්දුගෙන් අහන්න ඔන ප්‍රාග්ධන ආදායම් කියන එක නිරවචනය කරන්න. ගරු නගරාධිපතිතුමණි, ප්‍රාග්ධන ආදායම් සම්බන්ධව ලිහිණි මන්ත්‍රීතුමියත් කථා කලා. මමත් බලාගෙන හිටියා ඇයත් බොහෝම තර්කානුකූලව කථා කරා.

ගරු නගරාධිපතිතුමණි, ප්‍රාග්ධන ආදායම් කියලා කියන්නේ සභාව විසින් ගන්නා ලද විවිධ හේතූන් මත අපි ගන්න ණය ණය තමයි අපි සටහන් කරන්නේ ප්‍රාග්ධන ආදායම් ලෙස හැබැයි පහුගිය අවුරුද්දක කාල සිමාව තුල ගරු නගරාධිපතිතුමණි,අපි ඇස්තමේන්තු කරලා තියෙනවා යම් ව්‍යාපෘති සඳහා ණය මුදලක් ලබා ගන්න ඇස්තමේන්තුකරලා තියෙනවා.හැබැයි අපි බලාපොරෝත්තු වූ ණය මුදල් ලබාගෙන නෑ. ලබාගත්තේ නැතිවුනාම එ ප්‍රාග්ධන ආදායම් ශූන්‍ය වෙනවා.හැබැයි එ ශූන්‍ය වීමෙන් කාටවත් හානියක් නෑ.එකේ වාසියක් මිස අවාසියක් සභාවට නෑ ඒ නිසා ප්‍රාග්ධන ආදායම් නැහැයි කියලා කවුරුහරි මේක දකිනවානම් අඩුපාඩුවක් කියලා මම කියන්න ඔන පැහැදිලිව ප්‍රාග්ධන ආදායම් නැහැයි කියන්නේ සභාවට ආශිර්වාදයක් මිස එක සභාවට අගතියක් නෙමෙයි.

ගරු නගරාධිපතිතුමණි,පුනරාවර්තන ආදායම් සම්බන්ධයෙන් ලිහිණි මන්ත්‍රීතුමිය කථා කලා. පුනරාවර්තන ආදායම් ගරු ලිහිණි මන්ත්‍රීතුමිය මේවෙනකොට පුනරාවර්තන ආදායම් උපයාගෙන තියෙනවා 68 % 9.30 දින වෙනකොට මොරටුව මහා නගර සභාව පුනරාවර්තන ආදායම් හැටියට උපයාගෙන තියෙනවා.තව මාස තුනක් තියෙද්දි.එ කාර්තුව තුලදි අපෙක්ෂිත ආදායම කරා යන්න පුලුවන් කමක් තියෙනවා.අමතක කරන්න එපා මේ සියයට 68 උපයා ගන්නේ ගරු නගරාධිපතිතුමණි, මොරටුව මහා නගර සභාව මේ 68% උපයා ගන්නේ කොවිඩ් වගේ වසංගත අවධියක් තියලා මාස ගණන් ඇදිරි නීතිය දාලා සංචරණ සීමා දාලා මිනිස්සුන්ට වැඩට යන්න විධියක් නැතිව එ වගේ විශාල අර්බුද රාශියක් තියෙන තැන තමයි පුනරාවර්තන ආදායම් හැටියට සියයට 68% ප්‍රතිශතයකට මේ නගර සභාව යන්නේ.මම හිතන්නේ එක අපි ගරු නගරාධිපතිතුමා ප්‍රධාන අපේ නාගරික කොමසාරිස්තුමන් ගණකාධිකාරිතුමන්ලා ඇතුලු සියලුදෙනාට ස්තුතිකරන්න ඕන කාරණයක් මොකද හේතුව මේ උදවිය මහන්සිවෙලා මේක කරේ නැත්නම් අද දවල්ට කන්න සල්ලි ටිකවත් හොයාගන්න හම්බවෙන්නේනෑ එනිසා ගරු නගරාධිපතිතුමණි,නගරාධිපතිවරයා නගරාධිපතිවරයාගේ කාරයයභාරය කරලා තියෙනවා.කොමසාරිස්වරයා කොමසාරිස්වරයාගේ කාර්යයභාරය කරලා තියෙනවා.ගණකාධකාරිවරුන් දෙදෙනා ඔවුන්ගේ කාර්යයභාරය කරලා තියෙනවා.සහ සියලු නිළධාරින් තමන්ට අයත් කාර්යයභාරය එ අයුරින් කරලා තියෙනවා.එකේ ප්‍රතිඵලයක් හැටියට තමයි එ නිශ්චිත ආදායම් කරා යන්නට පුලුවන්කම ලැබිලා තියෙන්නේ. ගරු නගරාධිපතිතුමණි,තව ලිහිණි මන්ත්‍රීතුමිය

විගණන වාර්තාව සම්බන්ධයෙන් කථා කරා. ගණුදෙනු ප්‍රමාණය නිර්මාණය වෙන්නේ මේ 2020 වේච්ච දෙයක් නෙමෙයි මෙය 2019 වේච්ච දෙයකුත් නෙමෙයි.මෙය 1998 ඉදලා කමක් කමයෙන් ක්‍රමක් ක්‍රමයෙන් විගණන වාර්තාවල ආපු ප්‍රතිඵලයක් හැටියට තමයි 2021 වාර්තාවෙත් මේ ගිණුම්වලට මොකක්ද වුනේ කියලා හොයාගන්න බැරිවෙලා තියෙන්නේ.එහෙම නැත්නම් ගිය අවුරුද්දේ වෙච්ච දෙයක් නෙමෙයි මන්ත්‍රීතුමිය මෙය නගරාධිපතිතුමාගේ වරදක් නෙමෙයි මේ නිළධාරීන්ගේ වරදක් නෙමෙයි මේක 1998 ඉදන් වෙච්ච අතපසුවීමක ප්‍රතිඵලයක් හැටියට තමයි මේතනට ගලාගෙන ඇවිත් තියෙන්නේ.මේක සමන්ලාල් ප්‍රනාන්දුගේ වරදක් නෙමෙයි මෙක නිළධාරීන්ගේ වරදක් නෙමෙයි මෙක දිර්ඝ කාලයක් ආපු එකේ ප්‍රතිපලයක්.විගණන වාර්තාවක් ආවාම විගණන වාර්තාව අරගෙන මේකේ තියෙන කරුණු දිහා බලලා යම් යම් නිගමනවලට තීන්දුවලට එන එක යම් යම් අවස්ථාවල වැරදියි.ඔබතුමිය කියන තව එකක් තමයි වරිපණම් එකතු කර ගැනීමේදි අප එක කරලා නෑ කියලා.2020 වරිපනම් එකතුවෙන්න ඕන මිලියන 208 යි.2020 එකතුවෙලා තියෙනවා මිලියන 211 ක් වැඩියෙන් එකතු කරලා තියෙනවා.මම හිතන්නේ නෑ සභාවේ කවුරුත් බජට් එකෙදි අනෙ ඔයගොල්ලෝ වැඩියෙන් එකතු කරගෙන තියෙනවානේ කියලා ස්තුති කරන්න කවුරුත් ඉදිරිපත් වෙන්නේ නෑ.නිළධාරින් යම් කිසි කාර්යයභාරයක් කරලා තියෙනවා.නගරාධිපතිවරයා යම් කිසි කාර්යයභාරයක් කරලා තියෙනවා එ සම්බන්ධව. එකට ස්තුති කරන්න කවුරුත් ඉදිරිපත් වෙන්නේ නෑ.හැබැයි වැඩේ තියෙන්නේ හොද දේ හොද හැටියටත් නරක දේ නරක හැටියටත් දකින්න අපි පුරුදු වෙනවානම් මම හිතන්නේ අනිවාර්යෙන්ම මේ 208 211 කරගන්න කොට එකට අපි ප්‍රශංශා කරන්න ඔන.එ විතරක් නෙමෙයි මේ වසර වෙනකොට වරිපනම් වලින් සියයට 60 ක් උපයාගෙන ඉවරයි.2021 අවුරුද්දේ වරිපනම් බදු සම්පූර්ණ ප්‍රමාණයෙන් සියයට 60 ක් අපි එකතු කරගෙන ඉවරයි.තව අපිට තියෙන්නේ සියයට 40 එකතු කරගන්න ගරු නගරාධිපතිතුමණි සාමානයයෙන් වසරක් ගත්තාම එ වසර තුල සියයට සියයක් එකතුවෙන්නේ නෑ බොහෝ වසර වල.හැබැයි පහුගිය වසරේ අපි සමත් වෙලා තියෙනවා සියයට එකසිය ගානක ප්‍රතිශතයකට යන්න.හිග වරිපනනුත් එකතු කරගන්න සමත්වෙලා තියෙනවා.එ වගේම තමයි මේ අවුරුද්දේත් අපි එතනට යනවා මොකද හේතුව 9.30 වෙනකොට සියයට 60 ප්‍රතිශතය එකතුතර ගත්තා කියන්නේ එතනින් එහාට 12.31 වන විට සාධනිය පිළිතුරක් අපේක්ෂා කරන්න පුලුවන් එනිසා වරිපනම් එකතු කර ගැනිම බොහේම ප්‍රශංසනිය තැනක තියෙනවා කියලා බොහෝම පැහැදිලිව කියන්න ඕන.

ගරු නගරාධිපතිතුමනි, තිසර මන්තිතුමාගේ කථාවේදි ලක්ෂ 5 ක් කිරිපැකට් වලට වෙන් කරලා තියෙනවා වියදම් කරලා තියෙන්නේ 150000 කියලා කිව්වා.හැබැයි ගරු නගරාධිපතිතුමණි මට කියන්න ඔනේ කාල සිමාව තුල ක්ලිනික් තිබ්බේ නෑ.එ

කාලසිමාව තුල පෙර පාසල් තිබ්බේ නෑ.මේ වසර කියන්නේ ගරු මන්තිතුමා පෙර පාසල් වහලා, ක්ලිනික් වහලා එ වගේ තිබ්බ වසරක්.එ නිසා තමයි එහෙම කියලා අපිට වෙන් කරන් නැතිව ඉන්න බෑ.අපි අනිවාර්යෙන් වෙන් කලයුතුවෙනවා.වෙන් කරන්නේ නැතිව හිටියනම් තමයි වරද වෙන්නේ.වෙන් කරපු එක වියදම් කරන්න විදියක් නෑ.අනුරසිරි මන්තිතුමාගේ කථාවේදි කියනවා කෘමිනාශක වලට සල්ලි වෙන් කරලා තිබ්බේ නෑ කියලා.මදුරු තෙල්වලට මම ඔබතුමාට යෝජනා කරනවා 53 පිටුවේ 1605 හි 2 බලන්න කියලා.ලක්ෂ 7 ක් වෙන්කරලා තියෙනවා. ගරු නගරාධිපතිතුමණි.ඊට අමතරව 51 පිටුවේ 1605 හි සහ දෙක මිලියන දොලහක් වෙන් කරලා තියෙනවා.ඔබතුමාට බලන්න පුලුවන්.එවගේම මේ බජට් එකේ සාධනිය ලක්ෂණයන් තියෙනවා.මේවා ලිහිණි මන්තිතුමියට අමතක වෙච්ච තැනක්.අර අපේ ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රිතුමා කිව්වා බොහොම ලස්සන කථාවක් ශිරෝමි මන්ත්‍රිතුමිය දාලා තියෙනවා මුහුණු පොතේ කාන්තාවන්ට සලකලා නෑ කියලා.ලිහිණි මත්ත්‍රිතුමියලා ඔබතුමාගෙන් පහුගිය කාලේ බොහොම හොදින් ඉල්ලුවා ප්‍රතිපාදන වෙන්කරන්න කියලා අප දන්න ඉතිහාසයේ ප්‍රථම වතාවට ඔබතුමා ලක්ෂ 30 ක මුදලක් වෙන් කරලා තියෙනවා හැබැයි දෙයි හාමුදුරුවනේ අපේ ඉන්න කාන්තා මන්ත්‍රිවරු කවුරුත් කිසිම යෝජනාවක් ඉදිරිපත් කරලා නෑ.ලක්ෂ 30ම ඉතුරුයි. බලන්න 80 පිටුවේ 1649 වෙනත් කියලා 8වෙනි කරුණ ලක්ෂ 30ක් වෙන් කරලා තියෙනවා.ලක්ෂ 30 වෙන් කරලා ලක්ෂ 30 න් ප්‍රයෝජනයක් ගත්තේ නැති නිසා එක ලක්ෂ 15 දක්වා අඩු කරලා තියෙනවා.එ නිසා ගරු නගරාධිපතිතුමණි මම යෝජනා කරනවා මේ ලක්ෂ 15 ප්‍රයෝජනයට ගන්න කියලා අපේ මන්ත්‍රිවරියන්ගෙන්.නගරාධිපතිවරයාට ඉදිරිපත් කරන්න ඔබතුමියලාගේ ප්‍රශ්ණ කාන්තාවන්ට මේ මොරටුවේ ප්‍රශ්ණ නැතුවයැයි මේ ලක්ෂ 30 ඉතුරුවුනේ.

ගරු නගරාධිපතිතුමණි, දිළඳුසහන ගෙවිම් දිළිදු සහන පිටු දැකිමේ ව්‍යාපෘති ආදි සමාජ සුභසාධන ගෙවිම් කියලා ශීර්ෂයක් තියෙනවා , මේ සමාජ සුභසාධන ගෙවිම් කියන ශීර්ෂය මෙතෙක් ප්‍රයෝජනයට අරගෙන නෑ.එනිසා මම යෝජනා කරනවා ඔබතුමාට මේ සමාජ සුභසාධන ගෙවිම් කියන ශීර්ෂය යටතේ මේ මොරටුවේ ඉන්න අහිංසක දුප්පත් මිනිස්සු වෙනුවෙන් මොනවාහරි කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා.මොකද හේතුව ඉතාම වැදගත් ශීර්ෂයක් තියෙනවා අපේ කවුරුත් එ ගැන අවධානය යොමු කරේ නෑ.එ නිසා මම ඉල්ලිමක් කරනවා ඔබතුමාගෙන් එ අවශ්‍ය අවධානය යොමු කරන්න කියලා.එවගේම ගරු නගරාධිපතිතුමණි, අපි කියන්නට ඔනේ මේ රංගශාලාව ගැන කථා කලානේ රංගශාලාව ඔහොම තිබ්බා අවුරුදු 15 ක් ජනතා විමුක්ති පෙරමුණේ නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රිතුමා එහෙට ගියා මෙහෙට ගියා එහෙට ගියා මෙහෙට ගියා.තාප්පේ පොස්ටර් ටිකත් ගැහුවා.හත්වලාමේ මේච්චර ලස්සනට හදලා මේ මොරටුව මහ නගර සභාව ආදායම් උත්පාදනය කරන

තැනක් බවට පත්කරලා එවගේම විතරක් නෙමෙයි මුලු ලංකාවටම ආදර්ශයක් දෙන තැනක් බවට පත්වෙලා.අද ලංකාවේ ඉන්න ප්‍රාදේශිය සභා මන්ත්‍රිවරු එක එක්කෙනා ඇවිල්ලා බලලා යනවා අපි දැකලා තියෙනවා.මහ නගර සභා නගරාධිපතිවරු ඇවිල්ලා බලලා යනවා තමන්ගේ පළාත් පාලන ආයතන වල ක්‍රියාත්මක කරන්න පුලුන්වන්ද කියලා මේ වැඩ සටහන සමහරු පුදුම වෙනවා.එවගේ පුදුම ව්‍යාපෘතියක් ආරම්භ කරපු තැන අද කියනවා එතන හරියන්නැලු. රටේ ඉන්න වැදගත් මිනිස්සු මරපු එකයි,කැලැ පැනලා මිනිස්සුන්ගේ අයිඩෙන්ටිටිකාඩ් විනාශ කරපු එකයි එවා තමයි දන්නේ.එනිසා ගරු නගරාධිපතිතුමණි මේ අයවැය ලේඛනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මතය මේ අයවැය ලේඛනයේ සාධනිය ලක්ෂන කිහිපයක් දකිනවා.එ නිසා අපි පැහැදිලිව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අපේ එකගත්වය සහ සහයෝගය මේ අයවැය ලේඛනයට ලබා දෙනවා කියලා පොරොන්දුව ප්‍රකාශ කරමින් මම නිහඩ වෙනවා.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමණි, ප්‍රථමයෙන්ම මම මගේ සුභාශිංශන පුදකර සිටිනවා. 2006 ඔබතුමා නගරාධිපතිවරයා වෙනකොට අපේ ජෙෂ්ඨ මන්ත්‍රිවරු 7 ක් නියෝජනය කරන ඔබතුමත් සමග සභාව එදා ඉදලා මේ වෙනතුරු අවුරුදු 14 ක් ඔබතුමත් සමග මොරටු ජනතාවට වැඩ කරන්න අයවැය අවස්ථා 14 කට සම්බන්ධවෙන්න ලැබීම ගැන මගේ සතුට ප්‍රකාශ කරන අතර මගේ ප්‍රනාමයත් ඔබතුමාට පුදකර සිටිනවා.ඔබතුමාට සුභපතනවා එවගේම එදා ඉදලම අපිට සහයෝගය දක්වපු එ අවධියේ හිටපු නිළධාරින් විශාල පිරිසක් හිටියා.මේ අවධියෙත් නිළධාරින් විශාල පිරිසක් ඉන්නවා.මේ වෙනුවෙන් විශාල කැපකිරිමක් කරන අපේ කොමසාරිස්තුමා ඇතුලු ගණකාධිකාරිවරු නියෝජ්‍ය නාගරික කොමසාරිස්තුමා ලේකම්තුමා ඇතුලු එම අංශයේ නිළධාරින් හා විදුලි අධිකාරිතුමා ඇතුලු එ සියලුම නිලධාරීන් හා මෙතන නොසිටින සේවකයන් මීට වඩා පහලින් ඉන්න සේවකයන් උදව් උපකාර කරන්න ඇති කියලා මම විශ්වාස කරනවා.එ වෙනුවෙන් සමස්ථ මොරටු ජනතාවගේ ස්තුතිය මේ නිළධාරින්ට මම පුද කර සිටිනවා. එවගේම අපේ සියලුම නාගරික මන්ත්‍රිවරුගේ ස්තුතියත් මේ අවස්ථාවේ පුදකර සිටිනවා.

ගරු නගරාධිපතිතුමණි අයවැය සම්බන්ධයෙන් විශාල කරුණුකාරනා විශාල වශයෙන් මතුවුනා. අපිට විශේෂයෙන්ම පසුගිය වර්ෂ දෙකෙම සභාවක් වශයෙන් අපිට ගොඩක් දෙවල් අතපසුවිම් සිදු වුනා.එකට හේතුව ඔබතුමාගේවත් මේ නිළධාරින්ගේවත් අපේ නාගරික මන්ත්‍රිවරුන්ගේවත් කරුණක් නෙමෙයි.එකට හේතුව ලෝකයටම බලපෑ කොවිඩ් වසංගත තත්වය නිසා මේ රටක් වශයෙන් අපි පමණක් නෙමේයි ජාත්‍යන්තර වශයෙන්ම ලෝකයේ ප්‍රබල රටවල් ආර්ථික ශක්තියක්

තියෙන රටවල් විශාල වශයෙන් මේ අවස්ථාවේ කඩාගෙන වැටුනා.එනිසා අපේ සංවර්ධන ක්‍රියාදාමයන් කරගන්නට යම් ප්‍රමාණයක් සභාවක් වශයෙන් නොහැකිවුනා කියලා අපි විශ්වාස කරනවා.එ නිසාම තමයි අපිට 2020,2021 අපි බලාපොරෝත්තුවුන සංවර්ධන ක්‍රියාවලියට යන්න බැරිවුනා. ඒ අනුව අයවැය තුලින් ඔබ ඉදිරිපත් කරලා තියෙනවා 111 වන පිටුවේ යෝජිත රංගශාලාව එවගේම පිරිස් මාවතේ යෝජිත නිවාස සංකීර්ණය, එවගේම අංක 2 ගොඩනැගිල්ල සංවර්ධනය කිරිම එවගේම සභාවේ වාහන අංගනයේ ගොඩනැගිල්ල සභාව සඳහා වෙන් කර ගැනිමේ යෝජිත කොටස ඉදිකිරිම මධ්‍යම වෙළඳපොළ ඉදිකිරිම මේ වැඩකොටස කිරිමේදි රුපියල් මිලියන 1910ක් එ සඳහා පමණක් වෙන් කරලා තියෙනවා.මේ ටිලියන තුනට අමතරව එකෙන් භාගයක් විතර වැය වෙන්නේ මේ සංවර්ධන යෝජනා සඳහා. මම හිතනවා අපි 2020 ඉදිරිපත් කරා 2021 ඉදිරිපත් කරා 2022 ඉදිරිපත් කරනවා. අපේ මැක්සි මන්ත්‍රීතුමා කිව්වා වගේ අලුත් ප්‍රභේද නැවිත් අපිට සාමාන්‍ය මට්ටමෙන් කරගෙන යන්න පුලුවන් වුනොත් එ ආර්ථික බාධාවන් ඇතිනොවුනොත් අපිට මේ අරමුණ සඳහා ගමන් කරන්න පුලුවන් කියලා මම විශ්වාස කරනවා.එ මොකද විශේෂයෙන්ම රජයේ යටතේ ඉන්න පළාත්පාලන ආයතනයක් වශයෙන් අපිට සංවර්ධනය සඳහා විශාල මුදලක් මේ රජයෙන් අපිට වෙන් කරලා දිලා තියෙනවා.අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු ප්‍රකාශකරා එකාධිපති ගමනක් යන බවට එහෙම වෙන්න බෑ නගරාධිපතිතුමා අපි හැමොම දන්නවා මුල්ම වරට තමයි රටේ පැරදුනු කොට්ඨාශවලට පවා මුදල් වෙන් කරලා තියෙන්නේ.එ අනුව මොරටුව තුල රුපියල් මිලියන 22440 ක වැඩ කොටසක් එ ගම් මට්ටමින් ග්‍රාමසේව වසම් මට්ටමෙන් සිදුවෙනවා.එහෙමනම් අපිට හැකියාව ලැබෙනවා අරමුණට යන්න මොකද සභාවක් වශයෙන් කරන්න එන වැඩ ටික කරන්න රජයෙන් අපිට මුදල් ලැබෙනවා.ගමකට ලක්ෂ 40ක් කොට්ඨාශයකට ලැබෙනවා.ඊළඟට ලක්ෂ 30 ග්‍රාමසේවා වසමකට ලැබෙනවා.ඊට අමතරව ගරු නගරාධිපතිතුමණි මේ අවස්ථාවේ මම කියන්න කැමතියි මේ මාර්ග සැලැස්ම මගේ ලග තියෙනවා.මේ මොරටුවේ මාර්ග 110 ක් කාපට් කරන්නට අපිට රජයෙන් මුදල් ලැබෙනවා.එහෙම නම් නගරාධිපතිතුමණි මාර්ග 110 කාපට් කරන්න හා මාර්ග 110 ප්‍රතිසංස්කරනය කරන්න අපි තමයි සල්ලි වෙන් කරන්න ඔනේ රජය දුන්නේ නැත්නම් එහෙමනම් මාර්ග 110 කාපට්වෙලා කුට්ටිගල් අතුරලා එහෙම නැත්නම් කොන්ක්‍රීට්කරලා එ සියලු දේවල් කරන්න වෙන්නේ මේ සභාවෙන් තමුන්නාන්සේලා අපි එකතුකරන වරිපනම් බදුවලින් තමයි මේ සංවර්ධන කටයුතු කරන්නේ අපිට දැන් එ සඳහා කිසිදු මුදලක් යටකරන්න අවශ්‍ය නෑ සභාවේ අරමුදල් මම හිතන්නේ මේ මාර්ග 110 කාපට් කරලා මොරටුවේ සංවරධන කටයුතු සිද්ධවෙන කොට අපි වෙන් කල යුතු මුදල ටිලියන 3 මේ බජට් එකෙන් වියදම් සඳහා කරන මුදල අපිට සහමුලින්ම ඉතිරිවෙනවා.එනිසා අපිට හැකියාව ලැබෙනවා නගරාධිපතිතුමණි මේ සංවර්ධන අරමුණු කරා ගමන් කරන්න.

ගරු නගරාධිපතිතුමනි, සෞභාග්‍යා දැක්මේ ධිවර ගම්මානය සඳහා එ ධිවරයන්ගේ ඉතිරිවෙන මාලු වලට විසඳුමක් වශයෙන් කරවල කරන වැඩ පිළිවෙලට අද අපි මාදංගහ වත්ත ප්‍රදේශයේ සහ අගුලාන ලුනාව කොරලවැල්ල මොරටුවැල්ල ඇතුලු ප්‍රදේශ අරමුණු කරගෙන එ ධිවරයන්ගේ තමන් රැස්කරන ධිවර සම්පත අපතේ නොයා කටයුතු කරන්නට පුලුවන් වෙන ආකාරයේ වැඩපිළිවෙලක් එ තමන්ගේ මත්සයන් ඉතිරිවෙන ප්‍රමාණය කරවල කරලා එ ව්‍යාපෘතිය සාර්ථක වුනොත් සමස්ථ මොරටු ජනතාවගේම කරවල අවශ්‍යතාවය සම්පුර්ණ කරන්න හැකියාව ලැබෙනවා.එකත් අතිගරු ගොඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ සෞභාග්‍යා දැක්ම ප්‍රතිපත්තියට අනුව ඉදිබැද්ද මොරටුමුල්ල විල්ලෝරවත්ත ප්‍රදේශය එකතු කරගෙන එ සඳහා වඩු ගම්මාන වැඩ පිළිවෙල මේවෙනකොට ක්‍රියාත්මකයි එ සඳහා මිලියන 10 ක මුදලක් අපිට ලැබෙනවා.එවගේම එ ධිවරයන්ගේ ධිවර ගම්මාන සඳහා මිලියන 10ක වැඩපිළිවෙලක් ලැබෙනවා. කවුරු හරි මතක් කරා සායන ඉතා අකර්මණ්‍ය තත්වයේ තියෙන්නේ කියලා.එවා දියුණු කිරීමේ වැඩපිළිවෙලක් අපි කරනවා.එවගේම තමයි අද බස්නාහිර පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හරහා සායන කිහිපයක 10 කට ආසන්න ප්‍රමාණයක් මේ වෙනකොට ඇස්තමේනතු සකස් කරමින් ඉන්නවා එවා සංවර්ධනය කරලා එ වැඩ පිළිවෙලක් කරන්න.එවත් අපිට සභාවක් වශයෙන් ලොකු රුකුලක්වෙනවා අපේ කටයුතු ටික කරගෙන යන්නට අපි දන්නවා ඉදිරියෙදි අනිවාර්යෙන්ම සොයිසා ක්‍රීඩාංගනය සඳහා විශාල මුදලක් අපිට ලැබෙන්න නියමිතයි.එ අනුව අපිට සොයිසා ක්‍රීඩාංගනයට සභාවක් වශයෙන් මුදල් වෙන් කරන්න අවශ්‍යවෙන් නෑ.මධයම රජයේ ප්‍රතිපාදන අනුව අපිට එ සංවර්ධන කටයුතුවලට ගමන්කරන්න පුලුවන්. පුස්ථකාල වශයෙන් ගත්තොත් ජනසෙත පුස්ථකාලය ටිරෝන් ප්‍රනාන්දු මැතිතුමාගෙන් පස්සේ නැවතවතාවක් ඔබතුමාගේ කාලේ අපේ පාලන කාලය තුල නැවත ක්‍රමවේදයකට සංවර්ධන කටයුතු මේ වන විට සිදුකරමින් යනවා. අපේ ගිනි නිවීමේ ඒකකය මොරටුවට ආඩම්බරයක් ඇති වෙනවා.විදුලි අධිකාරීතුමා කැපවීමෙන් කරනවා.ඒවගේ කැප කිරීමක් කරන නිලධාරීන් සෑහෙන ප්‍රමාණයක් ඉන්නවා. නම් වශයෙන් කියන්න කාලවේලාව නැහැ.ඒ අයටත් ස්තූතිය පුදකරනවා.ආගමික ස්ථාන වෙනුවෙන් මුදල් වෙන්කරලා තියනවා. ආගම් බේදයකින් තොරව ලබන වසරේදී සියලුම ආගමික ස්ථාන සංවර්ධනය කරන්න මුදල් වෙන්කරලා තියනවා. ඒ අනුව මම විශ්වාස කරනවා නගරාධිපතිතුමනි, මේ අයවැය සාර්ථකව මුහුණ දීලා අපේ අරමුණු ඉෂ්ඨ කරගන්නා හැකියාව ලැබෙනවා.අපි හැමදෙනාම එකතුවෙලා මධ්‍යම රජයෙත් සහයෝගය අරගෙන මුදල් වලින් නිසියාකරයෙන් මේ වැඩ කටයුතු කරනකොට අපේ සභා අරමුදලෙන් වැඩකොටසක් කරලා ඔබතුමාගේ කාලය තුල යම් දෙයක් මොරටුවට අපි කලා කියලා අපිට සැනසිල්ලේ ගෙදර යන්න පුලුවන්නම් ඒක තමයි මොරටුවට ජනතාවට කරන එකම දේ කියලා මම විශ්වාස කරනවා.අපිට මෙතන්ට ගමන්

කරන්න අවස්ථාවක් හා විශාල දායකත්වයක් ලබාදුන්න මොරටුවැල්ල දකුණ ජනතාවට, ගරු ජනාධිපතිතුමාට මගේ ගෞරවනීය ස්තූතිය පුදකරනවා. ඒවගේම අපත් සමග නිඹදවම එකතු වී මැතිවරණ ජයග්‍රහණය කරන්න ඉදිරිපත් වූ පලාත් සභා මන්ත්‍රී ගරු මොරිස් විජේරත්න මැතිතුමාටත් අපේ ගෞරවනීය ස්තූතිය පුදකරමින් සියලු දෙනාට සුභ අනාගතයක් පතමින් මේ අයවැයට මාගේ පක්ෂපාතීත්වය පුදකරමින් මම නිහඬ වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජේ.ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම කැමති නෑ සම්ප්‍රධායක විපක්ෂයක් හැටියට කටයුතු කරන්න බලාපොරොත්තු වෙන්නේ නෑ. අපේ යුතුකම වැරැද්දක් දැක්ක තැන වැරැද්ද කියල දෙන්නත් හරිදෙයක් දැක්කම ඒකට ප්‍රශංසා කරන්නත් මට ලැජ්ජාවකුත් නැහැ. බයකුත් නැහැ.මම ඒකට නිහතමානි වෙනවා.මම කියන්න කැමතියි සභා වාර්තාව ඉංග්‍රීසි පරිවර්තනයක් දෙන්න කියලා. මම කියන්න කැමතියි මේකෙ ඉංග්‍රීසි පරිවර්තනය සහ ඉංග්‍රීසි අකුරුවල විශාල දෝෂ තිබෙනවා. මේක මොරටුවේ ජනතාවට විතරක් බලන්න පුලුවන් ලියවිල්ලක් නෙවෙයි. මේක තානාපති කාර්යාල වලට යන්න පුළුවන්, විදේශ රැස්වීම් වලට යනකකෙට ටම්ක ඉදිරිපත් කරන්න අවස්ථාවක් හම්බවෙනවා. ඒවගේම මොරටුවේ පාරවල් නම් කරලා තියන නාම පුවරුවල ඉංග්‍රීසියෙන් දාලා තියන නම් වැරදියි.ඒක දන්න පුද්ගලයන් යොදවලා ඒ වැරදි හදන්න. ඒවගේම බජට් එකේ මම දැකපු දෙයක් තියනවා රංග ශාලාවල අපි ලක්ෂ සීයක් වෙන්කරලා තියනවා. එතන දැන් තියෙන්නේ කසල කළමනාකරණය ඒ රංග ශාලාව වෙන තැනක කරනවාද ඔබතුමා මට ඒ ගැන පැහැදිලි කිරීමක් කරන්න.ඒවගේම තානායමට ලැබිය යුතු විශාල වන්දියක් තිබුනා.ඒ ගැනත් දැනගන්න මම කැමතියි.වාර්තාවේ තිබුණා නගර සභාව සතු වාහන සම්බන්ධව ගොඩක් වාහන අක්‍රියව පවතිනවා.ඔබතුමාගේ අවධානය යන්ත්‍රික ඉංජිනේරු අංශයට යොමු කරලා මේ වාහන ඉක්මණින් අලුත්වැඩියා කලොත් අපේ නගර සභාවට ප්‍රයෝජනයක් ගන්න පුලුවන්.ප්‍රජාශාලා බොහෝ ප්‍රමාණයක් වහලා. ප්‍රජාශාලාවලට පරිගණක ලබාදීලා ගමේ ඉන්න ළමයින්ට ඒවා ප්‍රයෝජනයට ගත හැකි පරිද්දෙන් වැඩපිළිවෙලක් සකස් කරන්න පුලුවන්නම් ඒක ලොකු ප්‍රයෝජනයක් වෙනවා.විශේෂ ව්‍යාපෘති කරනකොට විපක්ෂයේ මන්ත්‍රීවරුන්වත් සම්බන්ධ කරගෙන ඔවුන්ගෙත් අදහස් අරගෙන වැඩ කරන්න කියලා ඉල්ලා සිටිනවා.මම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.මන්ත්‍රීවරුන්ට රුපියල් මිලියනය බැගින් ලබාදී ගම සංවර්ධනය කිරීමට ඔවුන්ව දායක කරගන්න මොරටුව මහා නගර සභාව තුල වයි ෆයි කලාපයක් ඇති කරන්න යන වැඩපිලිවෙල ඉතාමත්ම හොඳයි මම එයට ස්තූතිවන්ත වෙනවා.. එය ඉක්මණික් ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලනවා.කසල

කළමනාකරණය ඔබතුමා හොඳට කරගෙන යනවා. ඒගැන ඔබතුමාට ස්තූති වන්ත වෙනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි, නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා මෙතන නැතිවුනත් එතුමන්ලගේ නියෝජනය තියන නිසා මම එතුමන්ලාගෙන් පටන්ගන්නම්. එතුමන්ලා කියනවා ලබන පාර එතුමන්ලා ජයග්‍රහණය කරනවා කියලා. ඒක හොඳයි. අපි 2018 මේ බලය ලබාගත්තේ ආණ්ඩුව නැතුව. පලාත් පාලන ආයතනයක මූලික වගකීම කැලි කසල ඉවත් කිරීම. අපි ඒක හරියට කලා ඒක නිසා ජනතාව අපිව විශ්වාස කරලා අපිව ආයෙත් පත්කලා. අපි පක්ෂපාතිව වැඩ කරන්නේ නැහැ. අපිට ආශිර්වාදය ඉතාම ඉහලින් තිබුනා. දැං තියෙන දේශපාලන මතගැටුම් අතුව හෙට මැතිවරණයක් තිබුනත් ආයෙත් අපිට මිනිස්සු හැරෙන තත්ත්වයට අපි වැඩ කටයුතු කරලා ඉවරයි. රවිනාත් ගුණසේකර මැතිතුමනි,ඔබතුමා මට ඊයේ පෙරේදා හමුවුන වේලාවේදී මට පියෙක් වගේ මට කියපු කාරණයක් තියෙනවා. ඒක මම මොකක්ද කියලා මම කියන්නේ නැහැ ඒක මේ සභාවේ සිට ක්‍රියාත්මක වෙයි. එය ක්‍රියාත්මක වෙන එක ඔබට දැනෙයි. දැක ගන්න හැකි වෙයි.එය කාට හෝ දැනිලා කිව්වට පස්සේ මම කියන්නම් රවිනාත් ජේ ගුණසේකර මැතිතුමා මට මෙන්න මෙහෙම අවවාදයක් දුන්න කියලා. එදාට එතුමාට ගෞරවයක් වෙන්න මම එය කියන්නම්.සභාවේ ටැක්ටර් රථ 28 ක් තියනවා. දැනට 25 ක් ක්‍රියාත්මකයි.දෙකක් හදනවා.එකක් හදන්න බැහැ. ලංකාවට ඒ අවශ්‍ය ද්‍රව්‍ය ඇවිල්ලා නැහැ. අත් ටැක්ටර් 7ක් තියනවා. 3 ක් කැඩිලා එකක් හදන්න පුලුවන්. ටැක්ටර් 04 ක් ක්‍රියාත්මකයි. එකක් දකුණු පැත්තේ දුවනවා. අනෙක් එක ලුනාවේ පැත්තේ දුවනවා.තව එකක් විල්ලෝරාවත්තේ සහ ඉදිබැද්දේ දුවනවා. අත් ටැක්ටර් 04 ක් දැනටත් ක්‍රියාත්මකයි.ජේ.සී.බී කැල්ලක අඩුවක් තිබුනා දැන් ඔක්කොම හදලා ඉවරයි. ඩම්පර් රථයත් දලා ඉවරයි. ලිහිණි මන්ත්‍රීතුමියගෙන් මම බලාපොරොත්තු වෙනවා මීට වැඩිය ලොකු දෙයක්. ඔබතුමියට මූල්‍ය කටයුතු පිළිබඳව ලොකු අවබෝධයක් තියනවා.නීතිය පිළිබඳව ලොකු දැනුමක් තියනවා කියලා මම විශ්වාස කරනවා.අයවැය කියන්නේ ප්‍රාතිහාර්යයක් නෙවෙයි.මොරටුව මහා නගර සභාවේ කසල මුදල් බවට පත්කරන්න උත්සාහ ගත්තා වගේම නියෝජ්‍ය නගරාධිපතිතුමා කිව්වා වගේ අපට මොකක් හෝ දෙයක් කරලා හෙට ගෙදර හිටියොත් ඇතැයි කියන තැන අපි ඉන්නේ.ඒක නිසා මම ඔය ගොඩනැගිල්ල හදන්න යන්නේ ලක්ෂ තුන්හාරදාහක් මේ සභාවට ඉතුරු වෙන්න.

ගරු මහ නගර සභ මන්ත්‍රීවරුනි, බිලියන දෙක තුල ස්ථීර තැන්පතුවල තියාගෙන ඉන්න පලාත් පාලන ආයතනවලට වඩා සමාජ සුභ සිද්ධිය වෙනුවෙන් කරන වැඩ

එමටයි. අනෙක් නගර සභාවල් කරනවට වඩා විශාල ප්‍රමාණයක් අපි කරලා තියනවා ජනතා සුභ සිද්ධිය වෙනුවන්.කොළඹ මහා නගර සභාවට ගිහිල්ලා බලන්න ලක්ෂ දහදාහක් පහලොස්දාහක් ස්ථීර තැන්පතු තියනවා. එක මිනී පෙට්ටියක් ගන්නවත් සල්ලා දීලා නැහැ.අයවැය සෑදීමේදී වැය ශීර්ෂය මාරු කිරීම සඳහා නගරාධිපතිවරයාට පූර්ණ බලයක් දීලා තියෙන්නේ මේවා අණ්ඩුවේ වග කියන්නේ නැති මුදලක් නිසා මේ මුදල බදු ගෙවන ජනතාවගෙන් එකතු කරගෙන බදු ගෙවන ජනතාවට වැඩ කිරීමට අයවැයෙන් මුදල් නිත්‍ය කරන්න ඕන නෑ.එහෙම කරොත් එතනින් තවත් දේකට ගන්න බැහැ.විගණනය කියන්නේ ගයිඩ් ලයින් එකක් විතරයි.ඔබ මේකේ යන්න කියන එක විතරයි. නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා පත්තරේට කියනවා විගණනයෙන් මිලියන එකසිය අනුහතරක් ගණුන් වලින් තියනවා අයකරගැනීමක් කරලා නෑ කියලා.හැබැයි එතන සර්චාර්ජ් එකකට ගිහිල්ලා නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා ලක්ෂ හතරකුත් ගානක් දෙන්න තියනවා.විගණනය හරිනම් ඒ මාධ්‍ය සාකච්ජාවකට පෙර මම මේක ගෙවන්න තියනවා. ඒකෙ වරදක් තියනවා කියලා කියන්න ඕනා.නැත්නම් ඒක ගෙවලා ඉවර වෙලා මාධ්‍ය සාකච්ජාවක් තියන්න ඕනා.හරියටම අනුර මන්ත්‍රීතුමා කිව්වා කන්න ඕන වුනාම කඹරගොයා තලගොයා කරගන්න සංකල්පය මත තමයි ඒ කටයුතු කෙරුනෙ.නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා කියනවා මෙච්චර වැය ශීර්ෂවල තියෙන්නේ කොහොමද 1800 ක වැඩ කරන්නේ කියලා.එතුමාට ඒක නොතේරෙනවා ඇති මොකද එක තැනකට කොටුවෙලා සාකච්ජා කරලා සාකච්ජාව සභාවේ කියනවා විතරයි.එතුමා දන්නේ නැහැ.අපි 1800 ක පාරවල් හැදුවා වගේම ගොඩනැගිලි විශාල ප්‍රමාණයකට රජයේ මුදල් අපිට එවල ඉවරයි. එහාපැත්තේ ලක්ෂ හැත්තෑපහක ගොඩනැගිල්ලක් හදලා තියනවා.ඒවගේ පෙර පාසල්, ප්‍රජා ශාලාවල් හදලා තියනවා.පාරවල් තිස්ගානක් කාපට් කරන්න තව දවස් දෙකකින් අපි පටන් ගන්නවා.මේ වෙනකොට මොරටුවැල්ලේ සිට මෝදර පීරිස් පාර දක්වා සම්පූර්ණයෙන්ම මුළු කාණු පද්ධතියේම සියලුම වතුර ගගට බස්සලා ගගින් මුහුදට එන වැඩ සටහනට ඩිසයින් කරලා ඉවරයි.නොබෝ දිනකින් ලක්ෂ 1750 ක උමන් මාර්ගයේ වැඩ පටන් ගන්නවා.මේවා ආදායමක් විදියට අපට එකතු වෙනවා.මේ වගේ වැඩ රාශියක් අපි කරනවා. අපිට නිකන් ඉන්න බෑ. අපිට නිකන් ඉන්න දන්නේ නෑ.අපිට නිකන් ඉන්න පුරුද්දක් නෑ.ගරු ආණ්ඩුකාරතුමා ආව ගමන් ලක්ෂ හතලිස් පහක මැෂින් තුනක් ගත්තා.තව කුඩු කරන යන්ත්‍ර දෙකක් ගත්තා ඔක්කොම ලක්ෂ හැටදාහයි. ඒවෙලාවෙම ආණ්ඩුකාරතුමාට කතා කරලා අපි ඒ මැෂින් ගත්තා.මේ විදියට වැඩ කරන්න මටනම් කම්මැලිකමක් නැහැ.

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි, එක අතකින් මම හරි වාසනාවන්තයෙක් කොඩිඩ් එක්ක වැඩකරපු පලාත් පාලන ප්‍රධානියෙක් ඉන්නවානම් ඒ මම වෙන්න ඇති.ඔබ

දන්නවා.එළවළු ටික ගෙනාවම එළවළු දෙන වැඩ ,කෑම පාර්සල් දෙන වැඩේ.මිනිස්සු එක්කම ගැවසි ගැවසි ඉදලත් මේ වෙනකොට පී සී ආර් පරීක්ෂක දෙපාරකුත් ඇන්ටිජන් පරීක්ෂණ නම පාරකුත් කරලා මම ඉන්නවා කොවිඩ් හදාගන්නෙ නැතුව.ඒක කවුරු මොනවා කිව්වත් මම විශ්වාස කරන්නේ මනුෂ්‍යයාට පිහිටවෙන මනුෂ්‍යාව ධර්මයෙන් බේරනවා.මම රිමාන්ඩ් එකෙත් හිටියා ඒකෙනුත් මම කොවිඩ් හදාගන්නේ නැතිව බේරිලා ගෙදර ආවා.අපි බොහොම සද්භාවයෙන් වැඩ කරලා තියනවා. 2022 ට නාගරික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලක්ෂ දෙදහස් ගානක් වැය කරලා වාහන අංගනය ලග තට්ටු තුනකින් සමන්විත උඩ තට්ටුවේ ප්‍රේක්ෂකාගාරයත් එක්ක ගොඩනැඟිල්ලක් ඉදිකිරීමට අවශ්‍ය කටයුතු කරලා තියනවා.විශේෂයෙන්ම බස්නැවතුම් පොල ගැන කථා කලා බස්නැවතුම්පොල ගැන අවසන් සාකච්ජාවට එළඹෙමින් සිටිනවා.මුහුදු බඩ මාර්ගය පාදුරේට යනවනම් බස් ස්ටෑන්ඩ් එක ඔතනින් අයින් වෙනවා.ස්ටේෂන් එකත් එක්ක එකතු වෙච්ච දැවැන්ත වැඩසටහනක් තියන නිසා.නිකරුනේ සල්ලි වියදම් කරනවාට වඩා අවසන් සාකච්ජාවෙන් පස්සේ අපි කල්පනාකරලා නිසි ලෙස නඩත්තු කටයුතු කරලා නවීකරණය කිරීමක් කරනවා.

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි, මොරටුව මහා නගර සභාව මොන විදියකටවත් යම් යම් ණය ගත්තා කියලා. ඒ ණය මොරටුව මහා නගර සභාවේ බදු ගෙවන ජනතාවට බරක් නොවන විදියට තමයි අපි මේ ව්‍යාපෘති හදන්නේ. අපේ පුනරාවර්තන ආදායම කියන එක කුමන හෝ වේලාවක ලබාගැනීමට යටත්වෙන්නාවූ මුදලට විතරයි අපි සංවර්ධන ව්‍යාපෘති ඉදිරිපත් කරලා තියෙන්නේ ඔබට පුදුම ඇති 68% එන්නේ නමුත් සම්පූර්ණ සංවර්ධන කටයුතුවලට වියදම් දරලා ඉතුරු වෙලා තියන මුදලට හදාගෙන තියනවා දෙසැම්බර් වලින් ඉස්සෙල්ලා ඒක ඇස්තමේන්තු කරලා විවිධ ණය ලේඛණයට අරගෙන ලබන අවුරුද්දේ වැඩ කරන්න.සමහර විට මම හෙට මියැදෙන්න පුලුවන් නැත්නම් කවුරු හෝ මියැදිලා මට පාර්ලිමේන්තුවට යන්නත් පුලුවන්,කවුරු හරි ඉල්ලා අස්වෙලා යන්න පුලුවන්.ඒ ගියාම මෙතනට ණයක් දෙන්නේ නෑ ඒකෙන්.එහෙම ණයක් දෙන්න පුලුවන් කමක් නෑ.සභාවක ණය වෙලා වැඩකරන්න බෑ.මේ සභාවේ තියනවා පණතක් ඒ පණතේ තියනවා ඔබගේ බජට් එකේ වගේ දහගුණයක් ණය ගන්න පුලුවන් කියලා.ලිහිණි මන්ත්‍රීතුමිය මේ පිළිබඳව දන්නවා මට ඉඩමක් තියනවානම් ගෙයක් හදන්න බැරිනම් අනුන්ගේ ඉඩම් දිහා බලලා හූල්ල න්නේ නැතුව මම කරන්නේ ඉඩම බැංකුවේ තියලා ගෙයක් හදාගන්නවා.මොරටුව මහා නගර සභාව කියන්නේ මේ අපේ ගේ.මේ ගෙදර ජීවත් වන අයව ජීවත් කරවීම සඳහා අවශ්‍ය වන කාර්යයන් අපි කරන්න ඕනා.ඒක තමයි පාලකයෙක් කියන්නේ.ඒ කටයුතු නොකර හූල්ල හූල්ල ඉන්න අපිට බෑ. විශේෂයෙන් ම ලිහිණි මන්ත්‍රීතුමියට මොනවාහරි දැනගන්න තියනවානම් මට

කියන්න තව දුරටත් මම කාලය දෙන්නම්. නාගරික සංවර්ධන අධිකාරියෙන් ලක්ෂ දෙදහස් පන්සියයක් වියදම් කරලා වාහන අංගනයත් එක්ක ප්‍රේක්ෂකාගාරයත් අපට හදලා දෙනවා.දැනටමත් ඩිසයින් කරලා ඉවරයි. කසල දාන්න ස්ථීර ස්ථානයක් හොයල දුන්න නිසා රවිනාත් ගුණසේකර මන්ත්‍රීතුමාටත් ප්‍රශංසා කරනවා.විශේෂයෙන්ම මම හිතනවා ලොකු වේලාවක් විවාද කලා නෙවෙයි.අදහස් දැක්වුවා.ඒ අදහස් දක්වපු හැම එකක්ම වැරදි නෙවෙයි අඩුපාඩු එක්ක ඉදිරිපත් කරපු ඒවා වෙන්න පුලුවන් නමුත් ඒ හැමතැනින් යම් දෙයක් අපට ගන්න තියන හැම දෙයක්ම අපි අරගෙන කටයුතු කරනවා.

2022 ජනවාරි මාසයේ පලමුවනදා සිට ක්‍රියාත්මක කරන අයවැය ලේඛණයට වැඩිම ජන්ද ප්‍රමාණයකින් ජයග්‍රහණය කරන මගේ ජීවිතයේ පලමුවන දවස අද දිනය වෙනවා කියලා විශ්වාසය තබමින් 2022 කෙටුම්පත් අයවැය ලේඛණයට ජන්ද විමසුම සිදු කරනවා.

ඒ අනුව 2022 වර්ෂය සඳහා කෙටුම්පත් කරන ලද වැඩසටහන් අයවැය ලේඛණය අනුමත කිරීමට පක්ෂව පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ජන්දය ප්‍රකාශ කරන ලදි.

1. නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - එම්.නිලකසිරි ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසද හර්ෂණ අබේකෝන් මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - යු.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ඩබ්.රන්දු නිරෝෂන මහතා

11. මහා නගර සභා මන්ත්‍රී මහත්මිය - එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු
12. මහා නගර සභා මන්ත්‍රී - පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී මහත්මිය - එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම
16. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - යූ.ලලිත් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එස්.ඛේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - එෆ්.බී.නිලංක සිල්වා මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - එම්.කේ.පී.සුසන්ත පෙරේරා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී මහතා - ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න
22. මහා නගර සභා මන්ත්‍රී - එම්.කුමාර රාජරත්න මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා
25. මහා නගර සභා මන්ත්‍රී මහත්මිය - එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු
26. මහා නගර සභා මන්ත්‍රී - එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා
27. මහා නගර සභා මන්ත්‍රී - ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය
28. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා
29. මහා නගර සභා මන්ත්‍රී - එම්.සුනිල් නන්දසිරි මහතා

2022 වර්ෂය සඳහා කෙටුම්පත් කරන ලද වැඩසටහන් අයවැය ලේඛණය අනුමත කිරීමට විරුද්ධව පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ජන්දය ප්‍රකාශ කරන ලදි.

1. මහා නගර සභා මනත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්.නිසර රසාංජන මැන්දිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
5. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
6. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය
7. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

2022 වර්ෂය සඳහා කෙටුම්පත් කරන ලද වැඩසටහන් අයවැය ලේඛණය අනුමත කිරීමට පක්ෂව හෝ විරුද්ධව පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ජන්දය ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටියහ.

1. මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජේ ගුණසේකර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනි මහත්මිය

5. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය

ඒ අනුව 2022 වර්ෂය සඳහා කෙටුම්පත් කරන ලද වැඩසටහන් අයවැය ලේඛණය වැඩි ජන්දයෙන් සභා සම්මත විය.

(මෙම අවස්ථාවේදී පහත නම් සඳහන් මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ.

1. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ආර්.ක්‍රිශනි ප්‍රනාන්දු මහත්මිය)

සභාවේ වැඩකටයුතු මෙතනින් නිමාවිය.

අ.කළේ- ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති,
මොරටුව මහ නගර සභාව,
මොරටුව.

2021.11.26 දින
මොරටුව මහ නගර සභා කාර්යාලයේදීය.